BOI
SRI LANKA

# වාර්ෂික වාර්තාව
# 2017

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

# පටුන


| | |
|---|---|
| සභාපතිතුමාගේ පණිවුඩය | 1 |
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | 2 |
| 2017 අධ්‍යක්ෂ මණ්ඩලය | 3 |
| දැක්ම හා මෙහෙවර | 4 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම, අරමුණු හා කාර්යයන් | 5 |
| 40 වසරක විශිෂ්ඨත්වය - 2017 වසරේ විශේෂ අවස්ථා | 6 |
| ශ්‍රී ලංකාවේ භූ දර්ශනය වෙනස් කිරිමේ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියා කිරීම | 7 |
| ආයෝජන මණ්ඩලය පිළිබඳව සංෂිප්තව | 8 |
| 2017 නව ආරම්භයන් | 10 |
| 40 වන සංවත්සරය සැමරීම | 13 |
| වැදගත් සිදුවීම් | 14 |
| සමාලෝචනය | 15 |
| 2017 ලෝක ආයෝජන ප්‍රවණතාව | 15 |
| 2017 ශ්‍රී ලංකාවේ ආයෝජන දැක්ම | 17 |
| දෙපාර්තමේන්තුමය කාර්යසාධනය | 25 |
| 1. ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව | 25 |
| 2. පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව | 28 |
| 3. ආයෝජක සේවා දෙපාර්තමේන්තුව | 29 |
| 4. ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව | 30 |
| 5. ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව | 32 |
| 6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව | 33 |
| 7. නීති දෙපාර්තමේන්තුව | 34 |
| 8. තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව | 35 |
| 9. කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව | 36 |
| 10. පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව | 37 |

11. ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව 38

12. කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව 39

13. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව 40

14. මාධ්‍ය හා ප්‍රචාරක දෙපාර්තමේන්තුව 41

15. පරිපාලන දෙපාර්තමේන්තුව 42

16. මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව 43

17. ආරක්ෂක හා ගිනිනිවීම් දෙපාර්තමේන්තුව 44

2017 මූල්‍ය සමාලෝචනය 45

2017 විගණන වාර්තාව 79

2017.12.31 දිනට ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 103

ආයෝජන මණ්ඩල කාර්යාල නාමාවලිය 104

# සභාපතිතුමාගේ පණිවුඩය



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යාපෘති චක්‍රයේ විවිධ පියවරයන්හිදී ව්‍යවසායන් 2,500 කට වැඩි ප්‍රමාණයක් සඳහා පහසුකම් සලසමින්, ජාතික ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය ලෙස, 2017 වසරේදී එහි තිරසාර වර්ධනයේ 40 වන වසරට පිය නැගනු ලැබීය. 2017 අවසානය වන විට ආයෝජන ව්‍යාපෘති හරහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇ.ඩො. බිලියන 15 කට වැඩි සමුච්චිත සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගෙන ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සෘජු විදේශ ආයෝජනය ළඟාකර ගැනීමේදී එහි උපායමාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතර 2017 සිදු කරනු ලැබූ ප්‍රධාන කාර්යය වන්නේ සෘජු විදේශ ආයෝජන (FDI) ඉහල නංවාලීම සඳහා රටේ ජාතික සංවර්ධන සැලැස්මට සමගාමීව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආර්ථික වර්ධනයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙන ලෙස විනිවිදභාවයෙන් හා වගකීමෙන් යුතුව ආයෝජන ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නිවැරදි උපායමාර්ග අනුගමනය කිරිමයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ගනු ලැබූ විවිධ ආරම්භක පියවර වලට අමතරව, රජය මගින් ස්ථාපනය කරන ලද ඉහල බලතල සහිත කමිටු සමගින් ආරම්භ කිරීමට බාධා වු හා ප්‍රමාද වූ ව්‍යාපෘති සඳහා වු අභියෝග හා ගැටළු පහසුවෙන් විසඳීමට මණ්ඩලයට හැකි විය. ඉලක්කගත අංශ හා රටවල් වල ආයෝජන ප්‍රවර්ධනය සඳහා නැවත යොමුවීමේ නව උපායමාර්ග හඳුනා ගැනීමට අමතරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් දැනට පවතින සමාගම් ගෝලීය අගයදාමයන් සමඟ සම්බන්ධ කිරීම සඳහා විශාල වශයෙන් දිරිමත් කිරීම හා පහසුකම් සැලසීම සිදු කෙරේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් රජයේ ප්‍රතිපත්තිමය මූලාරම්භයන්ට සමගාමීව නව ආර්ථික කලාප වැඩිදියුණු කිරිම සඳහා ඉඩම් හඳුනාගැනීමේ කාර්යයේ ද නිරතව සිටී.

මෙවන් ප්‍රයත්නයන් හමුවේ මෙම වසරේදී මෙතෙක් වාර්තාගත වූ ඉහලම අගය වූ ඇ.ඩො. බිලියන 1.7 කට වැඩි සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයක් ළඟා කර ගැනීමට හැකි විය. එය 2016 වසරේ ළඟාකර ගත් අගය වූ ඇ.ඩො. මිලියන 801 හා සැසඳීමේදී දෙගුණයකට ද වඩා වැඩිවීමකි.

අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අග්‍රාමාත්‍යවරයාගේ, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ගරු අමාත්‍යවරයා හා ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ උපදෙස් යටතේ හා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලයේ හා කාර්ය මණ්ඩලයේ සහය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නිවැරදි දිශානතියකට යොමු කිරීමට හැකිවීම පිළිබඳව මම සතුටුවෙමි.

රජයේ ආයෝජන කෙරෙහි යොමු වූ ප්‍රතිපත්තිය හා අපනයන පාදක වර්ධනය ක්‍රියාත්මක කිරීමෙහිලා දැක්වූ කැපවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ප්‍රශංසාව පිරිනමමි.

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය



ජාතික ආර්ථිකයට දායකත්වය ලබා දෙමින් සිය 40 වන වසරට පිය නගන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ඍජු විදේශ ආයෝජනයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් හරහා ශක්තිමත් ආර්ථික වර්ධනයක් ඇති කිරීම, රැකියා උත්පාදනය හා අපනයන වැඩි දියුණු කිරීම ඇතුළු රජයේ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී මූලික කාර්යභාරයේ අඛණ්ඩව නියලී සිටී.

2017 වසර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට වැඩිම ඍජු විදේශ ආයෝජන ප්‍රමාණයක් ළඟා කර දුන් වැදගත් වසරක් විය. මෙමඟින් රජයේ ප්‍රතිපත්ති කෙරෙහි ආයෝජන ප්‍රජාවගේ ඇති විශ්වාසනීයත්වය පිළිබිඹු කෙරේ.

ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අඩු කිරීම හා කාර්යක්ෂම ලෙස ආයෝජකයින්ගේ ගැටළු විසඳීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් 2017 වසරේදී ආරම්භක පියවර කිහිපයක්ම ගනු ලැබ ඇත. ව්‍යාපෘති ඇගයුම් කමිටුව මගින් ඒ හා සම්බන්ධව කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තු සමඟින් අනුමැතීන් ලබා දීමේදී ආයෝජකයින්ගේ අයදුම්පත් වහාම පරීක්ෂා කරනු ලබන අතර ආයෝජකයින් විසින් මුහුණපාන සියළු මෙහෙයුම් ගැටළු සඳහා ඉක්මණින් විසඳුම් ලබාදේ.

අයෝජන සඳහා පහසුකම් සලසන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජනය සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියාවලියේදී පහසුකම් සලසන අංශය ලෙස කටයුතු කරන තනි කවුළුවේ ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ කාර්යසාධන බලකාය හඳුන්වා දෙමින් සේවා සැපයුම වැඩි දියුණු කිරීම සඳහා මූලික ක්‍රියාමාර්ග ගෙන ඇති අතර එමගින් නිසියාකාරයෙන් යුත් පසුබිමක් පදනම් කරගත් ක්‍රියාකාරිත්වයක් හරහා ව්‍යාපෘති අනුමත කිරිමේ ක්‍රියාවලිය වේගවත් කිරිම සඳහා අදාල රේඛීය නියෝජිතායතන හා අවශ්‍ය සම්බන්ධීකරණය ලබාදේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් දැනට සිටින ආයෝජකයින්ට ඔවුන්ගේ ආයෝජන පුළුල් කිරීම, ප්‍රති ආයෝජනය කිරීම හා ඔවුන්ගේ ගැටළු තිබේ නම් ඒවා විසඳීම මගින් ව්‍යාපාර වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම අපනයන අරමුණු කර ගත් නිෂ්පාදන හා සේවා අංශ කෙරෙහි නව ආයෝජකයින් ආකර්ශනය කර ගැනීම සඳහා තානාපතිවරුන් ලෙස යොදා ගැනීම සඳහා සහයදීමට ප්‍රතිආයෝජන කාර්යසාධන කණ්ඩායමක් ස්ථාපනය කර ඇත.

අපගේ සේවකයින්, ප්‍රධාන පෙලේ විදේශීය හා දේශීය ආයෝජකයින් ආකර්ශනය කරගැනීමට හා ඔවුන් සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය නිපුණතාවයෙන් යුත් පිරිසක් බවට තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කර ඇත. ලෝක බැංකුව මගින් ක්‍රියාත්මක කරන ආයෝජන ප්‍රවර්ධන සහතිකකරණ වැඩසටහන හා හාවඩ් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරන ලද Problom Driven Iterative Adaptation වැඩසටහන ආයෝජන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ ආයෝජන ප්‍රවර්ධන හා පහසුකම් සැලසීමේ නිපුණතා ඉහල නැංවීම සඳහා උපකාරි විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනාගත කාර්යභාරය ඉටුකිරිම සඳහා ඉහලම සුදුසුකම් සහිත තරුණ උපාධිධාරීන් බඳවා ගෙන ඇති අතර කාර්ය මණ්ඩලයේ සන්නිවේදන නිපුණතා වැඩිදියුණු කිරීම සඳහා Toastmasters International – Colombo Toastmasters මගින් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබීය.

අනාගතය දෙස බලන කල ලොව ප්‍රමුඛ ආර්ථික තත්වය ළඟාකර ගැනිමෙහිලා අත්‍යවශ්‍ය වන උසස් තාක්ෂණය හා අගය නිර්මාණය කිරීම් ආකර්ශනය කරගැනීමට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අදිටන් කර ගෙන ඇත. තිරසාර පරිසරය ඇතුළු අපගේ මූලික අගයන් ආරක්ෂා කර ගනිමින් මෙය සිදු කළ යුතුය.

2017 වසරේදී සුවිශේෂී කාර්යසාධනයක් ලබා ගැනීම සඳහා අප මෙහෙය වූ සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලයට ඔවුන්ගේ සුවිශේෂී නායකත්වය වෙනුවෙන් ස්තුතිවන්ත වන අතර පසුගිය වසරේදී ආයෝජන මණ්ඩලයේ කැපී පෙනෙන වර්ධනයට දායකත්වය ලබා දෙනු ලැබූ එහි කාර්ය මණ්ඩලයට මාගේ විශේෂ ප්‍රණාමය පිරි නමමි.

අයෝජකයින් විසින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය, අපට ලබා දෙන සහය වෙනුවෙන් විශේෂ ස්තුතිය පිරිනමන අතර ඉදිරියේදී අපගේ නොමසුරු සහය ඔවුන්ට ලබාදීමට අදිටන් කරගෙන සිටින්නෙමු.

# 2017 අධ්‍යක්ෂ මණ්ඩලය



දුමින්ද රත්නායක මහතා
- සභාපති



සාගර ගුණවර්ධන මහතා
- සාමාජික



අජිත් ගුණවර්ධන මහතා
- සාමාජික



හේමන්ත වික්‍රමසිංහ මහතා
- සාමාජික



ඉංජිනේරු මංගල පී.බී. යාපා මහතා
- සාමාජික

# දැක්ම

"ආසියාවේ තිරසාර ආයෝජන සඳහා වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත් කිරීම"

# මෙහෙවර

" ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රඳවා ගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇති කිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුලින් දැනුම හා නිපුණතා වැඩි දියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස ක්‍රියා කරනු ලැබේ"

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සැකැස්ම

ආයෝජන ප්‍රවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම සඳහා වන ප්‍රධාන ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) 1978 වසරේදී මහ කොළඹ ආර්ථික කොමිසම පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ස්ථාපනය කරනු ලැබීය. මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) අධිකාරී බලය අපනයන සැකසුම් කලාපවල සීමාවන් නියම කරන ලද විශේෂ ප්‍රදේශවලට සීමාවිය. මූලික සංවර්ධන ආකෘතිය වූයේ විශේෂ සහන හා වෙනත් පහසුකම් සපයනු ලැබූ විශේෂ ප්‍රදේශ අපනයන ප්‍රවර්ධන කලාප ලෙස සීමාවන් නියම කිරීම වේ. මෙම කලාප මුලින්ම කටුනායක හා බියගම ප්‍රදේශවල ස්ථාපනය කරනු ලැබීය. මහ කොළඹ ආර්ථික කොමිසම (GCEC) 1992 දී මුළු රටම ආවරණය වන පරිදි එහි විෂය පථය පුළුල් කරමින් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනතක් මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ලෙස වෙනස් කරණු කරනු ලැබීය. එතැන් පටන් ආයෝජන මණ්ඩලය කාර්මික අපනයන ක්ෂේත්‍රයේ විදේශීය හා දේශීය ආයෝජන ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම සඳහා මූලික වශයෙන් වගකිව යුතු ආයතනයේ සිට සේවා හා යටිතල පහසුකම් අංශය කරා ද ආයෝජන ප්‍රවර්ධනය, සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීම ඇතුලත් එහි වර්තමාන කාර්යභාරය දක්වා ක්‍රමයෙන් විකාශය විය.

වර්තමානයේ, ශ්‍රී ලංකාවේ පළාත් 04 ක් ආවරණය වන අපනයන සැකසුම් කලාප 12 ක් ආයෝජන මණ්ඩලය සතුව ක්‍රියාත්මක වේ.

## අරමුණු

ආර්ථික සංවර්ධනය සිදුකිරීම හා අභිවර්ධනය කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම හා ශක්තිමත් කිරීම, දේශීය ආයෝජන මෙන්ම විදේශ ඍජු ආයෝජන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභව විවිධාංගීකරණය කිරීම හා අපනයනය ඉපයීම් වැඩිදියුණු කිරීම, රටතුල කාර්මික හා ව්‍යාපාරික පරිසරයක් ඇතිකිරීම හා වැඩිදියුණුකිරීම දිරිමත් කිරීම හා ඒ සඳහා සහය දීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධානම අරමුණු වශයෙන් හැඳින්විය හැකි වේ.

## කාර්යභාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ සඳහා ආයෝජන ඉලක්ක සැලසුම් කිරීම, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ ජාතික වර්ධන ඉලක්ක ලඟාකර කරගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ඍජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම අපගේ කාර්යභාරයයි.

ශ්‍රී ලංකාවේ ඉහල අගයක් එක්කල/උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහල අගයක් එක්කල ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් යුත් ආයෝජකයෙකු සමඟ සම්බන්ධතා පවත්වන පළමු ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශන ලබාදෙන අතර වෙනත් නියෝජිතායතනවල අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය වන අවස්ථාවලදී ඒ හා සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.

මෙම ව්‍යාපෘතිවල සේවය කරන විදේශීය පුද්ගලයන්ට වීසා නිකුත් කිරීමට ආගමන බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අදාල අංශ වෙත ඉදිරිපත් කරන අයදුම්පත් තක්සේරු කිරීම ද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් සිදු කරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ආනයන/අපනයන නිෂ්කාෂණ ලබා ගැනීම, ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය සඳහා ද, නිමි භාණ්ඩ අපනයනය සඳහා ද රේගු නිෂ්කාෂණ ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම මගින් ව්‍යාපෘති ආරම්භ කිරීමේ සිට ක්‍රියාත්මක කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයන්ට සහාය ලබාදේ.

අවම කාලයක් තුල ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.

BOI
SRI LANKA

# 40 වසරක විශිෂ්ඨත්වය

# 2017 වසරේ විශේෂ අවස්ථා

සමාගම් 2,500 කට වැඩි ගණනක් ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ.
800 (16 වගන්තිය) - 1700 (17 වගන්තිය)

ආර්ථික සංවර්ධනයට ඇ.ඩො.බිලියන 15කට වැඩි සමුච්චිත සෘජු විදේශ ආයෝජන දායකත්වයක්

මෙතෙක් වාර්තාවූ විශාලම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වූ ඇ.ඩො.බිලියන 1.7 2017 වසරේදී

ජාතික අපනයනයෙන් 70% හා කාර්මික අපනයනයෙන් 85% සඳහා දායකවීම

සෘජු රැකියා අවස්ථා 500,000 ක්

අපනයන සැකසුම් කලාප/කාර්මික උද්‍යාන 12 ක් පාලනය කරන අතර යෝජිත නව කලාප 3 ක් සැලසුම් කෙරේ.

ආයෝජන සඳහා පහසුකම් සැලසීම ශක්තිමත් කෙරිණ.

# ශ්‍රී ලංකාවේ භූ දර්ශනය වෙනස්කිරීමේ උත්ප්‍රේරකයක් ලෙස ක්‍රියාකිරීම


කොළඹ අහස් ඉම වෙනස් කිරීම


තරුණ අපේක්ෂාවන් වෙනස් කිරීම


ආයෝජක දැක්ම වෙනස් කිරීම


නවීන තාක්ෂණයට වෙනස් වීම


ශ්‍රී ලංකාවේ සිතියම වෙනස් කිරීම

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පිළිබඳව සංෂිප්තව

## සෘජු විදේශ ආයෝජන (1978 - 2017)

සමුච්ත සෘජු විදේශ ආයෝජන (FDI) (1978 සිට 2017) : ඇ.ඩො.මිලි. 15,015




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

## ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන ලද ප්‍රමුඛ රටවල් 10 (2008 - 2017)




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

## අංශ වශයෙන් සෘජු විදේශ ආයෝජන (2008 - 2017)




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

සෘජු විදේශ ආයෝජන දල ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස (2008 - 2017)




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව*

ජාතික අපනයනය සඳහා දායකත්වය (2008 - 2017)




*මූලාශ්‍රය : කළමනාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

ජාතික රැකියා උත්පාදනය සඳහා දායකත්වය (2008 - 2017)

ආයෝජන මණ්ඩල ව්‍යවසායන් : මුළු ශ්‍රම බලකාය සඳහා 6%ක දායකත්වයක්




*මූලාශ්‍රය : කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

# 2017 නව ආරම්භයන්

**ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම තුලින් ආයෝජන සඳහා පහසුකම් සැලසීම ශක්තිමත් කිරීම.**

පහත දැක්වෙන කමිටු ස්ථාපනය කිරීම මගින් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අඩු කිරීම හා ආයෝජකයින්ගේ ගැටළු කාර්යක්ෂම ලෙස විසඳීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ආරම්භයන් කීපයක්ම ගෙන ඇත.

- **ව්‍යාපෘති ඇගයුම් කමිටුව (PSC)**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ලැබෙන සියළු ව්‍යාපෘති ඇගයීමට හා දැනට පවත්නා හා විභවතාවයක් ඇති ආයෝජකයින් සඳහා ඇති ක්‍රියාත්මක කිරීමේ ගැටළු විසඳීම සඳහා ආයෝජක පහසුකම් සැලසීමේ ක්‍රියාවලිය ක්‍රමවත්ව බාධාවකින් තොරව සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සභාපතිත්වයෙන් හා අදාල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත ව්‍යාපෘති ඇගයුම් කමිටුව සතියකට වරක් රැස්වේ.

- **තනි කවුළුවේ ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ කාර්යසාධන බලකාය (SWIFT)**

ආයෝජන සඳහා පහසුකම් සලසන ආයතනය වශයෙන් ආයෝජන මණ්ඩලය විසින් කාර්යයන් පදනම් කරගත් ප්‍රායෝගික වේදිකාවක් හරහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා තනි කවුළුවේ ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ කාර්යසාධන බලකාය (SWIFT) මගින් අදාල රේඛීය ආයතන වලට අවශ්‍ය සම්බන්ධීකරණය සපයනු ලැබේ. SWIFT මගින් අනුකූලතාවයන් සම්බන්ධයෙන් ආයෝජකයින්ගේ දැනුවත්භාවය වැඩි කරන අතර අනුමත කිරීමේ ක්‍රියාවලිය පුරාම ආයෝජකයින් සඳහා මඟ පෙන්වනු ඇත.

මෙමඟින් නියාමන ක්‍රමවේදයේ තොරතුරුවල විනිවිදභාවය වැඩි දියුණු කර ඇති අතර රේඛීය ආයතනවල ක්‍රියාවලිය සරල කර ඇත. එසේම වඩාත් වැදගත් රේඛීය ආයතන විසි හතරක් (24) අදියර ප්‍රවේශය අනුගමනය කර එක් වේදිකාවක් යටතේ සම්බන්ධ කරනු ඇත.

- **ඉඩම් වෙන්කිරීමේ කමිටුව**

ආයෝජන මණ්ඩලයේ ඉඩම් අවශ්‍ය කරන ව්‍යාපෘති යෝජනා තාක්ෂණික හා මූල්‍යමය නිර්ණායක වලට අනුකූලව ඇගයීම සඳහා ඉඩම් වෙන් කිරීමේ කමිටුව ස්ථාපනය කර ඇත.

- **ප්‍රතිආයෝජන කාර්යසාධන කණ්ඩායම**

දැනට සිටින ආයෝජකයින්ට නැවත ආයෝජනය කිරීම හා ඔවුන්ගේ ව්‍යාපෘති පුළුල් කිරීම හෝ උත්ශ්‍රේණිගත කිරීම සඳහා ඔවුන්ට ඇති අවහිරතා සඳහා පහසුකම් සැලසීම හා ගැටළු විසඳීම සඳහා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මෙම කණ්ඩායම පත් කර ඇත. තවද එමඟින් දැනට සිටින ආයෝජකයින් මගින් ආයෝජන ප්‍රවණතාවයක් ඇති නව ආයෝජකයින් හඳුනාගැනීම ද සිදුවේ.

- **ව්‍යාපෘති පරීක්ෂාකිරීම හා ඇගයීම සඳහා ක්‍රමවේදය**

සුදුසු ආයෝජකයින් හඳුනාගැනීම හා විශ්වාසනීය නොවන ආයෝජකයින් අත්හැර දැමීම සඳහාත් ව්‍යාපෘති පරීක්ෂා කිරීම හා ඇගයීම මගින් ආයෝජන මණ්ඩල නිලධාරීන්ට ශක්‍යතාවයක් ඇති ව්‍යාපෘති වෙනුවෙන් වැඩි කාලයක් යෙදවීමටත් හැකිවන පරිදි ආයෝජන මණ්ඩලයේ ආයෝජකයින් ඇගයීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා McKinsey උපදේශකයින් විසින් ක්‍රමවේදයක් වැඩිදියුණු කර ඇත.

**නව අපනයනය සැකසුම් කලාප සංවර්ධනය සඳහා ඉඩම් හඳුනා ගැනීම**

රට තුල අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම හා රජයේ නව ආරම්භයන්ට සමගාමීව අපනයන සැකසුම් කලාප සංවර්ධනය සඳහා ඉඩම් හඳුනාගැනීම සඳහා නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම නව අපනයන සැකසුම් කලාප සංවර්ධනය සඳහා ආයෝජකයින් සොයා ගැනීම ආයෝජන මණ්ඩලයට පැවරී ඇත. ආයෝජන කලාප පිහිටුවීමට සුදුසු ඉඩම් ලෙස හඳුනාගෙන ඇති ඉඩම් අතරින් බිංගිරිය, මාතර චාලි මවුන්ට් වතුයාය සහ මිල්ලනිය යන ස්ථාන 3 හි සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත.

**නව අපනයන සැකසුම් කලාප (EPZs) ස්ථාපනය කිරීම සඳහා වන අයවැය යෝජනා.**

මේ කාර්යයට 2017 වසර සඳහා රු. බිලියන 2.5 ක් වෙන්කර ඇත.

***මිල්ලනිය යෝජිත කාර්මික උද්‍යානය***

- රාජ්‍ය පෞද්ගලික සහයෝගිතා (PPP) ආදර්ශ කාර්මික කලාපයක් ස්ථාපනය කිරීමට යෝජිතය.
- කාර්මික ප්‍රදේශය සඳහා ඉඩම් (අක්කර 244) අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකෙරෙමින් පවතී.
- පාරිසරික බලපෑම ඇගයීම (EIA) සඳහා අදාල පාර්ශවකරුවන් සමග පළමු සාකච්ඡාව පවත්වනු ලැබීය.
- කළුතර සිට වැඩබිම මායිම දක්වා මූලික විදුලිබල සැපයුම් (තාවකාලික) පහසුකම් ඉදිකිරීම සඳහා වන සමීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.
- ස්ථිර විදුලිබල සැපයුම් සඳහා උප විදුලිබල මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා වගවත්ත පර්ත් වතුයායෙන් අක්කර 5ක් නිදහස් කිරීම සඳහා මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබේ.
- දිනකට ඝන මීටර් 500ක මූලික ජල සැපයුමක් සැපයීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ගෙවීම් සිදුකර ඇති අතර වැඩ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- දිනකට ඝන මීටර් 2000ක ජල සැපයුමක් සැපයීම සඳහා මූලික කටයුතු සිදු කෙරේ.
- ප්‍රවේශ මාර්ගය සඳහා සමීක්ෂණ කටයුතු අවසන් කර ඉඩම් අත්පත් කර ගැනීම සිදු කෙරෙමින් පවතී.

***බිංගිරිය නව කාර්මික කලාපයේ ප්‍රගතිය***

- සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය මගින් ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කර ඇත.
- පස් පරීක්ෂා කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.
- මූලිකව දිනකට ජලය ඝන මීටර් 1000ක් සැපයීම සඳහා වන ඉල්ලීම හා ඒ සඳහා වන ජල සම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තුව ගෙවීම් සිදු කිරීම සඳහා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.
- මෙගාවොට් 2ක විදුලිබල සැපයුමක් සඳහා විදුලිබල මණ්ඩලයෙන් ලබා ගනු ලැබූ ඇස්තමේන්තු ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශයට යොමු කර ඇත.
- ආයෝජන මණ්ඩලය මගින් සංකල්පයමය සැලසුම් සකස් කර ඇත.
- පාරිසරික බලපෑම ඇගයීම සඳහා අදාල පාර්ශවකරුවන් සමඟ පළමු සාකච්ජා පවත්වනු ලැබීය.




**ආයෝජන ආකර්ශනය කරගැනීම සඳහා ඉලක්කගත ප්‍රවේශය**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා වන ඉලක්කගත අංශ හඳුනාගෙන ඇති අතර ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන හාවඩ් විශ්ව විද්‍යාල මධ්‍යස්ථානය (CID) හා ලෝක බැංකුවේ සහයෝගය ඇතිව සිදු කරන ලද පුළුල් අධ්‍යයනයක් තුලින් අයෝජන වැඩි දියුණු කර ගැනීමේ අංශ හඳුනාගෙන ඇත. ඉලක්කගත අංශ හඳුනා ගැනීමේදී විදේශ විනිමය ඉපයීම් වැඩි කිරීමේ දැක්ම ඇතිව අපනයන අරමුණු කරගත් වෙළඳ භාණ්ඩ මෙන්ම සේවාවන් සඳහා ද විශේෂ අවධානය යොමු කර ඇත.

**ආයෝජන ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛ ඉලක්කගත අංශ හඳුනාගැනීම.**

පහත දැක්වෙන මිණුම් දඬු උපයෝගී කරගෙන ප්‍රමුඛ ඉලක්කගත අංශ හඳුනාගෙන ඇත.

- ශ්‍රී ලංකාවේ සැපයුම් වෙළඳපල සඳහා සුදුසු ආකාරයෙන් වීම. (උදා:- ශ්‍රී ලංකාවේ නිපැයුම් ඉතා ප්‍රබල වන අතර ඍජු විදේශ ආයෝජන ආකර්ශනය කරගැනීමේ අවහිරතා නොමැත.)
- ශ්‍රී ලංකාවේ ඍජු විදේශ ආයෝජන විභවතාවන් සමඟ හොඳින්ම ගැලපෙන අංශ මොනවාද යන්න

- තත්වය, ප්‍රමාණය හා සැපයුම් පිරිවැය සලකා බැලීමේදී තරගකාරී රටවල් සමග පැහැදිලි ලෙස වාසිදායක තත්වයක් දක්නට ඇති අංශයන්.

### *Priority Target Sectors*

- ප්‍රමුඛ ඉලක්කගත නිෂ්පාදන අංශ.
  - ඉහල අගයක් එක්කල, උසස් තාක්ෂණ නිෂ්පාදන (වාහන කොටස්, වෛද්‍ය උපකරණ. ඖෂධ, සූර්ය පැනල, නිමකරන ලද ලෝහ කොටස්, අංගය එකතු කරන ලද ඛණිජ)
  - ඉහල අගයක් එක් කරන ලද ඇඟළුම් (අනර්ඝ රෙදිපිළි, පැළඳිය හැකි ඉලෙක්ට්‍රොනික උපාංග, වෙළඳපල විශේෂිත ඇඟළුම් නිෂ්පාදන)
  - ආහාර පිරිසැකසුම් කිරීම (මාළු, මුහුදු ආහාර, පළතුරු, එළවළු හා කිරි නිෂ්පාදන)
- සේවා අංශය.
- තොරතුරු තාක්ෂණ සේවා (IT මෘදුකාංග, BPM, KAM)
- සංචාරක කර්මාන්ත (හෝටල්, විනෝදාත්මක ක්‍රියා, වික්‍රමාන්විත ක්‍රීඩා හා විනෝදාස්වාද පහසුකම්)
- සැපයුම් සේවා (වෙළඳ මධ්‍යස්ථාන (Entrepot Trade, ප්‍රවාහනය, ගුදම්ගත කිරීම් හා ගබඩා කිරීම)
- අධ්‍යාපන (වෘත්තීය හා උසස් අධ්‍යාපන යන දෙකම)

### ආයෝජකයින්ට පහසුකම් සැලසීම සඳහා ආයෝජන ශක්තිමත් කිරීම.

ඉහත සඳහන් කළ ආරම්භක පියවරයන්ට අමතරව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රතිපත්ති මට්ටමේ ආයෝජක ගැටළු කාර්යක්ෂම ලෙස විසඳීමට හා අනුමත කිරීමේ ක්‍රියාවලිය ඉක්මන් කිරීම සඳහා රජය විසින් කමිටු දෙකක් ස්ථාපනය කර ඇත.

### තනි කවුළුවේ ආයෝජන අනුමත කිරීමේ කමිටුව (SWIAC)

විශාල ව්‍යාපෘති වලට අනුමැතිය ලබාදීම සඳහා රජය මගින් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද, භාණ්ඩාගාර ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුත් තනි කවුළුවේ ආයෝජන අනුමත කිරීමේ කමිටුව ස්ථාපනය කර ඇති අතර ආයෝජන මණඩලය විසින් ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ව්‍යාපෘති මූලික අනුමැතිය ලබාගැනීම සඳහා මෙම කමිටුව වෙත යොමු කෙරේ.

### ආයෝජන අනුමත කිරීම් සඳහා පහසුකම් සැලසීමේ කමිටුව (IAFC)

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශකවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් IAFC හිදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රමාද කරන අවහිරතා හා රේඛීය අමාත්‍යාංශය හා සම්බන්ධ ගැටළු සඳහා විසඳුම් ලබා දී තිබේ. අදාල රේඛීය අමාත්‍යාංශයේ හා ආයෝජන මණ්ඩලයේ සහභාගිත්වය ඇතිව ගැටළු බොහොමයක් සාර්ථක ලෙස විසඳා ඇත.



## 40 වන සංවත්සරය සැමරීම













2017 ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එහි 40 වන වසර සම්පූර්ණ කරනු ලැබීය. කොළඹින් බැහැර ප්‍රදේශයන්හි සංවර්ධනය ඇති කිරීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම ලෙස 1978 දී ආරම්භ කරනු ලැබූ මෙම ආයතනය සමස්ථ දිවයිනම ආවරණය කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලෙස නැවත ස්ථාපනය කරනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පසුගිය දශක 4 මුළුල්ලේ රටේ ආර්ථික වර්ධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරවන සංවර්ධනයේ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරමින් තිබේ. එම නිසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමාජීය වෙනසක් ඇති කිරීමේ කැපී පෙනෙන දායක්තවයක් ලබා දෙන අතර, ශ්‍රී ලංකාව වසර 40 කාලය තුල වේගවත්ව ගෝලීයකරණය වන ලෝකය සමඟ යමින් මෙරට ආර්ථික හා සමාජීය වශයෙන් විප්ලවීය වෙනසක් ඇති කිරීමට සමත්ව ඇත.

# වැදගත් සිදුවීම්

| | |
|---|---|
| 1978 | 1978 අංක 04 දරණ පාර්ලිමේන්තු පනත යටතේ මහ කොළඹ ආර්ථික කොමිසම ස්ථාපනය කිරීම. |
| 1979 | ශ්‍රී ලංකාවේ ප්‍රථම හා විශාලම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම. |
| 1986 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල දෙවන අපනයන සැකසුම් කලාපය බියගම ස්ථාපනය කිරීම. |
| 1990 | විදේශ ආයෝජන උපදේශණ කමිටුව හා මහ කොළඹ ආර්ථික කොමිසම එකට එක්ව ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන අනුමත කිරීමේ පූර්ණ අධිකාරිය මහ කොළඹ ආර්ථික කොමිසමට හිමිවිය. |
| 1991 | දකුණු පළාත සංවර්ධනය කිරීම සඳහා කොග්ගල සැකසුම් කලාපය පිහිටුවීම. |
| 1992 | මහ කොළඹ ආර්ථික කොමිසම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලෙස නම් කිරීම. ඇගළුම් කම්හල් 200 වැඩසටහන ආරම්භ කිරීම. |
| 1995 | මහනුවර කාර්මික උද්‍යානය පිහිටුවීම. |
| 1998 | මීරිගම අපනයන සැකසුම් කලාපය හා මල්වත්ත අපනයන සැකසුම් කලාපය පිහිටුවීම. |
| 1999 | හොරණ අපනයන සැකසුම් කලාපය හා වතුපිටිවල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම. |
| 2000 | පොල්ගහවෙල, මාවතගම හා මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප පිහිටුවීම. |
| 2001 | සීතාවක අපනයන සැකසුම් කලාපය කාර්මික සංවර්ධන මණ්ඩලය වෙතින් පවරා ගැනීම. |
| 2006 | ව්‍යවසායන් 300 වැඩසටහන ආරම්භ කිරීම. |
| 2008 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර ලෙස ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම. |
| 2009 | ISO 9001 2000 ලබාගත් ප්‍රථම රාජ්‍ය ආයතනය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි. යාපනය කාර්යාලය පිහිටුවීම. |
| 2011 | පළමු වරට ඇ.ඩො. බිලියන 1 ක සෘජු විදේශ ආයෝජන ලගා කර ගනු ලැබීය. |
| 2013 | "පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය" කොළඹ දී සංවිධානය කරනු ලැබීය. |
| 2014 | ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් - "ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014ය සඳහා දායකත්වය ලබාදෙන ලැබීය. |
| 2017 | 40 වන සංවත්සරය සැමරීම. මෙතෙක් ලද ඉහළම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය වන ඇ.ඩො. බිලියන 1.7 ලගා කර ගැනීම. |

# සමාලෝචනය

## 2017 වර්ෂයේ ලෝක ආයෝජන ප්‍රවණතාවය

**ගෝලීය සෘජු විදේශ ආයෝජන රට තුලට ගලා ඒම**

2016 අගය වූ ඇ.ඩො. ට්‍රිලියන 1.87 හා සන්සන්දනය කිරීමේදී 2017 රට තුලට ගලා එනු ලැබූ සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. ට්‍රිලියන 1.43 දක්වා 23%කින් අඩුවිය. වෙනත් රටක ආයෝජනයන් සමග ඒකාබද්ධවීම හා අත්පත් කරගැනීම් 22%කින් අඩුවීම හා මූලික යටිතල පහසුකම් ඇතුලත් ආයෝජන 14%කින් අඩුවීම මෙම අඩුවීමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතුවේ.

**කලාපීය වශයෙන් සෘජු විදේශ ආයෝජන රටතුලට ගලා ඒම (2013-2017)**




*මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සමුළුව, ලෝක ආයෝජන වාර්තාව 2017*

සංවර්ධිත රටවල් කරා ගලාගිය සෘජු විදේශ ආයෝජන 2017 දී 37%කින් තීව්‍ර ලෙස අඩුවිය. 2016 වසරේ අගය වූ 60.6% හා සැසඳීමේදී 2017දී සංවර්ධිත රටවලට ලබාගත හැකිවූයේ ගෝලීය සෘජු විදේශ ආයෝජන වලින් 49.8% ක් පමණි.

2017 දී සංවර්ධිත රටවල් කරා සෘජු විදේශ විනිමය ගලායාම ඇ.ඩො.බිලියන 671ක අගයක ස්ථාවරව පැවතිණ.

**ගෝලීය සෘජු විදේශ ආයෝජන රටතුලට ගලා ඒම (2013-2017)**




*මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සමුළුව, ලෝක ආයෝජන වාර්තාව 2017*

සංවර්ධනය වන ආසියාතික රටවල් කරා වන සෘජු විදේශ ආයෝජන ගලනයන් 2017 දී ස්ථාවරව තිබූ අතර ලෝකයේ විශාලතම සෘජු විදේශ ආයෝජන ලාභියා ලෙස එම රටවල තත්වය නැවත ලඟා කර ගනු ලැබීය. 2017 දී ලතින් ඇමරිකානු හා කැරිබියන් රටවල් කරා සෘජු විදේශ ආයෝජන ගලනයන් 8%කින් ඉහල යනු ලැබීය. නමුත් පසුගිය වසර හා සැසඳීමේදී අප්‍රිකානු රටවල් වලට සෘජු විදේශ ආයෝජන ගලනයන් 21% කින් අඩු විය.

සංවර්ධිත තත්වයට පත්වෙමින් පවතින රටවල් කරා වූ සෘජු විදේශ ආයෝජන ගලනයන් 2017 දී 27% කින් ඉහල ගිය අතර එය 2005 වසරේ සිට වාර්තා වූ දෙවන අඩුම මට්ටම විය.

## ගෝලීය වශයෙන් සෘජු විදේශ ආයෝජන රටින් පිටතට ගලායාම

පසුගිය වසර හා සැසඳීමේදී 2017 වසරේදී රටින් පිටතට ගලාගිය සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. 1,430 දක්වා 2.9%කින් ඉහල ගොස් ඇත.




*මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සමුළුව, ලෝක ආයෝජන වාර්තාව 2017*

## කලාපීය වශයෙන් සෘජු විදේශ ආයෝජන රටින් පිටතට ගලායාම

පසුගිය වසර හා සැසඳීමේදී සංවර්ධිත රටවල් වලට හා සංවර්ධනය වන රටවල් වලට සෘජු විදේශ ආයෝජන ගලායාම පිළිවෙලින් 3%කින් හා 6%කින් වැඩිවී ඇත. නමුත් සංවර්ධිත තත්වයට පත්වෙමින් පවතින රටවලට සෘජු විදේශ ආයෝජන ගලායාම 2017 දී 59%කින් වැඩිවී ඇත.




*මූලාශ්‍රය: එක්සත් ජාතීන්ගේ වෙළඳාම හා සංවර්ධනය පිළිබඳ සමුළුව, ලෝක ආයෝජන වාර්තාව 2017*

# 2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආයෝජන දක්ම

## ආයෝජන කාර්යසාධනය 2017

### 1. 2017 දී අයදුම්පත් සැකසීමේ ප්‍රගතිය




මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

2017 වසරේදී නව ව්‍යාපෘති සඳහා මණ්ඩලය වෙත අයදුම්පත් 106 ක් ඉදිරිපත් කර තිබුණි. මෙම අයදුම්පත් 106 අතරින් අනුමත වූ අයදුම්පත් 84 න් ව්‍යාපෘති 06 ක් වාණිජ මෙහෙයුම් ආරම්භ කර ඇති අතර ව්‍යාපෘති 11 ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.

මීට අමතරව 2017 වසර තුලදී පවතින ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා අයදුම්පත් 61 ක් ලැබී තිබුණි.

## 2. ක්‍රියාත්මක තත්වය අනුව ව්‍යාපෘති විස්තර

### ◆ අනුමතකරන ලද ව්‍යාපෘති

2017 වසරේදී මුළු ඇස්තමේන්තුගත අගය ඇ.ඩො. මිලියන 4,747 (රු.මිලියන 723,781.69) වන ව්‍යාපෘති 144 ක් සඳහා අනුමැතිය ලබා දී ඇත. 2017 දී අනුමත කරනු ලැබූ ව්‍යාපෘතිවලින් 37,000 කට අධික රැකියා අවස්ථාවන් බිහිවන බව ඇස්තමේන්තු කර ඇත.

**2017 දී අනුමත ව්‍යාපෘතිවල ආයෝජනය හා රැකියා බිහිවීම අංශ වශයෙන්**

| අංශය | ව්‍යාපෘති සංඛ්‍යාව | ඇස්තමේන්තුගත ආයෝජන (රු.මිලි.) | රැකියා නියුක්තිය (සංඛ්‍යාව) |
|---|---|---|---|
| සේවා/යටිතල පහසුකම් | 52 | 521,776 | 9,382 |
| නිවාස හා දේපල සංවර්ධනය | 13 | 31,048 | 2,464 |
| හෝටල්, අවන්හල් සේවා හා විනෝදාස්වාද සංකීර්ණ | 11 | 42,437 | 915 |
| සාප්පු හා කාර්යාල සංකීර්ණ වෛද්‍ය මධ්‍යස්ථාන | 6 | 101,082 | 1,548 |
| රෝහල් සේවා හා වෛද්‍ය මධ්‍යස්ථාන | 3 | 4,480 | 1,228 |
| විදුලිබල උත්පාදනාගාර | 3 | 19,827 | 218 |
| නාවුක සේවා | 2 | 2,693 | 20 |
| ඇමතුම් මධ්‍යස්ථාන/ව්‍යාපාර කාර්යාවලි බාහිරින් ඉටුකර ගැනීම හා ධාරක මධ්‍යස්ථාන | 2 | 85 | 160 |
| වරාය සංවර්ධනය | 2 | 314,927 | 2,246 |
| බහාලුම් සේවා, ගුදම්ගත කිරීම හා භාණ්ඩ ප්‍රවාහන | 2 | 672 | 94 |
| වෙනත් | 8 | 4,526 | 489 |
| **නිෂ්පාදන** | 35 | 72,139 | 14,999 |
| **කෘෂිකාර්මික** | 2 | 304 | 127 |
| **දැනට පවත්නා ව්‍යාපෘති ව්‍යාප්ත කිරීම්** | 55 | 129,561 | 12,725 |
| මුළු ගණන | 144 | 723,781 | 37,233 |

*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

2017 වසරේදී අනුමත කරන ලද මුළු ආයෝජන වලින් ඉහලම දායකත්වය (72%) සේවා/යටිතල පහසුකම් අංශය මගින් ලබාදෙන අතර ව්‍යාපෘති පුළුල් කිරීමේ ආයෝජන (18%) හා නිෂ්පාදන අංශය (10%) එයට අනුගාමී වේ.

2017 දී අනුමත කරනලද ව්‍යාපෘති මගින් ඇස්තමේන්තුගත මුළු රැකියා ප්‍රමාණයෙන් 40% ක් නිෂ්පාදන අංශයෙන්ද 25% සේවා/යටිතල පහසුකම් අංශයෙන්ද උත්පාදනය වන බවට අපේක්ෂා කෙරිණ.

### ◆ අත්සන් කරන ලද ගිවිසුම්.

2017 දී අත්සන් කරනු ලැබූ මුළු ව්‍යාපෘති සංඛ්‍යාව වන 103 න් 56 ක් නව ව්‍යාපෘති වන අතර 47 ක් පවතින ව්‍යාපෘති පුළුල් කිරීමේ වේ. මෙම ව්‍යාපෘතිවල සම්පූර්ණ ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. මිලියන 3,462 (රු. මිලියන 527,882) වේ. එමගින් 25,900 කට අධික රැකියා අවස්ථා සංඛ්‍යාවක් උත්පාදනය වනු ඇති බවට අපේක්ෂා කෙරිණ.

◆ **2017 දී ඉදිකිරීම්/ක්‍රියාත්මත කිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘති**

2017 දී නව ව්‍යාපෘති 68ක හා ව්‍යාපෘති පුළුල් කිරීම් 8ක ක්‍රියාත්මක කිරීම්/ඉදිකිරීම් ආරම්භ විය. ක්‍රියාත්මක කිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල මුළු ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. මිලියන 1,400 (රු.මිලි. 213,531.57)ක් විය. අපේක්ෂිත රැකියා උත්පාදනය 12,000 කට අධිකවේ.

**2 වගුව : 2017 දී ඉදිකිරීම්/ක්‍රියාත්මක කිරීම් ආරම්භ කරන ලද ප්‍රමුඛ ව්‍යාපෘති 10**
**(ඇස්තමේන්තුගත ආයෝජන අනුව)**

| ව්‍යාපෘතිය | ව්‍යාපාරික ක්‍රියාකාරකම් | ඇස්තමේන්තු ගත රැකියා සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත ආයෝජනය (රු.මිලි) | අංශය | පිහිටීම |
|---|---|---|---|---|---|
| ද වන් ට්‍රාන්ස්වර්ක්ස් ස්ක්වෙයා (පුද්.) සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 1,350 | 60,300 | යටිතල පහසුකම් | කොළඹ |
| කැපිටල් ටවර්ස් ලිමිටඩ් | නේවාසික සංකීර්ණය | 895 | 16,632 | යටිතල පහසුකම් | කොළඹ |
| බ්ලූ මවුන්ටන් අපාට්මන්ට්ස් - කොළඹ 04 | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 138 | 16,269 | යටිතල පහසුකම් | කොළඹ |
| හැව්ලොක් සිටි (පුද්.) සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 259 | 15,211 | යටිතල පහසුකම් | කොළඹ |
| ඔඩෙල් ප්‍රොපටීස් වන් (පුද්) සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 66 | 14,730 | යටිතල පහසුකම් | කොළඹ |
| රිජිඩ් ටයර් කෝපරේෂන් ලිමිටඩ් | රේඩියල් හා ඝන ටයර් | 981 | 10,875 | යටිතල පහසුකම් | කළුතර |
| ඊ ඒ මැක්රෝ හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම | මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 20 | 7,892 | යටිතල පහසුකම් | කොළඹ |
| යූනියන් ප්ලේස් අපාට්මන්ට්ස් (පුද්) සමාගම | මහල් නිවාස සංකීර්ණයක් ඉදිකිරීම | 10 | 7,647 | යටිතල පහසුකම් | කොළඹ |
| ජේ එස් එෆ් කෝපරේෂන් (පුද්) සමාගම | සූර්ය පැනල, පරිවර්තක හා ලේඩ්ල විදුලි පහන් ඇතුළු සූර්ය බල පද්ධති | 83 | 5,337 | නිෂ්පාදනය | ගම්පහ |
| මරයින් ඩ්‍රයිව් හෝටල (පුද්) සමාගම | කාමර 380 කින් යුත් හෝටලය (තරු හතරේ) | 99 | 5,031 | සංචාරක හා විවේක | කොළඹ |

*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

◆ **වාණිජ මෙහෙයුම් ආරම්භ කරනලද ව්‍යාපෘති**

2017 වසර තුළදී වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 66 ක් (නව ව්‍යාපෘති 65 හා ව්‍යාපෘති පුළුල් කිරීම් 1) වේ. මෙම ව්‍යාපෘති මගින් ඇ.ඩො. මිලි 470 (රු.71,674) ක ආදායමක් උපලබ්ධි වන අතර මෙමගින් 7,500 කට අධික රැකියා අවස්ථාවන් බිහිවී ඇත.

◆ **වාණිජ මෙහෙයුම් ආරම්භ කරනලද ව්‍යාපෘති වල ආංශික ව්‍යාප්තිය**

2017 දී වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති 66 න් ව්‍යාපෘති 17 ක්ම සංචාරක හා විනෝද අංශයෙන්ද ව්‍යාපෘති 13 ක් නිෂ්පාදන අංශයෙන්ද ව්‍යාපෘති 08 ක් යටිතල පහසුකම් අංශයෙන්ද, ව්‍යාපෘති 04 ක් සේවා අංශයෙන්ද, ව්‍යාපෘති 02 ක් කෘෂි කාර්මික අංශයෙන් හා 01 ක් ව්‍යාපෘතියක් දැනුම පාදක සේවා අංශයෙන් ද සමන්විත වේ.

**2017 දී වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති වල ආංශික ව්‍යාප්තිය**




*මූලාශ්‍රය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

◆ **වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල දිස්ත්‍රික්ක අනුව ව්‍යාප්තිය**

2016 දී වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘති වලින් 38% ක් ම කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක තුළ පිහිටා ඇත. ඉතිරිය අනෙක් දිස්ත්‍රික්ක 14 පුරා භූගෝලීය වශයෙන් ව්‍යාප්තව ඇත.

**2017 දී වාණිජ මෙහෙයුම් ආරම්භ කරන ලද ව්‍යාපෘතිවල**
**දිස්ත්‍රික්ක අනුව ව්‍යාප්තිය**




*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

## 3. 2017 දී ආකර්ශනය කරගනු ලැබූ සෘජු විදේශ ආයෝජන

විදේශ ණය හා ඇ.ඩො.මිලියන 1,710 හැර, විදේශ ණය සංරචකය ඇතුළුව ඇ.ඩො.මිලියන 1,173ක් වන ශ්‍රී ලංකාවේ මෙතෙක් වාර්තා වූ ඉහලම සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය 2017 වසරේදී වාර්තා විය.

### අංශ වශයෙන් ලැබුණු සෘජු විදේශ ආයෝජන

2017 දී ලැබුණු සෘජු විදේශ ආයෝජන වලින් ඇ.ඩො.මිලි 541 ක් (32%) වන වැඩිම ප්‍රමාණය නිවාස හා දේපළ සංවර්ධන අංශය සඳහා ලැබී ඇති අතර ඊට පසුව නිෂ්පාදන අංශය ඇ.ඩො. මිලි 347.6 (20%), වරාය සංවර්ධන අංශය ඇ.ඩො. මිලි 293 (17%), හෝටල් අංශය ඇ.ඩො. මිලි 253 (15%), දුරකතන හා විදුලි සංදේශ අංශයට ඇ.ඩො. මිලි 209 (12%) ද ආදී වශයෙන් ලැබී ඇත.

**2017 ලැබූ සෘජු විදේශ ආයෝජන (ඇ.ඩො.මිලි.)**




මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

**ප්‍රධාන සෘජු විදේශ ආයෝජන ප්‍රභව - 2017**

ඇ.ඩො.මිලි. 628ක ආයෝජන සහිත චීනය විශාලම සෘජු විදේශ ආයෝජන ප්‍රභවයවේ. ඊට පසුව හොංකොන් (ඇ.ඩො.මිලි. 296), ඉන්දියාව (ඇ.ඩො.මිලි. 174), මැලේසියාව (ඇ.ඩො.මිලි. 88), සිංගප්පූරුව (ඇ.ඩො.මිලි. 80), නෙදර්ලන්තය (ඇ.ඩො.මිලි. 72), එක්සත් රාජධානිය (ඇ.ඩො.මිලි. 67), ජපානය (ඇ.ඩො.මිලි. 46), ස්වීඩනය (ඇ.ඩො.මිලි. 43), ඇ.එ.ජ. (ඇ.ඩො.මිලි. 38), ඔස්ට්‍රේලියාව (ඇ.ඩො.මිලි. 27), තායිලන්තය (ඇ.ඩො.මිලි. 21), පිලිපීනය (ඇ.ඩො.මිලි. 20), එක්සත් අරාබි එමිර් රාජ්‍යය (ඇ.ඩො.මිලි. 18), ඩුබායි (ඇ.ඩො.මිලි. 14) ආදී වශයෙන් වේ. 2016 දී ලැබුණු සෘජු විදේශ ආයෝජන වලින් 96%ක් සඳහා මෙම රටවල් 15 එක්ව දායකවිය.

**ප්‍රධාන සෘජු විදේශ ආයෝජන ප්‍රභව (ඇ.ඩො.මිලි) - 2017**




*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

## 4. උපලබ්දි වූ ආයෝජන (සමුච්චිත)




2016 වසර අවසානයේ උපලබ්ධි වූ සමුච්චිත මුළු ආයෝජනය රු.බිලියන 2,727 ක් වන අතර එය පසුගිය වසර හා සැසඳීමේදී 9%ක වර්ධනයනක් පෙන්නුම් කෙරේ. රු.බිලියන 2,727 වන මෙම අගයෙන් 60%ක් (රු.බිලියන 1,635) මගින් විදේශීය සංරචකය හා ඉතිරි 35% (රු.බිලියන 1,092) මගින් දේශීය පෞද්ගලික ආයෝජන පෙන්නුම් කෙරේ.

උපලබ්ධි වූ සමස්ත ආයෝජන වලින් 76%ක් සඳහා යටිතල පහසුකම් හා සේවා අංශය දායකවන අතර ඉතිරි 24% ඇඟළුම් ඇතුළු නිෂ්පාදන අංශයෙන් සමන්විත වේ.

## 5. රැකියා උත්පාදනය (සමුච්චිත)

**2017 දෙසැම්බර් වන විට සමුච්චිත රැකියා නියුක්තිය**




*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

2017 දෙසැම්බර් වනවිට ආයෝජන මණ්ඩල ව්‍යාපෘති මගින් උත්පාදනය වූ සමුච්චිත රැකියා ප්‍රමාණය 494,397 ලෙස වාර්තා වේ.

2017 දෙසැම්බර් වන විට ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වලින් 494,397 ක සමුච්චිත රැකියා සංඛ්‍යාවක් වාර්තා විය. ආයෝජන මණ්ඩල ව්‍යාපෘතිවල සමුච්චිත රැකියා ප්‍රමාණයෙන් 59% රෙදිපිළි, ඇඟළුම් හා සම්භාණ්ඩ අංශයෙන්ද, 20% නිෂ්පාදන අංශයෙන්ද වේ. 2017 සමුච්චිත රැකියා ප්‍රමාණයෙන් 21% කෘෂි කර්මාන්තය ඇතුළු සේවා හා යටිතල පහසුකම් අංශය මගින් නියෝජනය කරනු ලැබීය.

## 6. අපනයන කාර්යසාධනය

ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ගේ මුළු අපනයන ප්‍රමාණය 2017 දී ඇ.ඩො.මිලියන 7,792 ක් වූ අතර එමගින් ජාතික අපනයනයන්ගෙන් 68% ක් හා ජාතික කර්මාන්ත අපනයනයන්ගෙන් 84% ක් නියෝජනය කෙරේ.




*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*




*මූලාශය : කළමණාකරන තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

2017 වසර තුලදී ඇගළුම් අංශය මගින් අපනයනයේ ඉහළම ප්‍රතිශතය (63%) නියෝජනය කරනු ලැබූ අතර ආයෝජන මණ්ඩල මුළු අපනයනයන් නිෂ්පාදන අංශය (ඇගළුම් හැර) මගින් 20%ක් ද කෘෂිකාර්මික අංශය මගින් 8%ක් ද නියෝජනය කරනු ලැබීය.

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය

## 1. ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

### කාර්යයන්

ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ නව අයෝජකයින් සඳහා පළමුව සම්බන්ධ වෙමින් අදාල ඉලක්කගත රටවල් හා අංශ වලින් මෙරටට සෘජු විදේශ ආයෝජන ආකර්ශනය කර ගැනීමයි. දැනට සිටින ආයෝජකයින්ගේ වැඩි දියුණු කළ හැකි විභවතාවයන් හඳුනාගැනීම හා එමගින් එම ආයෝජකයින්/සමාගම් වෙනත් අමතර ආයෝජන කෙරෙහි දිරිමත් කිරීම ද ආයෝජන ප්‍රවර්ධනයට ඇතුලත්ය.

**ප්‍රගතිය**

**2017 වසර තුළදී රටින් පිටත හා රට තුල සිදු කරනු ලැබූ අයෝජන ප්‍රවර්ධන දූත මෙහෙයන්**

| රටින් පිටත ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙයන් |
|---|
| **ඕස්ට්‍රේලියාව (මෙල්බර්න්) : 2017 පෙබරවාරි 13-17**<br>ගරු අග්‍රාමාත්‍යවරයාගේ සංචාරයට සමගාමීව මෙල්බර්න් නගරයේදී වටමේස සාකච්ඡා පවත්වනු ලැබීය. |
| **තායිලන්තය : 2017 පෙබරවාරි 15-18**<br>රොජානා ඉන්ඩස්ට්‍රියල් පාක් පබ්ලික් කම්පණි හා අමාටා කෝපරේෂන් ඇතුළු තෝරා ගත් සමාගම් සමඟ වෙන් වෙන්ව පැවැත් වූ සාකච්ඡා වලින් අනතුරුව තායි වාණිජ මණ්ඩලය සමඟ වටමේස සාකච්ඡාවක් පවත්වනු ලැබීය. රොජානා තාක්ෂණ කණ්ඩායම මගින් මෙරටට සිදුකරනු ලැබූ සංචාරය (2017 මාර්තු) හා 2018 අගෝස්තු මස සිදුකරනු ලැබූ ඉහල මට්ටමේ දූත මෙහෙයට අනතුරුව අභිමතයන් පළකිරීම් අත්සන් කිරීමට ඇත. |
| **හොංකොං : 2017 මාර්තු 15-18**<br>ස්ටැන්ඩඩ් චාටඩ් බැංකුවේ ආරාධනය පරිදි ශ්‍රී ලංකා ආයේජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා ආයෝජන වැඩසටහන (Sri Lanka Investment Road show) සඳහා ආරාධිත විනිශ්චය මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගි විය. |
| **මොස්කව්, රුසියාව : 2017 මාර්තු 23-25**<br>අතිගරු ජනාධිපතිවරයාගේ මොස්කව් සංචාරයේදී ආයෝජන මණ්ඩල සභාපතිවරයා ඉහල මට්ටමේ සාකච්ඡා සඳහා සහභාගි විය. 2017 ඔක්තෝබර් මාසයේදී කොළඹ පැවති වෙළඳාම, ආර්ථික, විද්‍යා හා තාක්ෂණ සහයෝගීතාවය පිළිබඳ ශ්‍රී ලංකා/රුසියානු අන්තර් රාජ්‍ය කොමිසමේ දෙවන සැසිය සඳහා ආයෝජන මණ්ඩලය සහභාගි විය.<br>ආයෝජන මණ්ඩලය මගින් රුසියානු ආයෝජකයින් සඳහා ඇති අවස්ථාවන් හුවාදක්වනු ලැබූ අතර ව්‍යාපාරික දූත කණ්ඩායම් හරහා සමීප ආයෝජන සම්බන්ධතා සඳහා පහසුකම් සැලසීමට දෙපාර්ශවය එකඟවිය. |
| **හැනෝයි, වියට්නාමය : 2017 අප්‍රේල් 15-20**<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගරු අග්‍රාමාත්‍යවරයාගේද සහභාගිත්වය ඇතිව පවත්වන ලද ශ්‍රී ලංකා - වියට්නාම් ආයෝජන සංසදය නියෝජනය කරනු ලැබූ අතර වියට්නාමයේ ප්‍රමුඛ සමාගම් සමඟ වෙන් වෙන්ව ව්‍යාපාරික සාකච්ඡා පවත්වනු ලැබීය. |
| **තුර්කිය : 2017 මැයි 14-20**<br>ඉස්තාන්බුල් ඇඟළුම් සංවිධානයේ සභාපතිවරයාගේ ආරාධනය අනුව කරුණු සොයාබැලීමේ දූත මෙහෙයක් සිදුකරනු ලැබීය. |
| **ඔසාකා, ජපානය : 2017 මැයි 13-18**<br>ආයෝජන මණ්ඩල සභාපතිවරයා විසින් මිට්සුබිෂි තෝකියෝ UFJ බැංකුව, ශ්‍රී ලංකා ජපාන ආර්ථික සංස්ථා කමිටුව, හා මිට්සුබිෂි කෝපරේෂන් සමඟ පැවති සාකච්ඡා නියෝජනය කරනු ලැබීය. |
| **සිංගප්පූරුව : 2017 මැයි 31 ජූනි 04**<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ලෝක බැංකු වැඩසටහනෙහි සාකච්ඡා මණ්ඩල සාමාජිකයෙකු ලෙස සහභාගි විය. |

| |
|---|
| **ස්වීඩනය හා ඩෙන්මාර්කය : 2017 ජූනි 06-09** |
| මහා නගර ආරම්භක වැඩසටහන් යටතේ ඇති ආයෝජන අවස්ථා පිළිබඳව ඩෙන්මාර්ක් හා ස්වීඩන් ආයෝජකයින් අතර පැවති දැනුවත් කිරීමේ දූත මෙහෙය සඳහා ආයෝජන මණ්ඩලය නියෝජනය කරනු ලැබිය. M/s Fortum Ltd. කණ්ඩායමක් 2017 ජූනි හා සැප්තැම්බර් මාස වලදී අපද්‍රව්‍ය කළමනාකරණය හා අපද්‍රව්‍ය වලින් බලශක්තිය නිපදවීමේ හැකියාවන් ගවේෂණය කිරීම සඳහා මෙරටට සංචාරය කරනු ලැබීය. |
| **තුර්කිය : 2017 අගෝස්තු 14-19** |
| තුර්කියේ පැවති ඉස්මීර් ජාත්‍යන්තර වෙළඳපල සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය. |
| **ඉතාලිය හා ස්විට්සර්ලන්තය : 2017 සැප්තැම්බර් 24 ඔක්තෝබර් 02** |
| ප්‍රති අපනයන වැඩසටහන් ආරම්භ කිරීම සඳහා ඉතාලියේ හා ස්විට්සර්ලන්තයේ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙයන් පැවැත්විණ.<br>මෙම ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන දැනටමත් ශ්‍රී ලංකාවේ ස්ථාපිත (Ceylon Contrinex) ස්විස් සමාගමක් (Contrinex) මගින් සංවිධානය කරනු ලැබූ අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා විධායක අධ්‍යක්ෂවරයා (ආයෝජක සේවා) විසින් නියෝජනය කරනු ලැබීය. ව්‍යාපාරික හැකියාවන් සොයාබැලීම සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට සමාගම් කීපයක් කැමැත්තක් දක්වනු ලැබීය. KUK Electronic සමාගම 2018 ජූනි මාසයේදී ශ්‍රී ලංකාවේ සිය ප්‍රථම සංචාරය පිළිබඳව තීරණය කරනු ලැබීය. |
| **චීනය : 2017 නොවැම්බර්** |
| ආයෝජන ප්‍රවර්ධන සමුළුව හා පෙර හඳුනාගත් සමාගම් සමග ඉලක්කගත නගරවල වෙන් වෙන් වශයෙන් රැස්වීම් පවත්වනු ලැබීය. |
| **සිංගප්පූරුව : 2017 නොවැම්බර්** |
| සිංගප්පූරුවේ IE ආයතනයේ සහය ඇතිව ආයෝජන හා වෙළඳ ප්‍රවර්ධන දූත මෙහෙයක් සංවිධානය කිරීම සඳහා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ ශ්‍රී ලංකා - සිංගප්පූරු ව්‍යාපාරික සංසදය සඳහා ආයෝජන මණ්ඩලය අනුග්‍රාහකත්වය දැක්වීය. |
| **කොරියානු ජනරජය : 2017 නොවැම්බර්** |
| අතිගරු ජනාධිපතිතුමාගේ කොරියානු නිල සංචාරයට අදාලව සංවිධානය කරනු ලැබූ අයෝජන ප්‍රවර්ධන දූත මෙහෙය සඳහා ආයෝජන මණ්ඩල සභාපතිවරයා සහභාගි වනු ලැබීය. තෝරාගත් සමාගම් සමග වෙන් වෙන් වශයෙන් ඉහල මට්ටමේ සංසදයක් පවත්වනු ලැබීය. Lotte ඉන්ජිනේරු හා ඉදිකිරීම් සමාගම ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ව්‍යාපෘතිවල නියලීමේ හැකියාවන් සොයාබැලීමට කැමැත්ත පලකරනු ලැබීය. Lotte සමාගමේ දූත කණ්ඩායමක් දැනටමත් ශ්‍රී ලංකාවට පැමිණ ආයෝජන මණ්ඩල නිලධාරින් සමග සාකච්ඡා පවත්වා ඇත. |

| |
|---|
| රට තුල සිදු කරනු ලැබූ ආයෝජන ප්‍රවර්ධන දූත මෙහෙයන් |
| **මැලේසියාවේ SAITO Collage හා එක්සත් රාජධානියේ ස්ටැෆෝඩ්ෂි ඇල්ෆා ඉන්ටර්නැෂනල් එඩියුකේෂන් ලිමිටඩ් ආයතනයේ දූත කණ්ඩායම් : පෙබරවාරි 21** |
| රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයේ තොරතුරු තාක්ෂණයට අදාල නිර්මාණ පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු ආයතනයක් ස්ථාපනය කිරීමට කිරීමට කැමැත්තක් දක්වනු ලැබීය.<br>ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය JAAF හා මොරටුව විශ්ව විද්‍යාලය සමග සාකච්ඡා සංවිධානය කරනු ලැබීය. |
| **සිංගප්පූරුවේ මිට්සුයි ඒසියා පැසිපික් ව්‍යාපාරික ඒකකයේ දූත කණ්ඩායම: පෙබරවාරි 20** |
| කරුණු සොයා බැලීමේ දූත මෙහෙය |
| **නවසීලන්තරේ ව්‍යාපාරික දූත කණ්ඩායම : මාර්තු 06** |
| ඕස්ට්‍රේලියා නවසීලන්ත ව්‍යාපාරික කවුන්සිලය හා නවසීලන්තය වෙළඳ හා ව්‍යාපාර මගින් සංවිධානය කරනු ලැබූ ව්‍යාපාරික සංසදය සඳහා ශ්‍රී ලංකා අයෝජන මණ්ඩල සභාපතිවරයා සහභාගි විය. |
| **කැනඩාවේ ව්‍යාපාරික දූත කණ්ඩායම : මාර්තු 14** |
| අයෝජන මණ්ඩල සභාපතිවරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු විය. |
| **ජපානයේ JIMA සමාගමේ දූත කණ්ඩායම : මාර්තු 23** |
| සූර්යබල ශක්ති ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වීය. |
| **ජපානයේ Mitsubishi Corporation Finance & Consulting Asia. Ltd දූත කණ්ඩායම : අප්‍රේල් 25** |
| යටිතල පහසුකම් අංශය හා වරාය නගරයේ ආයෝජන අවස්ථා සම්බන්ධයෙන් උනන්දුවක් දැක්වීය. |

| |
|---|
| **ජපානයේ මිට්සුයි සහ සමාගමේ දූත කණ්ඩායම : අප්‍රේල් 26** |
| විදුලිබල අංශය කෙරෙහි උනන්දුවක් දැක්වීය. |
| **චෙක් ජනරජයේ ව්‍යාපාරික දූත කණ්ඩායම : මැයි 04** |
| ශ්‍රී ලංකාවේ චෙක් ජනරජයේ ගරු කොන්සල්වරයා විසින් සංවිධානය කරනු ලැබූ ව්‍යාපාරික සංසදය හා ඊට පසු පැවති සාකච්ජා සඳහා ආයෝජන මණ්ඩල සභාපතිවරයා සහභාගි විය. |
| **චීනයේ ගුඇන්ෂි පළාතේ ව්‍යාපාරික දූත කණ්ඩායම : මැයි 19** |
| කාර්මික උද්‍යාන හා වරාය සංවර්ධනය. |
| **තායිලන්තයේ වාණිජ අමාත්‍යාංශයේ, වෙළඳ සාකච්ජා කිරීමේ දෙපාර්තමේන්තුවේ, මූල්‍ය ප්‍රතිපත්ති ආයතනයේ දූත කණ්ඩායම : මැයි 23** |
| ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා පිළිබඳව දැන ගැනීම සඳහා වන අධ්‍යයන චාරිකාවකි. ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වී බියගම හා හම්බන්තොට අපනයන සැකසුම් කලාපවල සංචාරයක්ද සිදු කරනු ලැබීය. |
| **චීනයේ ෂෙන්ෂු නාගරික කමිටුවේ දූත කණ්ඩායම : මැයි 24** |
| තිරුවානාගල් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් කෙරෙහි උනන්දුවක් දැක්වීය. |
| **ජපානයේ මරුබෙනි ඉන්දියා පෞද්ගලික සමාගමේ දූත කණ්ඩායම : මැයි 31** |
| PSRU/LNG බෙදාහැරීම/තෙල් ටැංකි වැනි බලශක්ති අංශය කෙරෙහි උනන්දුවක් දැක්වීය. මහා නගර, වාණිජ සම්පත්, සංවර්ධන හා ප්‍රවාහන හා ගුවන් සේවා අමාතංශ සමඟ සාකච්ජා සංවිධානය කරනු ලැබීය. |
| **චීනයේ ෂෙන් යැන් නාගරික රජයේ නියෝජිතයින් : ජූනි 01** |
| තේමා උද්‍යාන සංචාරක කර්මාන්තය ආශ්‍රිත ව්‍යාපෘති කෙරෙහි උනන්දුවක් දැක්විය. |
| **චීනයේ පුජියාන් හා ලියානින් පළාත් වෙතින් ව්‍යාපාරික දූත කණ්ඩායම. :** |
| සංචාරක කර්මාන්තය, නිෂ්පාදනය හා සේවා අංශය කෙරෙහි උනන්දුවක් දැක්විය. |
| **ඉන්දියාවේ ඉන්දීය කර්මාන්ත කොන්ෆෙඩරේෂන් : ජූනි 29** |
| ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය මගින් සංවිධානය කරනු ලැබූ “Sri Lanka and Business Conclave” සඳහා දූත කණ්ඩායම සහභාගි වූ අතර ආයෝජන මණ්ඩල සභාපතිවරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමුවිය. කෘෂි කර්මාන්තය/පිරි සැකසුම/IT/BPO, උසස් අධ්‍යාපන, සංචාරක, විවේක හා LNG අංශ කෙරෙහි උනන්දුවක් දැක්වීය. |
| **රොජානා කාර්මික උද්‍යාන රාජ්‍ය සමාගම : අගෝස්තු 21** |
| 2017 පෙබරවාරි මාසයේදී තායිලන්ත සංචාරය පසුව ආයෝජන මණ්ඩලය සමඟ මිල්ලනිය කාර්මික උද්‍යානයේ කළමනාකරණය සඳහා අත්සන් කිරීම සඳහා. |
| **චීනයේ ෂේජියැන්ෆ් පළාත් ඩොන්ග් යැන් නගර Oriental Business Platfrom දූත කණ්ඩායම : 2017 සැප්තැම්බර් 05** |
| නිවාස, සංචාරක, හෝටල්, මහල් නිවාස, සාප්පු සංකීර්ණ, වෙළඳ හා කෘෂිකාර්මික අංශයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දැක්වීය. |
| **චීනයේ හොන්ෂු ව්‍යාපාරික කවුන්සිල දූත කණ්ඩායම : 2017 සැප්තැම්බර් 05** |
| නිවාස, සංචාරක, හෝටල්, මහල් නිවාස, වෙළඳ හා කෘෂිකාර්මික අංශයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දැක්වීය. |
| **KOIMA දූත කණ්ඩායම (කොරියාව) : 2017 සැප්තැම්බර් 06** |
| කොළඹ හිල්ටන් හෝටලයේ ව්‍යාපාරික සංසදය හා බී ටු බී වැඩසටහන |
| **චීනයේ ජින් හු නගර දූත කණ්ඩායම : 2017 සැප්තැම්බර් 19** |
| කරුණු සොයා බැලීමේ දූත මෙහෙය. |
| **චීනයේ සිනෝෂයින් දූත කණ්ඩායම : 2017 දෙසැම්බර් 17** |
| කෘෂිකාර්මික හා පාරිසරික අංශවල ආයෝජනය කිරීමට උනන්දුවක් දැක්වීය. |
| **චීනයේ ක්විංහයි පළාතේ දූත කණ්ඩායම : 2017 දෙසැම්බර් 21** |
| කෘෂිකාර්මික, නිවාස හා කාර්මික අංශයේ ආයෝජනය කිරීමට උනන්දුවක් දැක්වීය. |

## 2. පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව

### කාර්යයන්

පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය විසින් ඍජු විදේශ ආයෝජන වලට අදාල වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා හා උපදේශන ඉදිරිපත් කරනු ලබන අතර එය ආයෝජනවලට අදාල ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වේගවත් කරන ප්‍රධාන සාධකයද වේ. මෙම සංදර්භය තුල ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික වාතාවරණය වැඩිදියුණු කිරීමෙහිලා රජයට සහයදීම සඳහා විවිධ ප්‍රතිපත්ත, නීති හා ක්‍රියාපරිපාටි සඳහා වැඩිදියුණු කිරීම් යෝජනා කිරීම හා ප්‍රතිපත්ති පර්යේෂණ සිදුකිරීම සඳහා මෙම අංශය වගකියන අතර එමගින් අවශ්‍ය කරන විදේශ හා දේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීම සිදුකෙරේ.

**ප්‍රගතිය.**

- ලෝක බැංකුවේ ආයෝජන ප්‍රවර්ධන දූත කණ්ඩායම මගින් ලබා දෙනු ලැබූ තාක්ෂණ සහය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 2017-2020 සංයුක්ත සැලැස්ම වැඩි දියුණු කිරීම කෙරෙහි 2017 වසරේ ක්‍රියාකාරකම් වලදී මූලික අවධානය යොමු විය.

- දැනට සිටින හා විභව්‍ය ආයෝජකයින් සඳහා 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනත හා 2017 අංක 12 දරණ විදේශ හුවමාරු පනත යෙදවීම අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව පුමුඛ කාර්ය භාරයක් ඉටු කරනු ලැබූ අතර නව අභිප්‍රේරක පාලනය පිළිබඳව ඉදිරිපත් කිරීම් හා සාරාංශගත ලේඛන මගින් ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය හා ආයෝජකයින් අතර දැනුවත්භාවයක් ඇති කරනු ලැබීය.

- ආයෝජන මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට සමගාමීව, ලෝක බැංකුවේ තාක්ෂණික සහය ඇතිව "ආයෝජන ප්‍රවර්ධන සහතිකකරණ වැඩසටහන - IPCP" යන මැයෙන් හැකියාවන් ගොඩ නැගීමේ වැඩසටහනක් සංවිධානය කිරීමේදී දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරනු ලැබීය.

- තවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වෙනත් දෙපාර්තමේන්තුවලද සහයෝගය ඇතිව ආයෝජන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීම සඳහා වගකිව යුතු වන්නේ මෙම දෙපාර්තමේන්තුවයි.

- පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන අංශය මගින් පහත දැක්වෙන කාර්යන්හිද නිරත විය.
  - "Why Sri Lanka has failed to achieve it's FDI targets?, Prominent Reasons and Corrective Measures" යන මැයෙන් ධවල පත්‍රිකාවක් පිළියෙල කිරීම.
  - ආයෝජන ප්‍රවර්ධනය සඳහා ප්‍රමුඛ අංශ හඳුනා ගැනීම හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන හාවඩ් විශ්ව විද්‍යාල මධ්‍යස්ථානයේ සහයෝගීතාවය ඇතිව "ආයෝජන හා අපනයන ප්‍රවර්ධනය සඳහා ඉලක්කගත අංශ" යන මාතෘකාව යටතේ විස්තරාත්මක වාර්තාවක් පිළියෙල කිරීම.
  - විදේශ ආයෝජන ප්‍රවර්ධනය හා ආරක්ෂාව සඳහා ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම්, නිදහස් වෙළඳ ගිවිසුම් හා විස්තීර්ණ ආර්ථික හවුල්කාරිත්ව ගිවිසුම් ඇතුළුව ජාත්‍යන්තර ආයෝජන ගිවිසුම් කෙටුම්පත් කිරීම/සාකච්ඡා කිරීම.
  - දෙරට අතර වෙළඳ හා ආයෝජන සබඳතා විශ්ලේෂණය කිරීම මගින් විවිධ රටවල් (ඕස්ට්‍රේලියාව, දකුණු අප්‍රිකාව, රුසියාව, වියට්නාමය, චීනය, ජපානය, කටාර්, සිංගප්පූරුව, ස්විට්සර්ලන්තය හා දකුණු කොරියාව) ප්‍රමුඛ කර ගනිමින් විවිධ වැඩසටහන් පිළියෙල කිරීම.
  - අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන් සඳහා තොරතුරු බෙදා හැරීමේ කාර්යය සිදුකිරීම හා කළමනාකරණ තොරතුරු පද්ධතිය (MIS) මගින් ආයෝජන හා සම්බන්ධ දත්ත ලබාදීම.
  - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ප්‍රධාන කාර්යසාධන දර්ශක පිළිබඳ යාවත්කාලීන කරන ලද දත්ත ලබා ගැනීම සඳහා කාර්තුමය පදනමින් ඍජු විදේශ ආයෝජන සමීක්ෂණයක් සිදු කිරීම.

## 3. ආයෝජක සේවා දෙපාර්තමේන්තුව

### කාර්යයන්

ආයෝජක සේවා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ආනයන හා අපනයන ක්ෂේත්‍රයන්හි ලියාපදිංචි වූ ආයෝජකයන් සඳහා පසු සත්කාරක සේවා පහසුකම් සපයනු ලැබේ. නැව්බඩු සත්‍යාපන මධ්‍යස්ථාන 09ට අමතරව ඉහත සේවා සැපයීම සඳහා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ 06 වන මහලේ, කොළඹ, කටුනායක, බියගම, කොග්ගල අපනයන සැකසුම් කලාපවල හා මහනුවර කාර්මික උද්‍යානයේ ආයෝජන සේවා මධ්‍යස්ථාන පහක් ඇත.

ආයෝජක සේවා අංශය මගින් සපයන සේවා

- ආනයන/අපනයන ලේඛණ පිළියෙල කිරීම.
- ආනයන/අපනයන නැව්භාණ්ඩ සත්‍යාපනය කිරීම.
- යුරෝපීය හවුලට අයත් රටවල්වලට අපනයනය කරන රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සඳහා සම්භවය පිලිබඳ සහතිකය නිකුත් කිරීම.
- බන්ධිත ගුදම් වලින් භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම.
- උපකොන්ත්‍රාත්තු, පැවරුම්, දේශීය වෙළඳාම හා අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සඳහා ණය ලබාගැනීමට අනුමැතිය ලබාදීම.
- භාණ්ඩ ප්‍රතිඅපනයනය හා ප්‍රතිආනයනය සඳහා අනුමැතිය දීම.
- ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායන් මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් රජයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු.
- වක්‍ර අපනයනයන් සඳහා GRN සඳහා අනුමත කිරීමේ ක්‍රියාවලිය.
- තොරතුරු තාක්ෂණ/ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා වෙබ් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- වෙනත් රටවල පුද්ගලයන්ට වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත නිර්දේශ ලබාදීම. (අපනයන සැකසුම් කලාප වල ව්‍යවසායන් සඳහා පමණක්)










*මූලාශයः ආයෝජක සේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

## 4. ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව ආයෝජන ක්ෂේත්‍රයන් හඳුනාගැනීමේදී හා අයදුම්පත් භාරගන්නා අවධියේ සිට ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ක්‍රියාත්මකව ඇතිතෙක් අඛණ්ඩව පහසුකම් සලසමින් වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි.

එමගින් ව්‍යාපෘති යෝජනා ඇගයීම මෙන්ම ආයෝජන මණ්ඩලයේ අරමුණු හා රජයේ ආර්ථික ඉලක්ක ළඟාකර ගැනීම සඳහා විදේශීය හා දේශීය ආයෝජකයින් ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්ති හා නියෝග සකස් කිරීම සඳහා වගකිව යුතුවේ.

රජයේ වත්මන් ප්‍රතිපත්තිය අනුව ආයෝජන ප්‍රවර්ධනය හා ආයෝජන මණ්ඩලයේ අරමුණු ළඟාකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව හඳුනාගත් අංශ අනුව ව්‍යුහගත කර ඇත.

| | | |
|---|---|---|
| දැණුම පාදක සේවා | - | IT/BPO/KPO/ උසස් අධ්‍යාපන/ වෘත්තීය පුහුණු / පර්යේෂණ හා සංවර්ධන |
| සේවාවන් | - | මධ්‍යස්ථාන/ සේවා අපනයනය/ වෙළඳ මධ්‍යස්ථාන (ඇඟළුම් හැර)/ සේවා හා ගුදම ගතකිරීම්/ කලාපීය මෙහෙයුම් ප්‍රධාන කාර්යාල |
| නිෂ්පාදන | - | ඇඟළුම් හැර සියළු නිෂ්පාදන ව්‍යාපෘති. |
| ඇඟළුම් | - | ඇඟළුම් හා රෙදිපිළි ඇතුළු ඇඟළුම් ආශ්‍රිත වෙළඳ මධ්‍යස්ථාන |
| යටිතල පහසුකම් | - | මහල් නිවාස/ නිවාස හා නාගරික සංවර්ධන/මිශ්‍ර සංවර්ධන (හෝටල්, සේවා සහිත මහල් නිවාස හා වෙනත් සේවාවන්)/රෝහල්/මාර්ග සංවර්ධන/ගුවන් තොටුපළ/වරාය/ කාර්මික කලාප |
| සංචාරක හා විවේක | - | හෝටල්/ විලාස්/ ජල උද්‍යාන/ තේමා උද්‍යාන/ වික්‍රමාන්විත සංචාරක කර්මාන්තය/ගුවන් සේවා/ මිශ්‍ර සංවර්ධන (හෝටල්, සේවා සහිත මහල් නිවාස) |
| උපයෝගිතාවන් | - | දුරකථන සන්නිවේදන / විදුලිබල හා බලශක්ති / අපද්‍රව්‍ය කළමනාකරණය/ ජන සන්නිවේදනය / ජල කළමනාකරණය |
| කෘෂිකර්මාන්තය | - | කෘෂි පිරිසැකසුම් කිරීම / කිරි / වගාවන්/පශු සම්පත්/ මිරිදිය ධීවර කර්මාන්තය / ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය / ආහාර පිරිසැකසුම් කිරීම |

### කාර්යයන්

1. ආයෝජන මණ්ඩලයේ නියෝගයන්ට, ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ලේඛණ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති වලට අනුව ආයෝජන යෝජනා ඇගයීම.

2. අනුමැතිය ලබාදීමට පෙර ව්‍යාපෘතියට අදාල වන ජාතික ප්‍රතිපත්ති මත පදනම්ව අවශ්‍ය කරන නිර්දේශ/අදහස් ලබාගැනීම සඳහා අදාල රේඛීය අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ/සභාපතිවරයාගේ/අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගැනීම සඳහා ව්‍යාපෘති යෝජනා සඳහා නිර්දේශ ලබාදීම.

4. ආයෝජන මණ්ඩල නීතියේ බී උපලේඛණයේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති සඳහා රේගු බදු හා වෙනත් බදු සහන ලබාගැනීම සඳහා ව්‍යාපෘතිවලට පහසුකම් සැලසීම.

5. ව්‍යාපාරයේ විෂය පථය වෙනස්කිරීම සඳහා අනුමැතිය ලබාදීම.

6. පිහිටීම, නිෂ්පාදන හා ක්‍රියාකාරකම් ආදිය හම්බන්ධ පුළුල් කිරීම් සඳහා අනුමැතිය ලබාදීම.

7. රේගුවේ විමසුම්, කාර්මික සබඳතා ගැටළු වැනි ක්‍රියාත්මක වීමේදී ඇතිවන ගැටළු විසඳීම හා ඒ සඳහා මැදිහත්වීම.

8. ඍජු විදේශ ආයෝජන පුරෝකථනයන් සකස් කිරීම.

9. වෙනත් රටවල පුරවැසියන් (ආයෝජකයන් හා සේවකයින්) සඳහා වීසා නිර්දේශ කිරීම.

10. ආයෝජන හා අදාල ගැටළුවලට විසඳුම් ලබාදීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය, ව්‍යාපාර පහසු කිරීමේ සංසදය වැනි ආයෝජන හා සම්බන්ධ විවිධ සංසද සඳහා සහභාගිවීම

11. මුදල් අමාත්‍යාංශ, වෙනත් රේඛීය අමාත්‍යාංශ හා විවිධ අංශ සඳහා පත්කරන ලද අමාත්‍ය මණ්ඩල උපකමිටු සමඟ ප්‍රතිපත්ති සකස් කිරීමේ කමිටුවලට සහභාගිවීම.

12. නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, ශ්‍රී ලංකා රේගුව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, ඉඩම් අමාත්‍යාංශය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ආදී ආයතනවල අනුමැතිය ලබා ගැනීමට පෙර සියළු දෙපාර්තමේන්තු රේඛීය අමාත්‍යාංශ සමඟ සන්නිවේදනය හා සම්බන්ධීකරණය කිරීම.

13. නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන ඇතුළු විවිධ රාජ්‍ය ආයතන, ශ්‍රී ලංකා රේගුව, හා වෙනත් රාජ්‍ය ආයතන මගින් සිදුකරනු ලබන විමසීම් සඳහා සහභාගිවීම හා ප්‍රතිචාර දැක්වීම.

**ප්‍රගතිය**

නව ව්‍යාපෘති

| | ව්‍යාපෘති සංඛ්‍යාව | යෝජිත ආයෝජනය | | රැකියා උත්පාදනය |
|---|---|---|---|---|
| | | විදේශීය (රු.මිලි) | දේශීය (රු.මිලි) | |
| ලැබූ නව ව්‍යාපෘති යෝජනා | 101 | 592,555 | 181,064 | 20,969 |
| අනුමත ව්‍යාපෘති | 87 | 436,189 | 154,098 | 18,680 |
| ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති | 55 | 301,620 | 136,338 | 13,764 |

ව්‍යාපෘති පුළුල්කිරීම්

| | ව්‍යාපෘති සංඛ්‍යාව | යෝජිත ආයෝජනය | | රැකියා උත්පාදනය |
|---|---|---|---|---|
| | | විදේශීය (රු.මිලි) | දේශීය (රු.මිලි) | |
| ලැබූ නව ව්‍යාපෘති ව්‍යාපෘති පුළුල්කිරීම් යෝජනා | 60 | 38,710 | 102,198 | 21,913 |
| අනුමත ව්‍යාපෘති පුළුල්කිරීම් (පසුගිය වසරේ ලැබුනු යෝජනා ද ඇතුළුව) | 52 | 16,570 | 73,118 | 17,775 |
| ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති | 47 | 6,342 | 45,082 | 15,989 |

## 5. ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය වන්නේ ආයෝජන මණ්ඩල ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි සපුරාලමින් වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපෘතිවල කාර්යසාධනය පරීක්ෂාකර බැලීමවේ. වාණිජ මෙහෙයුම් සිදුකෙරෙන ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපෘතිවල ව්‍යාපෘති චක්‍රය මගින් ආවරණය වන දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය හා ස්ථාවර ක්‍රියාකාරකම් මෙයට ඇතුලත්වේ.

ආයෝජන මණ්ඩල නීතියේ 16 හා 17 වන වගන්ති යටතේ අනුමත සමාගම් පිළිබඳව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ද්විවාර්ෂික කාර්යසාධන ප්‍රකාශන හා එකී ව්‍යාපෘති සම්බන්ධයෙන් වන රැකියා නියුක්තිය පිළිබඳ සංඛ්‍යා ලේඛණ වැනි කාලීන තොරතුරු එකතුවක් මගින් පරීක්ෂා කෙරේ.

බදු සහන සඳහා සුදුසුකම් ලත් සමාගම් සඳහා බදු සහතික නිකුත් කිරීම, ව්‍යාපෘති චක්‍රය අවසන් කර ඇති හා ආයෝජන මණ්ඩලයේ කොන්දේසි වලට අනුකූලව කටයුතු නොකරන ව්‍යාපෘති වල ගිවිසුම් නිසියාකාරයෙන් අවසන් කිරීම, අදාල දෙපාර්තමේන්තු මගින් තීරණ ගැනීමට අවශ්‍ය වන කාර්යසාධන වාර්තා ලබාදීම සඳහා ආයෝජන මණ්ඩල නීතියේ 16 හා 17 වන වගන්ති යටතේ ව්‍යාපෘති පරීක්ෂා කිරීම හා අවසන් කරනු ලැබූ ව්‍යාපෘති සඳහා එම ව්‍යාපෘති වලට ලබා දී තිබූ FCBU පහසුකම් ඉවත් කර ගැනීම සඳහා වාණිජ බැංකු වලට එකී ගිවිසුම් අවසන්ව ඇති ව්‍යාපෘති පිළිබඳව කාර්තුමය වශයෙන් වාර්තා කිරීම දෙපාර්තමේන්තුව මගින් කටයුතු කරනු ලබන ප්‍රධාන ක්ෂේත්‍රයන්ට ඇතුලත්ය.

**ප්‍රගතිය**

- සමාලෝචනයට ලක් වූ කාලය තුලදී අදාල ගිවිසුම් වල දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව කටයුතු කල ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සඳහා වාර්ෂික බදු සහතික 122 ක් නිකුත් කරනු ලැබීය.
- 2017 වසරේදී සමාගම් මගින් එකතු කරනු ලැබූ මුළු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව 1477 කි වසර තුලදී සංකීර්ණ අධීක්ෂණ සැලසුමක් අනුගමනය කරමින් සිදු කරනු ලැබූ සම්පූර්ණ සමාගම් පරීක්ෂා කිරීම් සංඛ්‍යාව 112 දක්වා ඉහල නැග ඇත.
- සමාලෝචනයට ලක්වන කාලය තුලදී මූල්‍යමය ගැටළු, වෙළඳපල සොයා ගැනීමේ හා ඉඩම් සපයා ගැනීමේ දුෂ්කරතා වැනි සමාගම මුහුණදෙන ගැටළු ගිවිසුමේ නියමයන් හා කොන්දේසි වලට අනුකූල නොවීම වැනි කරුණු හේතුවෙන් ගිවිසුම් 154ක් අවසන් කිරීමට කටයුතු කිරිම මගින් අක්‍රිය ව්‍යාපෘති වල බාධක ඉවත් කර නිසි පරිදි ක්‍රියාත්මක කරනු ලැබීය. ව්‍යාපෘති අවසන් කිරීම් විභව්‍ය ආයෝජකයින් විසින් වත්කම් අත්පත් කර ගැනීම හා සමාගම් ඒකාබද්ධවීමේ හෝ ප්‍රතිඵලයක් ලෙස ද ව්‍යාපෘති අවසන් කිරීම සිදු වු බව සඳහන් කළ යුතුය.

## 6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ "ආයෝජන මණ්ඩලය සමග ඇති කරගෙන ඇති ගිවිසුම් වල දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ ගිවිසුම් වලට අනුකූලව ව්‍යාපෘති සඳහා සාර්ථක ලෙස පහසුකම් සැලසීම තහවුරු කිරීම" වේ.

- ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් පසුව සමාගම්වල ඉල්ලීම් පරිදි කාලය දීර්ඝ කිරීමේ ලිපි නිකුත් කිරීම.
- ක්‍රියාත්මක කිරීම සම්පූර්ණ කිරීමට නොහැකි ව්‍යාපෘති හඳුනාගැනීම හා ව්‍යාපෘති ඇගයීම් දෙපාර්තමේන්තුවට ගිවිසුම් අවසන් කිරීම නිර්දේශ කිරීම.
- ව්‍යාපෘතියේ තත්වය වෙනස්වීම හඳුනාගෙන කළමනාකරණ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.

**ප්‍රගතිය**

ව්‍යාපෘති 84 ක් වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම දක්වා ක්‍රියාත්මක කරනු ලැබීය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලය දීර්ඝ කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට පත්‍රිකා 155 ක් ඉදිරිපත් කරන ලදී. ව්‍යාපෘතිවල ප්‍රගතිය තහවුරු කර ගැනීම සඳහා ස්ථානීය පරීක්ෂා කිරීම් 80 ක් සිදු කරන ලදී.

ව්‍යාපෘති සඳහා වන අවහිරතා ඉවත් කර ආයෝජකයින් සඳහා පහසුකම් සලසා ඒවායේ කාර්යයන් කඩිනම් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ උපදේශක පාස්කරලිංගම් මහතාගේ සභාපතිත්වයෙන් යුතුව ගරු අග්‍රාමාත්‍යවරයා විසින් පත් කර ඇති "ආයෝජන අනුමත කිරීම් සඳහා පහසුකම් සැලසීමේ කමිටුව," (IAFC) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලබයි.

ව්‍යාපෘති පිළිබඳව ආයෝජන මණ්ඩල නිලධාරීන් හොඳින් හුරුපුරුදු වීමට හා ඒවා බාධාවකින් තොරව ක්‍රියාත්මකවීම සඳහා දෙපාර්තමේන්තුව මගින් වෙනත් දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් ද සමගින් ආරම්භක රැස්වීම් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. ආයෝජකයින් සමග ව්‍යාපෘතියේ කාර්යසාධනය සාකච්ඡා කිරීම සඳහා ව්‍යාපෘති 44 ක් පිළිබඳව රැස්වීම් පවත්වා ඇත.

## 7. නීති දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ආයෝජන සම්බන්ධයෙන් වන සියළු නෛතික කරුණු සම්බන්ධයෙන් නීති දෙපාර්තමේන්තුව මගින් ආයෝජන මණ්ඩලයට උපදෙස් හා සහය ලබාදේ. එමඟින් ආයෝජන මණ්ඩලයට මෙන්ම ආයෝජකයින්ටද ආයෝජන සඳහා අවශ්‍ය කරන වෘත්තීමය උපදෙස්/සේවාවන් ක්‍රියාත්මක කිරීමේ නෛතික සහය ලබාදීම සිදු කෙරේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය හා 2018 අංක 14 දරණ උපාය මාර්ගික සංවර්ධක ව්‍යාපෘති (සංශෝධිත) පනත යටතේ අනුමත ව්‍යවසායන්ගේ ව්‍යාපෘති සඳහා ආයෝජන කිරීමේදී හා ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේදී අදාල නෛතික පාලනය සම්බන්ධයෙන් ආයෝජකයින්ට අදාල සේවා සැපයීම මෙයට ඇතුලත් වේ.

**ප්‍රගතිය**

මෙම කාලය තුලදී ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ නව හවුල් ව්‍යාපාර ස්ථාපනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ මූලික ගිවිසුම් 55 ක් අත්සන් කර ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ප්‍රධාන ආයෝජකයින් වන්නේ,

- රිජිඩ් ටයර් කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් - ඩිල්රෝසා 9 යාර්ඩ්ස් ඇපරල් (ප්‍රයිවට්) ලිමිටඩ්.
- හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්.
- හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
- බෙස්ට් පැසිෆික් ටෙක්ස්ටයිල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.

මීට අමතරව, දැනට පවතින ආයෝජන මණ්ඩල ව්‍යාපෘති පුළුල් කිරිම, ව්‍යාපාරික විෂය පථය වෙනස් කිරීම, ප්‍රතිස්ථාපනය, අත්පත් කර ගැනීම හා ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් පරිපූරක ගිවිසුම් 225 ක් අත්සන් කරනු ලැබීය.

සැලකිය යුතු ආයෝජනයක් හෝ රැකියා උත්පාදනයක් සහිත පහත දැක්වෙන ව්‍යාපෘති මීට අයත් වේ.

- ඇන්සල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්.
- MAS ෆැබ්රික් පාක් (ප්‍රයිවට්) ලිමිටඩ්. (ගිරිඋල්ල පුළුල් කිරීම - පෙර කාබුල් ලේස් සමාගම පිහිටි ස්ථානය) ලොජිවිස් ලිමිටඩ්.
- සෙරන්ඩිබ් ෆලර් මිල්ස් (ප්‍රයිවට්) මිලිටඩ්.
- ෆියුචර් එනජි (ප්‍රයිවට්) ලිමිටඩ්.

තවද නීති දෙපාර්තමේන්තුව මගින් 2018 අංක 14 දරණ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධිත) පනතේ දක්වා ඇති ක්‍රමවේදය සම්පූර්ණ කර ඇති, අතර හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් සර්විසස් කම්පණි (ප්‍රයිවට්) ලිමිටඩ් සඳහා වන මූලික ගිවිසුම් ක්‍රියාත්මක කරනු ලැබීය.

## 8. තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් කළමනාකරණය කරනු ලබන අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යාන වල යටිතල පහසුකම් සංවර්ධනය හා සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්ම සම්පූර්ණයෙන් පාලනය කිරීම සඳහා තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව වගකිව යුතු වේ. මෙහි ප්‍රධාන කාර්යයන් වන්නේ නව ආයෝජන කලාප ස්ථාපනය කිරීම, නව ආයෝජන කලාප ස්ථාපනය කිරීම, අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් ඉදිකිරීම, මෙහෙයුම් කිරීම, නඩත්තු කිරීම හා තීරණය කිරීම සඳහා තාක්ෂණික යෙදවුම් සැපයීම, නව ආයෝජන ව්‍යාපෘති සඳහා ආයෝජකයින්ට ලබා ගත හැකි ඉඩම් පිළිබඳව ප්‍රචාරය කිරීම හා රජයට භාර දී ඇති ඉඩම් පවරා දීමේදී අදාල බලධාරින්ට සහයදීම.

**ප්‍රගතිය**

1. 2017 වසරේදී සැකසුම් කලාපවල/කාර්මික උද්‍යාන වල පවත්නා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් රු.මිලි. 377.47ක වියදමක් දරනු ලැබීය. සමාලෝචනයට ලක්වන වසර තුලදී පොදු අපජල පවිත්‍රාගාර, පවත්නා මාර්ග ජාල, ගොඩනැගිලි, ජල සැපයුම, කලාප වටා ඇති මායිම් වැටවල් ආදිය ඉදිකිරීම් හා වැඩි දියුණු කිරීම් සඳහා විශාල පරිමාණ පුළුල් කිරීම්/වැඩි දියුණු කිරීම් ආරම්භ කර සිදු කරගෙන යනු ලැබේ.

2. අභ්‍යන්තර මාර්ග ඉදිකිරීම්, ජල ගබඩා සඳහා යාන්ත්‍රික හා විද්‍යුත් උපකරණ ස්ථාපනය කිරීම මගින් වගවත්ත කාර්මික කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය වැනි නව කලාප සංවර්ධනය සඳහා රු.මිලි. 55.53 ක වියදමක් දැරීය. අභ්‍යන්තර මාර්ග ජාලය පුළුල් කිරීම, විදුලිබල සැපයුම, ජල සැපයුම, ඒ වටා වැටවල් ඉදි කිරීම ආදි කටයුතු දක්වා නව ආයෝජන කලාප සඳහා සුදුසු ස්ථාන හඳුනා ගැනීමේ මූලික විමර්ශනයන් අඛණ්ඩව සිදුවිය.

   2017 ක්‍රියාකාරි සැලැස්ම යටතේ රු.මිලි. 433.0 ක් යොදා ගනු ලැබීය.

## 9. කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති අපනයන සැකසුම් කලාප/කාර්මික උද්‍යානවල කාර්යයන් සමස්ත සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම සඳහා කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව වගකිව යුතු වේ. දෙපාර්තමේන්තුව මගින් කලාප හා සම්බන්ධ කළමනාකරණ තොරතුරු සපයන අතර කලාප වල තාක්ෂණික හා ක්‍රියාත්මක කිරීමේ ගැටළු විසඳීම සඳහා සහය වේ. එමගින් පාරිසරික ගැටළුල ඉඩම් පිළිබඳ ගැටළු විසඳීම සඳහා මගපෙන්වනු ලබන අතර වඩා හොඳ ඉදිරියක් සඳහා කලාප වල ව්‍යවසායන්ට පහසුකම් සලසනු ලබේ. ඊට අමතරව දෙපාර්තමේන්තුව මගින් සම්පත් අවශ්‍යතාවය තක්සේරු කිරීම හා කලාප/උද්‍යාන සඳහා සම්පත් වෙන්කර දීම සඳහා මැදිහත් වේ.

**ප්‍රගතිය**

- ඉඩම් සඳහා තරඟකාරි ලංසු කැඳවීමේ නව ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබූ අතර ආයෝජකයින්ට ඉඩම් වෙන්කර දීම මඟින් ඉහල ආදායමක් ලබා ගැනීමට හැකි විය.
- කටුනායක, බියගම හා සීතාවක අපනයන සැකසුම් කලාප වැනි ප්‍රධාන අපනයන කලාප වල ඉඩම් පරිහරණය කර ඇති ප්‍රමාණය සමාන්‍යයෙන් 90%ක් ඉක්මවයි. වෙනත් ආයෝජන කලාප වලද ඉතිරිව ඇති ඉඩම් සඳහා ඉතා ඉහල ඉල්ලුමක් පවතී. ආයෝජන කලාප වල ඉඩම් වලට ඇති ඉල්ලුම සපුරාලීම සඳහා මීරිගම අපනයන සැකසුම් කලාපයේ B කලාපයේ ඉඩම්, අවශ්‍ය කරන යටිතල පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට පියවර ගනු ලැබීය.
- නව සේවකයින් ආකර්ෂණය කර ගැනීම හා දැනට සිටින සේවකයින් රඳවා ගැනීම සැලකීමේදී කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව ඒ සඳහා විශාල අවධානයක් යොමු කළ අතර විවිධ ආයතන සඳහා නවක සේවකයින් ආකර්ශනය කර ගැනීම සඳහා වෙළඳ ප්‍රචාරණ ක්‍රමවේදයක් මෙන්ම දැනුවත් කිරීමේ වැඩසටහන් ද හඳුන්වා දෙනු ලැබීය.
- ආයෝජන කලාපයන්හි ව්‍යවසායන්වල ආනයන/අපනයන කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩි වී ඇති අතර නව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම හා ආයෝජන කලාපවල සිටින ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම මඟින් සේවා පහසුකම් වැඩි දියුණු කර ඇත.
- 2017 දී සියළු කලාප වල සැලකියයුතු ගිනි අනතුරු හා කම්කරු ආරවුල් වාර්තා වී නොමැත.

## 10. පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ආයෝජන මණ්ඩලය යටතේ වන ව්‍යාපෘති සම්බන්ධයෙන් මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සමඟ සාකච්ඡා කර එහි අනුමැතිය ඇතිව පාරිසරික ආරක්ෂාව හා කළමනාකරණය ඇතිව පාරිසරික ආරක්ෂාව හා කළමනාකරණය සම්බන්ධ කාර්යයන් සිදුකිරීම පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරේ. ව්‍යාපෘති සඳහා පාරිසරික අනුමැතින් ලබාදීම, පාරිසරික ආරක්ෂක බලපත්‍ර නිකුත් කිරීම, පාරිසරික ගැටළු පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා ඒවා විසඳීම හා ස්වභාවික සම්පත් කළමනාකරණය හා පරිසර දූෂණය පාලනය පිළිබඳ කටයුතු වලදී වෙනත් ආයතන, සංවිධාන හා දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධ වීම පාරිසරික කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යයන් වේ.

**ප්‍රගතිය**

| කාර්යය | සංඛ්‍යාව |
|---|---|
| 1. (අ)ව්‍යාපෘති සඳහා ලබාදෙනු ලැබූ පාරිසරික අනුමැතීන් සංඛ්‍යාව | 63 |
| (ආ) ව්‍යාපෘති පුළුල් කිරීම/ප්‍රතිස්ථාපනය සඳහා ලබාදෙනු ලැබූ පාරිසරික අනුමැතීන් | 31 |
| 2. නිකුත් කරනු ලැබූ/අලුත් කරනු ලැබූ EPL සංඛ්‍යාව | 979 |
| 3. විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සඳහා යෝජිත ස්ථාන සම්බන්ධයෙන් නිකුත් කරන ලද ERR සංඛ්‍යාව | 99 |
| 4. පාරිසරික ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරන ලද හා විසඳන ලද පැමිණිලි සංඛ්‍යාව | 107 |
| 5. පාරිසරික අධීක්ෂණය | |
| (අ) කර්මාන්ත වලින් එකතු කරන ලද අපජල සාම්පල<br>(ආ) පොදු ජල පවිත්‍රාගාර වලින් එකතු කරන ලද අපජල සාම්පල සංඛ්‍යාව | 1,164 |
| (ඇ) ජල සාම්පල සංඛ්‍යාව | 176 |

ඉහත කාර්යයන්ට අමතරව, ශ්‍රී ලංකාව විසින් පිලිගෙන ඇති පාරිසරික/රසායනික හා සම්බන්ධ පහත දැක්වෙන ජාත්‍යන්තර සම්මුතීන්ට අදාලව පිහිටුවා ඇති ජාතික කමිටුවලද කටයුතු කරනු ලැබීය.

1. බාසල්, ස්ටොක්හෝම් හා මිනමාටා සම්මුතීන් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව.
2. ඕසෝන් ස්තරය හායනය කරන ද්‍රව්‍ය පිළිබඳ මොන්ට්‍රියල් සම්මුතිය.
3. දේශගුණික විපර්යාස පිලිබඳ එක්සත් ජාතීන්ගේ රාමු සම්මුතිය (UNFCCC)
4. මාදක ඖෂධ සහ මනෝවර්තක නීතිවිරෝධී ලෙස ජාවාරම් කිරීමට එරෙහි සම්මුති පනත. පුරෝගාමී පාලන අධිකාරිය මෙහි සභාපතිත්වය දරනු ලබයි.

සියළු ආයෝජන මණ්ඩල ව්‍යාපෘති මෙම ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන බව තහවුරු කෙරේ.

ISO 9001:2008 ප්‍රමිතිය පදනම් කරගත් තත්ව කළමනාකරණ පද්ධතිය යටතේ 2017 වසර සඳහා ලබාදෙනු ලැබූ ඉලක්ක ළඟාකරගනු ලැබීය. මේ යටතේ ආයෝජන මණ්ඩල ව්‍යාපෘති වලින් 98% ක්ම පාරිසරික ආරක්ෂණ බලපත (EPL) ලබාගෙන ඇති බවට තහවුරු කිරීම සඳහා මෙම ඉලක්කය ලබාදී ඇති අතර එම ඉලක්කය ළඟා කරගනු ලැබීය.

පහත සඳහන් තාක්ෂණ ඇගයුම් කමිටු සඳහා ද දෙපාර්තමේන්තුව සහභාගි වූ අතර ඒවායේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදෙනු ලැබීය.

1. අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යාන වලින් පිටත ඇති ඉහළ හා මධ්‍යම මට්ටමේ පරිසර දූෂණ කර්මාන්ත තීරණය කිරීම සඳහා වන කමිටුව
2. බාසල් තාක්ෂණ ඇගයුම් කමිටුව.
3. කාර්මික රසායන කළමනාකරණය සඳහා වන තාක්ෂණ උපදේශන කමිටුව (TACMIC). මෙම තාක්ෂණ ඇගයුම් කමිටු 3 සඳහාම මධ්‍යම පරිසර අධිකාරිය සභාපතිත්වය දරනු ලැබේ.

## 11. ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව, ඉංජිනේරු අනුමත කිරීමේ අංශය හා ඉඩම් හා පහසුකම් සැලසීමේ අංශය යන ප්‍රධාන අංශ දෙකෙන් සමන්විත වේ. ඉංජිනේරු අනුමත කිරීමේ අංශය, ඉදිකිරීම් ස්ථාන සඳහා වන ආයෝජන මණ්ඩලයේ නියාමන හස්තය ලෙස කටයුතු කරන අතර එමගින් පිහිටීම් අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, තත්ව සහතිකකරණය හා 17 වන වගන්තිය අනුව ව්‍යාපෘති වල අනුකූලතාවය සහතික කිරීම යන ප්‍රධාන සේවාවන් හතර ලබාදේ.

ඉඩම් හා පහසුකම් සැලසීමේ අංශය ආයෝජකයින් සඳහා පහත සඳහන් සේවාවන් සැලසීම සඳහා වගකියනු ලැබේ.

- ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා රජයේ ඉඩම් ලබාගැනීමට ආයෝජකයන්ට සහයදීම.
- ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප ඉදිකිරීම සඳහා අවශ්‍ය විටක රජයේ ඉඩම්/පුද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම.
- නව ආයෝජකයන්ගේ ප්‍රයෝජනය සඳහා රජයේ හා පෞද්ගලික ඉඩම් පිළිබඳ ඉඩම් බැංකුවක් පවත්වාගෙන යාම.
- ඉඩම් සම්බන්ධ කරුණුවලදී නීති දෙපාර්තමේන්තුව හා වෙනත් දෙපාර්තමේන්තු සඳහා සහයවීම.

**ප්‍රගතිය**

| | | |
|---|---|---|
| ස්ථාන අනුමත කිරීම් | - | 191 |
| ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම් | - | 173 |
| බඳු නිදහස් නිෂ්කාෂණ | - | 3,737 |
| අනුකූලතා සහතික | - | 60 |

ආයෝජකයන්ගේ ප්‍රයෝජනය සඳහා රජයේ ඉඩම් හා පෞද්ගලික ඉඩම් පිළිබඳ ඉඩම් බැංකුව පවත්වා ගෙනයාම හා යාවත්කාලීන කිරීම.

## 12. කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව මගින් ආයෝජන මණ්ඩල ව්‍යවසායන් තුළ ඉහළ කාර්යක්ෂමතාවයක් හා ඵලදායිතාවයක් සඳහා හේතුවන යහපත් කාර්මික සබඳතා වාතාවරණයක් පවත්වාගෙන යාමේ අත්‍යවශ්‍ය කාර්යය ඉටුකෙරේ. එකී ඉලක්කය ඉටුකර ගැනීම සඳහා කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන කාර්යයන් ඉටුකරනු ලැබේ.

- ආයෝජන මණ්ඩලය යටතේ ඇති ව්‍යවසායන්ගේ කම්කරු කළමනාකරණ සහයෝගිතාවය, කාර්මික සාමය හා සංහිඳියාව හා ඉහළ ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැලසීම.
- ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි කළමනාකරණය හා සේවකයින් සඳහා අවශ්‍ය විට කම්කරු නීති/නියෝග හා කාර්මික සබඳතා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදේශන සේවා සැපයීම.
- අපනයන සැකසුම් කලාප වල ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩල රැකියා සේවා ඒකක හරහා ආයෝජකයන්ට ඔවුන්ගේ ශ්‍රමබලකා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා සහායදීම හා බඳවා ගැනීමේ සහය වැඩසටහන් සංවිධානය කිරීම.

**ප්‍රගතිය**

- වර්ෂ 2017 දී කලාප තුල හා කලාප වලින් පිටත ඇති ආයෝජන මණ්ඩල ව්‍යවසායන් 922 ක කම්කරු විගණන සිදුකර එම විගණනවලදී සොයාගත් අඩුපාඩු/හිඳැස් නිවැරදිකිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබ තිබේ.
- 2017 වසර තුළදී කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව මගින් සේවක සභා 150 ඇතිකිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු ලැබීය.
- 2017 වසරේදී කටුනායක, බියගම, කොග්ගල, වතුපිටිවල අපනයන සැකසුම් කලාපවල හා මහනුවර කාර්මික උද්‍යානයේ වෘත්තීය සමිති නිලධාරීන්ට අදාල කලාපවල ව්‍යවසායන්ගේ සේවය කරන තම සාමාජිකයන් අවශ්‍ය විටක නිදහසේ හා පෞද්ගලිකව හමුවීම සඳහා පහසුකම් සැලසීමේ මධ්‍යස්ථාන 5 ක් ක්‍රියාත්මකව තිබේ.
- 2017 වසර තුළදී අදාල රජයේ නියෝජිතායතන සමඟ සහයෝගීතාවය ඇතිව සමාජ සංවාද, සාමාන්‍ය දැනුවත් කිරීම්, සේවා ස්ථානයේ සහයෝගීතාවය, විනීත සේවා පුරුදු හා සෞඛ්‍යය හා ආරක්ෂාව ආදී විවිධ මාතෘකා ඔස්සේ ආයෝජන මණ්ඩල ව්‍යවසායන්වල සේවකයින් හා කළමනාකරණ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 115 ක් පවත්වනු ලැබීය.
- ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ගේ කාර්මික සාමය හා සංහිඳියාව පවත්වාගෙන යාමේදී එකී ආයතනවල ඇතිවන කුමන හෝ කාර්මික ආරවුලක් විසඳීම සඳහා කාර්මික සබඳතා නිලධාරීන් මැදිහත්වේ. 2017 වසරේදී ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ගේ ඇතිවූ කාර්මික ආරවුල්/වැඩවර්ජන 10 ක් අවශ්‍ය අවස්ථාවලදී කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ඇතිව විසඳනු ලැබීය.
- 2017 වසරේදී රැකියා අපේක්ෂිත පුද්ගලයින් 68,129 දෙනෙක් අපනයන සැකසුම් කලාපවල ඇති රැකියා සේවා ඒකක වල ලියාපදිංචි වී ඇති අතර එයින් 66,801 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා ව්‍යවසායන් වෙත යොමු කරනු ලැබීය. මීට අමතරව, ආයෝජන මණ්ඩල ව්‍යවසායන්ගේ පවතින රැකියා අවස්ථා සඳහා රැකියා අපේක්ෂාකරන්නන් ආකර්ශනය කරගැනීම සඳහා වෙනත් අදාල නියෝජිතායතනවල සහයෝගිතාවය ඇතිව රැකියා පොළවල්/රැකියා සඳහා මඟපෙන්වීමේ වැඩසටහන් සංවිධානය කිරීමටද කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සැලසේ. සමාලෝචනයට ලක්වන කාලය තුළදී රටපුරා රැකියා පොළවල්/රැකියා සඳහා මඟපෙන්වීමේ වැඩසටහන් 14 ක් පවත්වනු ලැබීය.
- පළමු දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසල කටුනායක අපනයන සැකසුම් කලාපය තුල පිහිටුවීමෙන් තම දරුවන් කලාපය තුලම ආරක්ෂිත ස්ථානයක තබාගෙන ඔවුන්ගේ රැකියාවල නියලීමට කැමති සේවකයින් හට විසඳුමක් ලබාදෙන ලද අතර එමගින් රැකියාවලින් අස්වී යන ශ්‍රම බලකාය අඩුකිරීමට හා අළුතෙන් බඳවාගනු ලබන සේවකයින්ට කලාප පිළිබඳ ආකර්ශනීය හැඟීමක් ඇතිකිරීමට සමත්වේ. වසර අවසානයේදී දරුවන් 72 දෙනෙකු සඳහා පහසුකම් සලසනු ලැබූ අතර එයින් 60 දෙනෙකු පෙර පාසල සඳහා ද සහභාගිවේ.

## 13. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් සැලසුම් කිරීම, සකස් කිරීම, වැඩි දියුණු කිරීම, ඇගයීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවා ඇති තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්පත් ප්‍රසම්පාදනය, ස්ථාපනය හා නඩත්තු කිරීම සිදු කෙරේ.

දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදනය සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංග හා දෘඩකාංග සමඟින් සියළු තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම මගින් පරිශීලකයින් සඳහා අඛණ්ඩ සේවාවක් සැපයීමෙන් දිනය පුරාම ආයතනයේ සංයුක්ත පරිගණක ජාලය පවත්වාගෙන යනු ලැබේ.

**ප්‍රගතිය**

- සෘජු විදේශ ආයෝජන පිළිබඳ දත්ත රැස් කිරීමේ අතින් සිදු කරන සංකීර්ණ ක්‍රමවේදය වැලැක්වීම සඳහා දෙපාර්තමේන්තුව මගින් සෘජු විදේශ ආයෝජන සමීක්ෂණ පෝර්ම මාර්ගගතව ඉදිරිපත් කිරීමේ වෙබ් විසඳුමක් වැඩි දියුණු කර ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලැබීය. පද්ධතිය මඟින් ව්‍යවසායන්ට ඔවුන්ගේ සෘජු විදේශ ආයේජන සමීක්ෂණ පෝර්ම ඉදිරිපත් කිරීමට හා ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් වල ප්‍රගතිය මාර්ගගතව අධීක්ෂණය කිරීමට සහයවේ. පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට මාර්ගගතව ඉදිරිපත් කරන ලද සෘජු විදේශ ආයෝජන පොර්ම බලාගත හැකි අතර දත්ත කළමනාකරණ තොරතුරු පද්ධතියට හුවමාරු කිරීමට හැකි වේ.
- ආයෝජන මණ්ඩල ව්‍යවසායන්හි සේවකයින්ගේ හැඳුනුම්පත් සඳහා වන ඉල්ලීම් මාර්ගගතව ඉදිරිපත් කිරීම සඳහා වෙබ් විසඳුමක් නිර්මාණයකර ක්‍රියාත්මක කරනු ලැබීය. ඔවුන්ට ඔවුන්ගේ හැඳුනුම්පත් සඳහා මාර්ගත ඉල්ලීම් ඉදිරිපත් කිරීම් ලබාගෙන ගිණුම් හරහා මාර්ගගතව ගෙවීම් කිරීමේ පහසුකම් ඇත. සේවක හැඳුනුම්පත් නිකුත් කිරීමේදී දැනට අතින් සිදුකරන ක්‍රමවේදය බැහැරකර වඩාත් ක්‍රමවත් හා ස්වයංක්‍රීය වෙබ් විසඳුමක් ලබාදීමට මෙම ක්‍රමය හඳුන්වා දී ඇත.
- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අයෝජන මණ්ඩල නිලධාරීන්ගේ දුරකථන නාමාවලිය සඳහා ජංගම දුරකථන මෘදුකාංගයක් නිර්මාණය කර හඳුන්වා දී ඇත. ආයෝජන මණ්ඩල නිලධාරීන්ට එකී මෘදුකාංගය ඔවුන්ගේ ජංගම දුරකථන සඳහා ඇතුලත් කරගෙන ඕනෑම ජංගම දුරකථන අංකයක් සෙවීමටත්, දුරකථන ඇමතුම් ලබා ගැනීමටත් ඕනෑම ආයෝජන මණ්ඩල නිලධාරියෙකුට ඒ හරහා ඊ මේල් යැවීමටත් හැකිය.
- තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් තොරතුරු තාක්ෂණ නිලධාරීන්ට කාර්යසාධනය අධීක්ෂණය කිරීමට හා ඉලක්ක පස විපරම් කිරීම සඳහා ක්‍රමවේදයක් සැලසුම් කර, වැඩිදියුණු කර ක්‍රියාත්මකකර තිබේ.
- අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සැකසීම හා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් කළමණාකරණය සඳහා පිටතින් ලබාගත් මෘදුකාංග පද්ධතියක් සමගින් නව මෘදුකාංග විසඳුමක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කරනු ලැබීය.
- භාවිතා කරන්නන්ගේ සියළු අවශ්‍යතා සපුරාලමින් හා කළමනාකරණය සඳහා වාර්තා වෙනස් කිරීම හා අසීරු තීරණ ගැනීමේ තොරතුරු ලබාගැනීමට හැකි අයුරින් වීසා පද්ධතිය සඳහා විවිධ වැඩිදියුණු කිරීම් සිදුකරනු ලැබීය.

## 14. මාධ්‍ය හා ප්‍රචාරක දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ආයෝජන මණ්ඩලයේ මාධ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථා, රටේ ව්‍යාපාරික වටපිටාව, පිළිබඳව දැනුවත්භාවය ඇතිකිරීම සඳහා බාහිර සන්නිවේදනය, හා විවිධ ආකාරයේ ප්‍රේක්ෂකයින් සඳහා විවිධ මාධ්‍ය ප්‍රකාශ හරහා ආයතනයේ සාර්ථකත්වය පිළිබඳ ප්‍රචාරය කිරීම සඳහා වගකියනු ලැබේ.

**ප්‍රගතිය**

වසර 2016 දී ආයෝජන මණ්ඩලය මගින් විවිධ ආකාරයේ මාධ්‍ය යොදාගෙන ප්‍රචාරක වැඩසටහන්වල යෙදී ඇත. තවද මුද්‍රිත ප්‍රවර්ධන ද්‍රව්‍ය පිළියෙල කිරීම, ප්‍රේක්ෂකයන් විශාල සංඛ්‍යාවක් සඳහා පණිවිඩ ලබාදීමට වෙළඳ දැන්වීම් පලකිරීම සිදුකරනු ලැබීය.

**සහභාගිවූ අවස්ථා**

මාධ්‍ය දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරනු ලැබූ, සම්බන්ධීකරණය කරනු ලැබූ හා සහභාගිවූ විශේෂ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

සහභාගිවූ අවස්ථා

- කුරුණෑගල අවිස්සාවේල්ල හා මහනුවර රැකියා වෙළඳපල්වල්.

මාධ්‍ය ආවරණ

- යුරෝපීය සංගමය - ශ්‍රී ලංකාව අතර සංවාදය
- ඔක්ස්ෆෝඩ් ව්‍යාපාරික කණ්ඩායම් වාර්තාව එළි දැක්වීම.

මාධ්‍ය සාකච්ජා

- කන්තලේ සීනි සමාගමේ ගිවිසුම අත්සන් කිරීම.
- ඔක්ස්ෆෝඩ් ව්‍යාපාරික කණ්ඩායම් වාර්තාව එළි දැක්වීම.
- රොජානා හා ආයෝජන මණ්ඩලය අතර ගිවිසුම අත්සන් කිරීමේ උත්සවය.

ප්‍රකාශන

- ජනාධිපතිතුමාගේ සංචාරය Pitch book හා brochures (රුසියාව හා ඕස්ට්‍රේලියාව)
- සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව.

පුවත්පත් වාර්තා.

- පුවත්පත් වාර්තා 28 ක් සපයනු ලැබීය.

නිර්මාණය කිරීම්

- ශ්‍රී ලංකා ඕස්ට්‍රේලියා වෙළඳ හා ආයෝජන සබඳතා විස්තර පත්‍රිකාව.
- විදේශකයින් සඳහා ආයෝජන ප්‍රවර්ධන විස්තර පත්‍රිකාව.
- ශ්‍රී ලංකා රුසියානු වෙළඳ හා ආයෝජන සබඳතා විස්තර පත්‍රිකාව.
- ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම රුසියානු විස්තර පත්‍රිකාව.
- ඉදිකිරීම් බලපත්‍ර අනුමත කිරීම සඳහා වන කාලය අඩු කිරීම් විස්තර පත්‍රිකාව.
- බිංගිරිය දැන්වීම් පුවරුව.
- බෝගම්බර දැන්වීම් පුවරුව.
- ආයෝජන මණ්ඩල මාර්ග සංග්‍රහය - ජපාන.
- සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය සඳහා බැනරය
- ඉඩම් නිදහස් කිරීමේ ක්‍රමවේදය.
- ආයෝජන මණ්ඩල දුරකථන නාමාවලිය 2017 සඳහා මුල් පිටුව.

## 15. පරිපාලන දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

පරිපාලන දෙපාර්තමේන්තුව මගින් එහි සේවාදායක දෙපාර්තමේන්තු, ආයෝජන කලාප, හා කලාපීය කාර්යාල සඳහා ද සේවාවන් ලබාදේ.

දෙපාර්තමේන්තුවේ මනා ක්‍රියාකාරිත්වය හා කාර්යක්ෂම මෙහෙයුම සඳහා පහත දැක්වෙන උප ඒකක වලින් සමන්විතවේ.

- ගබඩා හා සැපයුම් ඒකකය
- ප්‍රවාහන ඒකකය
- නඩත්තු ඒකකය
- තැපැල් ඒකකය
- සාමාන්‍ය පරිපාලනය

**ප්‍රගතිය**

- අළුත් මෝටර් රථ තුනක්, SUV රථයක්, බඩල් කැබ් රථ හතරක් හා වෑන් රථයක්, මෝටර් සයිකල් හතරක්, ට්‍රැක්ටරයක් හා ටේලරයක්, ජල බවුසරයක්, 650VA UPS 108 මිලදී ගනු ලැබීය.
- රක්ෂණ උපදේශකවරයා සමඟ ආයෝජන මණ්ඩලයේ දැනට පවතින රක්ෂණ ඔප්පු නැවත ඇගයීම.
- වාර්ෂික වාර්තා (2012 - 2016) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ක්‍රියා කිරීම.
- ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ පිහිටි වෙනත් දෙපාර්තමේන්තුවල යටිතල පහසුකම් වැඩි දියුණු කරනු ලැබීය.
- ආයෝජන මණ්ඩලය සඳහා පරිගණක යන්ත්‍ර 66 ක් මිලදී ගනු ලැබීය.

## 16. මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

ආයතනික හා සේවකයින්ගේ ඉලක්ක ළඟා කර ගැනීමට දායක වන ප්‍රතිපත්ති හා වැඩසටහන් වැඩි දියුණු කරමින් හා ක්‍රියාත්මක කරමින් මණ්ඩලයේ සම්පූර්ණ මානව සම්පත් කළමනාකරණය කිරීමේ වගකීම මූලික වශයෙන්ම මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මානව සම්පත සැලසුම් කිරීම, කාර්යසාධනය ඇගයීම, පුහුණු හා සංවර්ධනය, විනය පවත්වාගෙන යාම, පැමිණීම හා නිවාඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම සේවකයින් සුභසාධන සේවා එහි ප්‍රධාන කාර්යයන් වේ.

**ප්‍රගතිය**

- විධායක නිලධාරීන් හත්දෙනෙක්, කළමනාකරණ සහකාර කාණ්ඩයේ සේවකයින් තිදෙනෙකු හා ප්‍රාථමික මට්ටමේ සේවකයින් හය දෙනෙක් අයෝජන මණ්ඩලයේ සේවය සඳහා බඳවා ගනු ලැබීය.
- කොන්ත්‍රාත් පදනමින් සේවය කළ සේවකයින් හය දෙනෙකු ස්ථිර කාර්ය මණ්ඩලයට අන්තර්ග්‍රහණය කරනු ලැබීය.
- විධායක නිලධාරීන් 52 දෙනෙක්, කළමනාකරණ සහකාර කාණ්ඩයේ සේවකයින් 28 දෙනෙක් හා ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 6 දෙනෙකු ඉහල ශ්‍රේණිවලට උසස් කරනු ලැබීය.
- කාර්ය මණ්ඩලය පුහුණු කරනු ලැබීය. (සම්පූර්ණ සංඛ්‍යාව 573)




*මූලාශ්‍රය : මානව සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය*

- ආයෝජන මණ්ඩලයේ සංයුක්ත සමාජ වගකීමක් ලෙස, පිළිගත් විශ්ව විද්‍යාල හා වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුලාභීන් 55 දෙනෙකු සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි සේවාස්ථ රැකියා පුහුණුව ලබා දෙනු ලැබීය.

## 17. ආරක්ෂක හා ගිනිනිවීම් දෙපාර්තමේන්තුව

**කාර්යයන්**

**ආරක්ෂක අංශය**

- දේපල හා මනුෂ්‍ය ජීවිතවල ආරක්ෂාව
- ඇතිවිය හැකි කඩාකප්පල්කාරී ක්‍රියා විනාශකාරී ක්‍රියා, සොරකම් බදු නිදහස් භාණ්ඩ හා අළුත්වැඩියා කිරීම්/ආපසු ලබා දෙන අයිතම ඇතුළු වෙනත් භාණ්ඩ නීති විරෝධී ලෙස ඉවත් කිරීම වැළැක්වීම.
- කලාප තුලට නීති විරෝධි ලෙස ඇතුළු වීම වැළැක්වීම සඳහා සියළුම ඇතුළු වන හා පිට වන ස්ථාන හොඳින් පරීක්ෂා කිරීම.
- සියළු කලාපවල පුහුණු කාර්ය මණ්ඩලය සංචාරක මුර සේවයේ යෙදවීම
- රේගුවේ බන්ධිත ගුදම් ප්‍රදේශවල රාජකාරියේ යෙදීම, අපනයන සැකසුම් කලාප ආශ්‍රිත ප්‍රදේශවල පැය 24 පුරා පරීක්ෂාකාරිවීම, ආවේක්ෂණය.
- ආයෝජන මණ්ඩල කාර්ය මණ්ඩලය සමගින් ඇතුළුවීමේ අවසර පත් නිකුත් කිරීම. සති අග හා නිවාඩු දින හැර වැඩ කරන කාලය තුල හා ඉන් පසුව ආරක්ෂක කාර්ය මණ්ඩලය මෙම කාර්යය සඳහා සම්පුර්ණයෙන්ම වගකිව යුතු වේ.
- සොරකම් කිරීමේ ප්‍රයත්නයන් කාලය ඉකුත් වූ ඇතුල්වීමේ අවසර පත් අවභාවිතා කිරීම ආදිය අනාවරණය කර ගැනීම සඳහා නිරන්තර කර්මාන්ත ශාලා පරීක්ෂා කිරීම් සිදු කරනු ලැබේ.
- කලාප කළමනාකරණය, ව්‍යවසායන් හා නීතිය ක්‍රියාත්මක කිරීමේ බලධාරින් අතර සම්බන්ධීකරණය
- වසා දමන ලද ව්‍යවසායන්ගේ ආරක්ෂක අධීක්ෂණය.
- දෛනික/මාසික රැස්වීම්ල උපදෙස්ල පුහුණු දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදෙස් දීමේ සැසි සෑම කලාපයකම පවත්වනු ලැබේ.

**ගිනි නිවීම් අංශය**

- කලාප තුල මෙන්ම කලාප වලින් පිටත අසල පිහිටි ප්‍රදේශවල ගිනි නිවීමේ ඇමතුම් හා හදිසි අවස්ථාවන් සඳහා ප්‍රතිචාර දක්වනු ලැබේ.
- ගිනි ඇතිවීම් වැළැක්වීමේ පරීක්ෂා කිරීම්.
- ගිනි අවදානම් ඇගයීම (සමස්ථ).
- ගින්නක් ඇතිවීමේදී ගනු ලබන හදිසි ක්‍රියාමාර්ග හා කර්මාන්ත ශාලා කාර්යමණ්ඩලය දැනුවත් කිරීම.
- කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය සඳහා ගිනි නිවීම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණුව ලබාදීම.
- ව්‍යවසායන්ගේ ඉල්ලීම් මත ගින්නකදී ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණුව ලබාදීම.
- ව්‍යවසායන්ගේ ගිනි නිවීම ද්‍රව්‍ය හා ගිනි නිවීමේ උපකරණ පරීක්ෂා කිරීම.
- අනුකූලතා සහතික, ගිනි නිවීමේ සහතික, එම ස්ථානයෙන් පිරිස් ඉවත් කිරීමේ සහතික නිකුත් කිරිම.
- කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දෛනික පදනම මත ගිනි නිවීමේ උපකරණ පරීක්ෂා කිරීම
- ගිනි නිවීමේ කාර්ය මණ්ඩලය කලාප කළමනාකරණය හා සම්බන්ධ හදිසි අවස්ථාවන්හිදී ප්‍රතිචාර දක්වනු ලැබේ.
- ගිනි නිවීම් ඇමතුම් හා හදිසි අවස්ථාවලදී ප්‍රතිචාර දක්වනු ලැබේ.
- වාර්ෂික ගිනි වැලකුම් පරීක්ෂා කිරීම් හරහා ගිනි අවදානම් ඇගයීම.
- කර්මාන්ත ශාලා කාර්ය මණ්ඩලය/සේවකයින් ගින්නකදී එම ස්ථානයෙන් ඉවත් වන ආකාරය පිළිබඳව දැනුවත් කිරිම.
- ගිනි නිවීම් උපකරණ භාවිතය/ප්‍රථමාධාර ලබාදීම සම්බන්ධයෙන් පුහුණු කිරීම.
- ගිනි නිවීමේ උපකරණ සවිකිරීම සම්බන්ධයෙන් කර්මාන්තශාලාවලට උපදෙස් සැපයීම සහ දැනට පවතින ගිනි නිවීම් උපකරණ සේවා කිරීම.

**ප්‍රගතිය**

**පුහුණු වැඩසටහන්**

- ආරක්ෂක නිලධාරීන් සඳහා : 2017/02/02 දින සිට 2017/06/22 දින දක්වා මාස 04 ක ඉංග්‍රිසි පාඨමාලාවක් පවත්වන ලදී.
- ගිනි නිවීමේ නිලධාරීන් සඳහා : කොළඹ ගිනිනිවීමේ මූලස්ථානයේ දී එක් දින සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

# මූල්‍ය සමාලෝචනය 2017

**විශේෂ මූල්‍යමය දත්ත**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා | 2017 රු.මිලි. | 2016 රු.මිලි. | වෙනස % |
|---|---|---|---|
| **මූල්‍ය කාර්යසාධනය** | | | |
| REVENUE | 3,712 | 3,605 | 3 |
| මෙහෙයුම් වියදම් | (3,211) | (3,049) | (5) |
| මූල්‍ය ආදායම් | 337 | 222 | 52 |
| මූල්‍ය වියදම් | (11) | (11) | - |
| බදුකරණයට පෙර අතිරික්තය | 827 | 768 | 8 |
| බදු වියදම් | (71) | (47) | (51) |
| **බදුකරණයට පසු අතිරික්තය** | 756 | 721 | 5 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | (25) | 14 | (278) |
| විස්තීර්ණ ආදායම් වල එකතුව | 731 | 735 | (1) |
| **මූල්‍ය තත්වය** | | | |
| වත්කම් වල එකතුව | 42,412 | 41,747 | 2 |
| සම කොටස් වල එකතුව | 41,005 | 40,453 | 1 |

**2017 මූල්‍ය සමාලෝචනය**

**ලාභදායිතාව**

*ශුද්ධ අතිරික්තය*
*(රු.මිලි)*




මණ්ඩලය 2017 වසර සඳහා රු.මිලි. 756 බදුකරණයෙන් පසු ශුද්ධ අතිරික්තයක් වාර්තාකරනු ලැබූ අතර එය 2016 වසර හා සැසඳීමේදී 5%ක වැඩිවීමකි.

**ආදායම**

*ආදායම වර්ධනය (රු.මිලි)*




සමාලෝචනයට ලක් වන වසර තුල මුළු මෙහෙයුම් වියදම් 2016 වසර හා සන්සන්දනය කිරීමේදී රු.මිලි. 3,211 දක්වා 5% කින් වැඩි වී ඇත. ආයෝජන ප්‍රවර්ධනය හා කලාප නඩත්තු කිරීම සඳහා දරනු ලැබු වියදම්, මෙහෙයුම් වියදම් යටතේ වර්ගීකරණය කර ඇත. 2016 හා සැසඳීමේදී පරිපාලන වියදම් ද 3% කින් වැඩි වී ඇත. පුද්ගල පිරිවැය හා ක්ෂය කිරීම් වල ඉහලයාම මීට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත.

**වියදම්**

*මෙහෙයුම් වියදම් (රු. මිලි)*




පෙර වසරේදී රු. මිලි. 3,605 ක් වූ මෙහෙයුම් ආදායම 2017 වසරේදී රු.මිලි. 3,712 දක්වා වැඩි වී ඇත. මෙය රු. මිලි. 107 ක වර්ධනයක් වන අතර පසු ගිය වසර හා සැසඳීමේදී 3%ක වර්ධනයකි. සම්පුර්ණ ආදායමට 29%කින් දායක වු ආනයන/අපනයන සේවා ගාස්තු මගින් ලද ආදායම රු මිලි 79 සිට රු. මිලි. 1,091 දක්වා වැඩී වී ඇති අතර මෙය 2010 වසර හා සැසඳීමේදී 8%ක වැඩිවීමකි.

*රජයේ තීරුබදු හා බදු (රු.මිලි)*




රජයේ තීරු බදු ගිණුම් මත ගෙවන ලද ප්‍රමාණයන් පසුගිය වසර හා සැසඳීමේදී 64%කින් වැඩි වී ඇත. වැට් යෙදවුම් වල වැඩිවීම මෙයට හේතු වී ඇත. සමාලෝචනයට ලක්වන වසර සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පොලී ආදායම මත ආදායම් බදු ලෙස රු. මිලි. 71ක් ගෙවා ඇත.

# 2017

# මූල්‍ය ප්‍රකාශන

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**ආදායම් ප්‍රකාශය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| ආදායම | **4** | **3,711,862,608** | **3,605,145,347** |
| **අඩුකලා : වියදම්** | | | |
| මෙහෙයුම් වියදම් | **6** | 265,378,859 | 265,978,777 |
| පරිපාලන වියදම් | **7** | 2,724,737,396 | 2,639,675,029 |
| රජයේ තීරුබදු | **8** | 190,599,853 | 116,511,263 |
| වෙනත් වියදම් | **9** | 29,943,193 | 26,528,404 |
| **සම්පූර්ණ මෙහෙයුම් වියදම්** | | 3,210,659,301 | 3,048,693,473 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වල ප්‍රගතිය** | | **501,203,307** | **556,451,874** |
| මූල්‍ය ආදායම | | 336,920,319 | 222,265,759 |
| මූල්‍ය වියදම් | | 10,940,559 | 10,588,937 |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **10** | **325,979,760** | **211,676,822** |
| **බදු පෙර අතිරික්තය** | | **827,183,067** | **768,128,696** |
| බදු වියදම් | | 70,759,017 | 47,342,329 |
| **කාලසීමාව සඳහා අතිරික්තය** | | **756,424,050** | **720,786,367** |

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය**

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන | 2017<br>රු. | 2016<br>රු. |
|---|---|---|---|
| **කාලසීමාව සඳහා අතිරික්තය** | | **756,424,050** | **720,786,367** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| අඩුකලා නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක (ලාභ)/පාඩු | **21.1** | 25,054,316 | (14,247,556) |
| **කාලසීමාව සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව** | | **731,369,734** | **735,033,923** |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මූල්‍ය තත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2017 රු. | 2016 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11 | 5,286,329,406 | 5,303,929,267 |
| ආයෝජන දේපල | 12 | 31,045,348,525 | 31,061,433,429 |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යය | 13 | 1,459,645,476 | 1,440,471,652 |
| මූල්‍යමය වත්කම් | 14 | 550,320,565 | 518,297,444 |
| **ජංගම නොවන වත්කම් වල එකතුව** | | **38,341,643,972** | **38,324,131,792** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ වට්ටෝරු | | 15,288,767 | 15,007,657 |
| අපහරණය සඳහා වන නිවාස | | 2,551,000 | 2,551,000 |
| මූල්‍ය වත්කම් | 15 | 180,817,889 | 167,000,271 |
| ව්‍යවසායන්ගෙන් ලැබීම් | 16 | 244,621,184 | 259,889,902 |
| අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ | 17 | 459,138,042 | 561,945,146 |
| මුදල් හා මුදලට සමාන දෑ | 18 | 3,168,262,320 | 2,416,619,374 |
| **ජංගම වත්කම් වල එකතුව** | | **4,070,679,203** | **3,423,013,349** |
| **වත්කම් වල එකතුව** | | **42,412,323,175** | **41,747,145,141** |
| **සම කොටස් හා වගකීම්** | | | |
| සම කොටස් | | | |
| සමුච්චිත අරමුදල් | | 10,707,121,650 | 10,410,484,416 |
| සංචිත | | 15,340,693,234 | 15,340,693,234 |
| | | **26,047,814,884** | **25,751,177,650** |
| විලම්භිත ආදායම | 20 | 15,372,603,440 | 15,120,869,118 |
| විලම්භිත වියදම් | 19 | (415,893,541) | (419,319,798) |
| | | **14,956,709,899** | **14,701,549,320** |
| **සම කොටස්වල එකතුව** | | **41,004,524,784** | **40,452,726,970** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් | 21 | 265,684,539 | 236,228,948 |
| වසරකට පසු ගැනෙන දිගුකාලීන ණය ගැනීම් | 22 | 47,923,182 | 20,180,139 |
| **ජංගම නොවන වගකීම් වල එකතුව** | | **313,607,721** | **256,409,087** |
| **ජංගම වගකීම්** | | | |
| වසරකට පසු ගැනෙන දිගුකාලීන ණය ගැනීම් | 22 | 13,776,989 | 24,808,691 |
| සමුච්චිත වියදම් හා වෙනත්ගෙවිය යුතු දෑ | 23 | 1,060,917,370 | 993,051,918 |
| ගෙවිය යුතු බදු | | 19,496,310 | 20,148,476 |
| **ජංගම වගකීම්වල එකතුව** | | **1,094,190,669** | **1,038,009,085** |
| **සම කොටස් හා වගකීම්වල එකතුව** | | **42,412,323,175** | **41,747,145,141** |

පිටු අංක 8 සිට 24 දක්වා වන මූල්‍ය සටහන් සඳහා සටහන් මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ. ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කිරම හා අත්සන් කිරීම කරනු ලබන්නේ,

| | | | |
|---|---|---|---|
| **දුමින්ද්‍ර රත්නායක** | **මංගල යාපා** | **දුමින්ද ආරියසිංහ** | **සවිතා මුතුකුමාරණ** |
| **සභාපති** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** | **අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික** | **විධායක අධ්‍යක්ෂ - මූල්‍ය** |

**4/24/2018**

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

**සම කොටස් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

**2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා**

| | සමුච්චිත අරමුදල | ප්‍රත්‍යාගණන සංචිත | සම කොටස් වල එකතුව |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| **2016 ජනවාරි 01 දිනට ශේෂය** | **9,619,169,977** | **15,340,693,234** | **24,959,863,211** |
| කාලසීමාව සඳහා අතිරික්තය | 735,033,923 | - | 735,033,923 |
| ප්‍රාග්ධන ලැබීම් - කජු සංස්ථාවේ ඉඩම පැවරීම | 213,760,000 | | 213,760,000 |
| භාණ්ඩාගාරයට අරමුදල් හුවමාරු කිරීම | (150,000,000) | | (150,000,000) |
| භාණ්ඩාගාර ගිණුම් මත වියදම් | (86,026) | | (86,026) |
| විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් ලබාදීම | (7,393,460) | - | (7,393,460) |
| **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,410,484,416** | **15,340,693,234** | **25,751,177,650** |
| **2017 ජනවාරි 01 දිනට ශේෂය** | **10,410,484,416** | **15,340,693,234** | **25,751,177,650** |
| කාලසීමාව සඳහා අතිරික්තය | 731,369,734 | - | 731,369,734 |
| මහා භාණ්ඩාගාරයට අරමුදල් සම්ප්‍රේෂණය | (220,000,000) | | (220,000,000) |
| ප්‍රාග්ධන ලැබීම් ආපසු හැරවීම - කජු සංස්ථාවට ඉඩම පැවරීම | (213,760,000) | | (213,760,000) |
| විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (972,500) | - | (972,500) |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **10,707,121,650** | **15,340,693,234** | **26,047,814,884** |

පිටු අංක 8 සිට 24 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශන වල සංකලිත කොටසකි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

## මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාලසීමාව සඳහා | 2017<br>රු.( මිලි) | 2016<br>රු.( මිලි) |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුල්‍ය ප්‍රවාහ** | | |
| **මෙහෙයුම් මගින් උත්පාදනය වූ මුදල් (24 සටහන)** | 810.44 | 1084.08 |
| ආදායම් බදු ගෙවීම් | (71.41) | (38.72) |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් ගෙවීම | (34.11) | (34.95) |
| විලම්භිත ආදායම් ලැබීම් | 461.77 | 343.74 |
| විලම්භිත ආදායම්වල පාඩුව හුවමාරු කිරීම | (0.23) | - |
| මුදල් ආපසු ගෙවීම් | - | (4.56) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/පිටතට ගැලීම්** | **1166.45** | **1349.60** |
| **ආයෝජන ක්‍රියාකාරකම් මගින් මුල්‍ය ප්‍රවාහ** | | |
| ආයෝජන ආදායම | 326.02 | 147.22 |
| කාර්ය මණ්ඩල ණය හා මුල්‍ය සහය | (29.72) | (6.44) |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | (96.02) | (225.79) |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 0.11 | 5.20 |
| සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | (356.58) | (179.73) |
| විලම්භිත වියදම් | (0.09) | (26.89) |
| විශාල ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම | (0.12) | (7.39) |
| **අයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/පිටතට ගැලීම්** | **(156.40)** | **(293.83)** |
| **මුල්‍යයන ක්‍රියාකාරකම් මගින් මුල්‍ය ප්‍රවාහ** | | |
| කල්බදු වාරික ගෙවීම් | (38.35) | (31.18) |
| මහා භාණ්ඩගාරයට අරමුදල් සම්ප්‍රේෂණය | (220.00) | (150.00) |
| සමීක්ෂණ ගාස්තු අත්තිකාරම් | (0.06) | (0.09) |
| අයෝජන ක්‍රියාකාරකම් මගින් ශුද්ධ මුල්‍ය ඇතුලට ගැලීම්/පිටතට ගැලීම් | **(258.41)** | **(181.27)** |
| මුදල් හා මුදලට සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | 751.64 | 874.51 |
| වසර ආරම්භයේ මුදල් හා මුදලට සමාන දෑ | 2416.62 | 1542.11 |
| වසර අවසානයේ මුදල් හා මුදලට සමාන දෑ | **3168.26** | **2416.62** |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුළු ආදායම

| | | රු. |
|---|---|---|
| බිම් කුලිය | 21% | 836,974,485 |
| වාර් ෂික ගාස්තු | 18% | 717,579,891 |
| තැන්පතු මත පොළිය | 8% | 336,920,319 |
| කුලී ආදායම | 2% | 88,337,335 |
| ශුද්ධ ජල ආදායම | 10% | 402,860,636 |
| ආනයන /අපනයන සේවා ගාස්තු | 27% | 1,091,708,658 |
| වෙනත් | 14% | 549,347,287 |
| **එකතුව** | | **4,023,728,611** |




### 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සම්පූර්ණ වියදම

| | | රු. |
|---|---|---|
| මෙහෙයුම් වියදම් | 8% | 265,378,859 |
| පරිපාලන වියදම් | 83% | 2,724,737,396 |
| රජයේ තීරුබදු | 8% | 261,358,870 |
| මූල්‍ය වියදම් | 0.3% | 10,940,559 |
| වෙනත් | 0.7% | 29,943,193 |
| **එකතුව** | | **3,292,358,876** |



**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**












**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.**

## 1 වාර්තා කරනු ලබන ආයතනය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, 1978 අංක 4 දරණ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතිය යටතේ ස්ථාපනය කරනු ලැබීය. එහි ලියාපදිංචි කාර්යාලය හා ප්‍රධාන කාර්යාලය බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01 යන ස්ථානයේ පිහිටා තිබේ.

## 2 පිළියෙල කිරීමේ පදනම.

### 3 2.1 අනුකූලතා ප්‍රකාශය.

මූල්‍ය තත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, සම කොටස් වෙනස්වීම, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශයන් හා සටහන්, මණ්ඩලයේ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර මූල්‍ය වාර්තා කිරීමේ ප්‍රමිති නියෝජනය කරන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය මගින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇත.

### 2.2 ඇස්තමේන්තු විනිශ්චයන්, හා උපකල්පනයන් භාවිතා කිරීම.

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණයට, ආදායම්, වියදම්, වත්කම් හා බැදීම් වල වාර්තාගත ප්‍රමාණයන් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන සිදු කිරීමට හා වාර්තා කරන දිනට අවිනිශ්චිත බැදීම් අනාවරණය කිරීම අවශ්‍ය කෙරේ. ඇස්තමේන්තු හා මූලික උපකල්පන සිදු කෙරෙමින් පවතින පදනම මත සමාලෝචනය කෙරේ. නමුත් මෙම උපකල්පන හා ඇස්තමේන්තුවල අවිනිශ්චිත භාවය මගින් අනාගතයේදී වත්කම් හෝ වගකීම් වල ගෙන එන අගයට බලපාන ද්‍රව්‍යමය ගැලපීම් අවශ්‍ය කල හැකි ප්‍රතිඵල ඇති කල හැකි වේ.

### 2.3 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් මණ්ඩලයේ වගකීම් අඛණ්ඩව ඉදිරියට පවතින ලෙස සලකා තක්සේරු කර ඇත. මණ්ඩලයට පුරෝකථනය කල හැකි අනාගතයක් සඳහා අඛණ්ඩව මෙහෙයවීම සඳහා අවශ්‍ය පමණ සම්පත් ඇති බවට සාධාරණ අපේක්ෂාවක් ඇත. මණ්ඩලයේ අනාගතය පිළිබඳ පවතින සියළු තොරතුරු සැලකීමේදී, මෙහෙයුම් ඇවර කිරීම හෝ අවසාන කිරීමේ අවශ්‍යතාවයක් දක්නට නොමැත. ඒ අනුව, මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ඉදිරි අඛණ්ඩ පැවැත්ම පදනම් අනුගත කර ගෙන ඇත.

### 2.4 ගනුදෙණු කිරීමේ හා ඉදිරිපත් කිරීමේ මුදල්.

මණ්ඩලයේ ගනුදෙණු කරනු ලබන මුදල් ඒකකය වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර මූල්‍ය ප්‍රකාශන ද ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති.

### 3.1 මූල්‍ය වත්කම්.

මණ්ඩලය මගින් එහි මූල්‍ය වත්කම් ණය හා ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කරනු ලබන අතර කල් පිරෙන ආයෝජන ලෙස තබා ගනු ලැබේ. මූලික හඳුනා ගැනීමේදීම කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජනය කරන හා අත්පත් කර ගනු ලබන අරමුණ මත රඳා පවතී.

**(අ) වර්ගීකරණය.**

(i) *ණය හා ලැබිය යුතු දෑ.*

ණය හා ලැබිය යුතු දෑ යනු ක්‍රියාකාරී වෙළඳපලෙහි මිළ ගණන් දක්වා නොමැති ස්ථාවර හෝ තීරණය කල හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. සාමාන්‍ය ගනුදෙණු මගින් ඇති වන ලැබිය යුතු දෑ ද මෙම කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර හානිකරණය සඳහා සමාලෝචනය කෙරේ.

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.**

**මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)**

(ii) *කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම්*

ස්ථාවර හෝ තීරණයකළහැකි ගෙවීම් හා ස්ථාවර කල්පිරීමක් සහිත මණ්ඩලයේ කළමනාකාර්ත්වයට ධනාත්මක ආකල්පයක් හා කල්පිරීම සඳහා රඳවා තැබීමේ හැකියාව ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරෙන තෙක් තබාගනු ලබන මූල්‍ය වත්කම්වේ.

**(ආ) හානිකරණය.**

මූල්‍ය වත්කම් හානිකරණය පිළිබඳ යම් සඳහන් කිරීමක් තිබේ දැයි තීරණය කිරීම සඳහා එක් එක් ශේෂ පත්‍ර දිනය අනුව සමාලෝචනය කෙරේ. එවැනි සඳහන් කිරීමක් වේ නම් වත්කමෙහි නැවත ලබා ගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු ගත කෙරේ.
වත්කමක ඉදිරියට ගෙනයන ප්‍රමාණය හෝ එහි මූල්‍ය උත්පාදන ඒකක එහි ආපසු ලබාගැනීමේ ප්‍රමාණය ඉක්මවා යන විට හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩුව ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

**(ඇ) වත්කම් හා බැරකම් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම.**

පූර්ව කාලයේ හඳුනාගනු ලැබූ හානිකරණ පාඩු, ඒවා අඩු වී තිබේද හෝ තව දුරටත් පවතින්නේ දැයි යම්කිසි සඳහන් කිරීමක් සඳහා එක් එක් වාර්තාකරණ දිනයට තක්සේරු කරනු ලැබේ. ආපසු ලබා ගත හැකි ප්‍රමාණය තීරණය කිරීම සඳහා භාවිතා කල ඇස්තමේන්තු වල වෙනසක් වී ඇති නම් හානිකරණ පාඩු ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

**3.2 දේපළ, පිරිවිත හා උපකරණ**

**(අ) පිරිවැය.**

SLFRS 1 අනුව, දේපළ පිරිවිත හා උපකරණ වල අගය තක්සේරු කිරීමේදී 2011 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂයවීම් අඩු කර 2011 ජනවාරි 01 දිනට ඇති පිරිවැය ලෙස සලකා බලනු ලැබේ.

**(ආ) ක්ෂය කිරීම.**

ක්ෂය කිරීම සඳහා ලබා දී ඇති දේ දේපළ, පිරියත හා උපකරණයෙහි පිරිවැය/තක්සේරුව සෘජු රේඛා පදනම මත ගණනය කරනු ලැබේ. ඉඩම් හැර සියළු දේපළ පිරිවිත හා උපකරණ ඒවායේ ප්‍රයෝනවත් ආයු කාලය අනුව වාර්ෂිකව ක්ෂය කර ඇත.

| | | |
|---|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ | - | වසර 20 |
| පිරිවිත හා යන්ත්‍ර | - | වසර 10 |
| සවිකුරු හා උපාංග | - | වසර 10 |
| කාර්යාල ගෘහ භාණ්ඩ හා උපකරණ | - | වසර 10 |
| පරිගණක | - | වසර 03 |
| මෝටර් රථ | - | වසර 05 |

ස්ථාවර වත්කම් සඳහා අපහරණය කරනු ලබන වසරේදී සම්පූර්ණයෙන්ම ක්ෂයවීම යොදවනු ලබන අතර මිලදී ගත් වසර සඳහා ක්ෂයවීම යොදා ගනු නොලැබේ.

**(ඇ) හඳුනාගනු ලැබූ මූල්‍ය වත්කමක් හෝ වගකීමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම.**

දේපල හා උපකරණ අයිතම අපහරණය කිරීම මත හෝ ඒවා භාවිතයෙන් අනාගත ප්‍රතිලාභ බලාපොරොත්තු නොවන විට ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. එසේ දේපල, පිරියත හා උපකරණ අයිතම ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම නිසා ඇති වන ලාභ හෝ පාඩු, විකිණීමෙන් ලැබෙන මුදල් හා දේපල අගය වෙනස තීරණය කරනු ලබන අතර ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**(ඈ) සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්.**

ශේෂ පත්‍රයෙන් දිනයට නිම නොකරන ලද වසර තුල දරනු ලැබූ ප්‍රාග්ධන වියදම් සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස දක්වන අතර වසර තුල නිම කරන ලද හා භාවිතයට ගත හැකි ප්‍රාග්ධන වත්කම් දේපල, පිරිවිත හා උපකරණ වලට මාරු කරනු ලැබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් (ඉතිරි කොටස)

(ඉ) කල්බදු වත්කම්

මූල්‍ය කල්බදු යටතේ අත්පත් කර ගනු ලබන වත්කම් අදාල මූල්‍යමය වගකීම් අනුව හඳුනාගෙන කල්බදු මෝටර් වාහන කාණ්ඩය යටතේ ප්‍රාග්ධනීකරණය හා ඇතුලත් කිරීම සිදුකෙරේ. මූල්‍ය කල්බදු යටතේ තබාගනු ලබන වත්කම් ඒවා භාවිතා කරණ කාලසීමාව අනුව ක්ෂය කරනු ලැබේ.

(ඊ) ව්‍යුහයන්.

ව්‍යුහයන්ගේ සාධාරණ අගය මූලික උප කාණ්ඩ හතක් යටතේ තක්සේරු කර තිබේ. එකිනෙක හා සම්බන්ධ සියළු අයිතම හා කොටස් එක් කොටසක ඒකකයක් සාදන ලෙස සලකනු ලැබේ.

3.3 ආයෝජන දේපල.

ආයෝජන දේපල එකී වත්කම් ආයෝජන දේපල යටතේ වර්ගීකරණය කරනු ලබන දිනයට පවතින පිරිවැය අනුව දැක්වේ.

3.4 භාණ්ඩ වට්ටෝරු.

සියළු භාණ්ඩ වට්ටෝරු අඩු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි කල හැකි අගයට ගණනය කරනු ලැබේ. පළමුව ලැබු පළමුව පිට කල පදනම (FIFO) මත පිරිවැය තීරණයකෙරේ.

3.5 වෙනත් වත්කම්.

වෙනත් වත්කම් වලට වෙනත් ණය ගැතියන්, ලැබිය යුතු දෑ, අත්තිකාරම් තැන්පතු හා ගෙවීම් ඇතුලත් වේ.

(අ) *අත්තිකාරම්, තැන්පතු, පෙර ගෙවූ වියදම්.*

එක් මූල්‍ය වර්ෂයකට වඩා වැඩියෙන් ප්‍රතිලාභ හෝ සම්බන්ධතාවයක් ඇති ලෙස සලකනු ලබන වියදම් අත්තිකාරම්, තැන්පතු හා පෙර ගෙවුම් වියදම් ලෙස වර්ගීකරණය කෙරේ. කාල සීමාව අවසානයේදී එකී වියදම් ඊට අදාල කරුණ අනුව කාල සමානුපාතික පදනම මත පොත් වලින් කපා හරිනු ලැබේ.

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ (BOI) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

-------------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට (ශ්‍රී. ලං.ගි.ප්‍ර.) අනුකූල වීම

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.01 -මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම: -** සමුච්චිත අරමුදලින් සෘජුව අඩුකරන ලද, මහා ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැළසීම වෙනුවෙන් දරන ලද වියදම් ආශ්‍රිත ගිණුම්කරණ ප්‍රතිපත්ති, ස්වභාවය සහ තත්ත්වයන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර.16 - දේපල, පිරියත හා උපකරණ: -** මණ්ඩලය විසින් ස්ථාවර වත්කම් මිලදී ගන්නා ලද වර්ෂයේදී ක්ෂය කර නොතිබුණි. කෙසේ වුවද, අපහරණය කරන වර්ෂයේදී සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්ෂය කිරීම රු. 7,866,369 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

(ඇ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24- සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම-:**සම්බන්ධිත පාර්ශවයන් සමග සිදු කරන ලද පුද්ගලමය වශයෙන් වැදගත් වන ගනුදෙනු වල ස්වභාවය සහ වටිනාකම සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) **ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39- මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම-:** දිගුකාලීනව හිඟහිටි සේවක ණය ශේෂයන් සඳහා හානිකරණය මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගෙන නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා කපු සංස්ථාවෙන් අය විය යුතු ශේෂයක් ලෙස රු. 209,600,000 ක මුදලක් 2016 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.කෙසේ වෙතත්, අදාළ මුදල මණ්ඩලයට ගෙවිය යුතු මුදලක් වශයෙන් ශ්‍රී ලංකා කපු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැති අතර මෙම මුදල මණ්ඩලයට ගෙවන බවට සහතික වීමක්ද සිදුකර නොතිබුනි. එබැවින් එම ශේෂය අයකරගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විගණනයේදී සැක සහිත විය.

(ආ) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් , හොරණ අපනයන සැකසුම් කලාපයේ (HEPZ) පිහිටි පෞද්ගලික සමාගමකින් ලද ඉඩම් පාරිතෝෂික ආදායම් මුදලක් රු. 1,410,549 කින් වැඩියෙන් දක්වා තිබුණු අතර විලම්බිත ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා විලම්බිත වියදම් ක්‍රමක්ෂය රු.1.330,929 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයට අයත් ඉදිකිරීම් කාර්යයන් 3 කට අදාළ මුළු කොන්ත්‍රාත් වටිනාකම වූ රු. 930,142 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ගෙවා තිබුණද, මෙම කාර්යයන් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩවල ඇතුළත් කර තිබුණි.

### 2.2.3 පැහැදිලි නොකල වෙනස්කම්

---

ආයුගණක තක්සේරුවට අනුව සමාලෝචිත වර්ෂය සඳහා විශ්‍රාම ප්‍රතිලාභ වගකීම රු. 24,115,267 ක් වුවද, එය රු. 25,054,316 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. එබැවින් රු. 939, 049 ක් වූ පැහැදිළි නොකළ වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

### 2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

---

ලැබිය යුතු මුදල්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදල රු.594,291,216 ක් වූ අතර ඉන් රු. 279,622,328 ක මුදලක් හෙවත් සියයට 47 ක් වර්ෂ දෙකකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. එසේම, ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු මුදලින් හානිකරණය සඳහා ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුළු මුදලින් සියයට 59 ක් නියෝජනය කර තිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වාර්ෂික ගාස්තුව රු.252,766,237 ක් වූ අතර ඉන් රු.156,034,986 ක් හෙවත් සියයට 62 ක් වර්ෂ හතරකට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. ඒ අතර, සමාලෝචිත වර්ෂය තුළ එම මුදලින් රු.221,713,312 ක් හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණු අතර එය 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුළු මුදලින් සියයට 88 ක් නියෝජනය කර තිබුණි.
එසේම, ලැබිය යුතු වාර්ෂික ගාස්තුව සඳහා වූ මුළු හානිකරණය සඳහා ප්‍රතිපාදනයෙන් රු.201,646,285 ක් හෙවත් සියයට 91 ක් අවලංගු කරන ලද ව්‍යාපෘති 529 කින් වසා දැමූ ව්‍යාපෘති 151 කින් සහ මෙහෙයුම් අත්හිටුවන ලද ව්‍යාපෘති 75 කින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය.
සමාලෝචිත වර්ෂය තුලදී හානිකරණය සඳහා වූ රු 349,670,032 ක මුළු ප්‍රතිපාදනයෙන් රු. 262,358,801 හෙවත් සියයට 75 ක් 2017 දෙසැම්බර් 31 දිනට අවලංගු කරන ලද , වසා දැමුණු සහ මෙහෙයුම් අත්හිට වූ ව්‍යාපෘති සඳහා කරන ලද හානිකරණ ප්‍රතිපාදනයෙන් නියෝජනය විය.

(ඇ) වතුපිටිවල නිවාස ඒකක වෙන්දේසිකරුවකු වූ පුද්ගලික සමාගමකින් ලැබිය යුතු රු.1,604,200 ක මුදලක් වර්ෂ හතකට අධික කාලයක සිට අය නොවී පැවති අතර එම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමක් පවතින බවට තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් නොතිබුණි.

(ඈ) වෙනත් ණයගැතියන් යටතේ දැක්වෙන රු.507,650 ක මුදල් ඌණතාවයක් වර්ෂ දහහතරකට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 31 දිනට රු.281,357,610 ක් වූ මුළු වෙනත් ණයගැතියන්ගේ වටිනාකමින් රු.253,346,759 ක් හෙවත් සියයට 90 ක් රජයේ අමාත්‍යාංශ සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වලින් ලැබිය යුතු මුදල් වලින් නියෝජනය විය. රජයේ ආයතනවලින් ලැබිය යුතු රු.37,680,103 ක් වසර 4 ට වැඩි කාලයක් අය නොවී පැවතුණු බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.. විස්තර පහත දැක්වේ.

| ආයතනයේ නම | 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල |
|---|---|
| | රු. |
| ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 37,412,573 |
| විදේශ කටයුතු අමාත්‍යාංශය | 141,950 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 125,580 |
| එකතුව | 37,680,103 |

ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු මුදල වසර දහයකට වැඩි කාලයක් අය නොවී පැවතුණි., කෙසේ වුවද , 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වීම හේතුවෙන් රජයේ ආයතන වලින් අයවිය යුතු වසර 4 කට වඩා හිඟව පැවති ශේෂයන් මත මූල්‍ය ප්‍රකාශනවල සියයට 100 ක හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

(ඊ) 2017 දෙසැම්බර් 31 දිනට රු.5,766,335 ක් වූ අයකර ගත නොහැකි මුළු සේවක ණය ශේෂයෙන් රු.3,202,582 ක් හෙවත් සියයට 55 ක් වසර 4 කට වැඩි කාලයක් අය නොවී පැවතුණි.

**ගෙවිය යුතු ශේෂ**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. 5,913,789 ක් වූ විවිධ ණයහිමියන් වර්ෂ 3 කට වැඩි කාලයක් නිරවුල් කර නොතිබුණි.

(ආ) එකතුව රු.24,405,234 ක් වූ රඳවාගැනීම් මුදල් වලින් කොන්ත්‍රාත් 16 ට අදාළ රු.7,897,111 ක් හෙවත් සියයට 32 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

(ඈ) එකතුව රු.10,313,595 ක් වූ ඉදිරි ලැබීම් වර්ෂ තුනකට වැඩි කාලයක් නොවෙනස්ව පැවතුණි. මේ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.3 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වයද ඇතිව අදාල අමාත්‍යවරයා විසින් ලබාදුන් අනුමැතිය රහිතව 2017 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 6,807.75 ක මුදලක් මණ්ඩලය විසින් ආයෝජනය කර තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 770 (2) | ගණන් දීමේ නිළධාරියාගේ අනුමැතිය රහිතව රු.3,113,255 ක් පිරිවැය වූ ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කර තිබුණි. |
| (ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | මණ්ඩලය විසින් " ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා ආයෝජන මණ්ඩලයේ දායකත්වය" යන තේමාව යටතේ ප්‍රදර්ශනයක් සංවිධානය කර තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව පෞද්ගලික සමාගම් දෙකකට රු. 7,630,000 ක මුදලක් ගෙවා තිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1978 අංක 04 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 13(2) (ආ) වගන්තිය සහ 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අනුමැතිය ලබාගැනීමෙන් තොරව, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පමණක්

ලබාගැනීමෙන් පසු එකතුව රු.512,809,119 ක් ක් වූ දීමනා 7ක් මණ්ඩලය විසින් එහි කාර්ය මන්ඩලය වෙත ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ප්‍රධාන කාර්යසාධන ගෙවීම් දීමනාව ගණනය කිරීම සඳහා අමාත්‍යවරයාගේ අධීක්ෂණය හෝ 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ඇ) 2017 දෙසැම්බර් 11 දිනැති අංක පී.ඊ.ඩී. 03/2017 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව, මණ්ඩලය විසින් ස්ථිර සේවකයන් සඳහා එක් සේවකයෙකුට රු.45,000 ක් හෝ එක් මසක වැටුප යන දෙකෙන් වැඩි වටිනාකමද, අනියම් හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් සේවකයින් සඳහා රු.45,000 ක් බැගින්ද රු.58,649,750 ක් වූ වාර්ෂික ප්‍රසාද දීමනාවක් 2017 වර්ෂය සඳහා ගෙවා තිබුණි.

(ඇ) පොළී අනුපාතයක් රහිත ණය වර්ග තුනක් සහ සියයට 4.2 ක පොළී අනුපාතයක් යටතේ ණය වර්ග හතක් මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් භුක්ති විඳිනු ලබයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සේවක ණය යෝජනා ක්‍රමය මානව සම්පත් ප්‍රතිපත්ති මාලාවෙහි ඇතුළත් වන අතර 2007 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ ක්‍රියාත්මක වේ. මණ්ඩලය විසින් මෙම ප්‍රතිපත්ති මාලාව සඳහා 2014 වර්ෂයේදී රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් ,ණය යෝජනා ක්‍රමය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ක්‍රියාත්මක වන අතර , 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය ශේෂය රු. 724,855,208 ක් විය.

(ii) මීට අමතරව, 1994 අගෝස්තු 09 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලයේ කාර්යය මණ්ඩලය් සඳහා නිවාස ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දී තිබුණි. ඒ අනුව, ඕනෑම නිවාස කටයුත්තක් සම්බන්ධයෙන් රාජ්‍ය හෝ පෞද්ගලික බැංකුවකින් හෝ ණය සපයන ආයතනයකින් ණය ලබාගත් සේවකයෙකුට සත්‍ය වාර්ෂික ණය පොළිය සහ සියයට 20.5 ක් දක්වා උපරිම සීමාවකට යටත්ව සියයට 4.2 ක පොළිය අතර වෙනස ප්‍රතිපූර්ණය කරනු ලැබේ. රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය රහිතව ඉහත ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.42,122,777ක මුදලක් ප්‍රතිපූර්ණය කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.827,183,067 ක බදු පූර්ව අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ අතිරික්තය රු.768,128,696 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.59,054,371 ක වර්ධනයක් දැක්වුණි. පසුගිය වර්ෂය හා සැසඳීමේදී අයභාරය සහ මූල්‍ය ආදායම පිළිවෙලින් රු.106,717,261 කින් සහ රු.114,654,560 කින් වැඩිවීමට ප්‍රතිරූපීව මුළු වියදම රු.162,317,450 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමේ ප්‍රගතිය පහත දැක්වේ.

(අ) ආයෝජන මණ්ඩලයේ ව්‍යාපෘති වල ප්‍රගතිය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ පහ සඳහා ආයෝජන මණ්ඩල පනතේ 17 වගන්තිය යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගතිය පහත දැක්වේ.

| වර්ෂය | ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව (නව ගිවිසුම් සහ දීර්ඝ කිරීම්) | අත්හිටුවන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | වසා දමන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් අවලංගු කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 2017 | 103 | 66 | 7 | 7 | 148 |
| 2016 | 185 | 73 | 7 | 10 | 78 |
| 2015 | 157 | 100 | 5 | 27 | 23 |
| 2014 | 160 | 101 | 0 | 15 | 56 |
| 2013 | 147 | 108 | 3 | 16 | 122 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය තුලදී ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව පසුගිය වර්ෂයට සාපේක්ෂව 44% කින් අඩු වී තිබුණි.

(ii) වර්ෂ 2013 සිට 2017 දක්වා කාල පරිච්ඡේදය තුළ වාණිජ කටයුතු ආරම්භ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාවෙහි කැපීපෙනෙන අඩුවීමක් නිරීක්ෂණය විය.

(ආ) **ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන**

-----------------------------------------------

2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල ආකර්ෂණය කරගත් විදේශීය සෘජු ආයෝජන (FDI) පහත දැක්වේ.

| **වර්ෂය** | **2014-2016 සහ 2017-2020 සංයුක්ත සැලැස්ම අනුව වාර්ෂික ඉලක්කය එ.ජ.ඩො. මිලියන** | **සත්‍ය ඉටුකර ගැනීම් එ.ජ.ඩො. මිලියන** | **සත්‍ය ඉටුකර ගැනීම් වාර්ෂික ඉලක්ක වල ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|
| 2017 | 1,000 | 1,710 | 171 |
| 2016 | 5,000 | 801.00 | 16 |
| 2015 | 3,500 | 969.66 | 28 |
| 2014 | 2,500 | 1616.26 | 65 |
| 2013 | 1,391 | 1,391.40 | 100 |

2017-2020 කාල පරිච්ඡේදය සඳහා මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා විදේශ සෘජු ආයෝජන (FDI) ඉලක්කය අසාමාන්‍ය ආකාරයෙන් ස්ථාපිත කර තිබුණු අතර පසුගිය වර්ෂයේ ඉලක්කයට සාපේක්ෂව එය 20% ක් පමණක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා සත්‍ය ඉටුකර ගැනීමෙහි කැපීපෙනෙන වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සහ වතුපිටිවෙල අපනයන සැකසුම් කලාපය තුල පිහිටි නළ ලිඳ මගින් සැපයෙන ජලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කලාපයේ පිහිටි ව්‍යාපාර වලට අවශ්‍ය ජලය මණ්ඩලය විසින් කුලියට ගත් බව්සර මගින් සපයා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ජලය ඝන මීටරයක පිරිවැය රු.395 ක් විය. කෙසේ වෙතත් , මණ්ඩලය විසින් ව්‍යාපාර වලට සපයන ජලය ඝන මීටරයක් සඳහා රු. 75ක් පමණක් අය කර තිබුණි. එබැවින් , රු. 5,280,320 ක අලාභයක් දැරීමට මණ්ඩලයට සිදු වී තිබුණි. එසේ වුවද, මණ්ඩලය විසින් අලාභය අවම කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදයක් 2018 ජූනි 30 දක්වාත් හඳුන්වා දී නොතිබුණි.

(ආ) සීතාවක, කොග්ගල සහ කටුනායක අපනයන සැකසුම් කලාපයන්හි පිහිටි වර්ග අඩි 53,667 ක විශාලත්වයකින් යුතු පරිශ්‍ර පනස් නවයක් රු. 17,207,076 ක වාර්ෂික කුලියක් යටතේ ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීමකින් තොරව භාහිර පාර්ශවයන් වෙත බදු දී තිබුණි.

(ඇ) ආයෝජන මණ්ඩල ගාස්තු හා අයකිරීම් සංශෝධනය කිරීමේ ප්‍රතිපත්තිය සැකසීමට හා විධිමත් කිරීමට සහ මණ්ඩලයට අයත් සියළුම ආදයම් නියමාකරයෙන් අය කරගන්නා බවට තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මණ්ඩලයට අය වියයුතු අදායම් අහිමි වීමේ අලාභය දැරීමට සිදු වී ඇත.මේ පිළිබඳ සිදුකරන ලද විගණන පරීක්ෂාව සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) ආයෝජන මණ්ඩල ගාස්තු හා අයකිරීම් මණ්ඩලයේ ගාස්තු කමිටුවක් මගින් නිර්දේශ කරනු ලබන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත කරනු ලැබේ.ඉන් පසු මෙම ගාස්තු ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ.කෙසේ වෙතත්, බොහෝ අවස්ථා වලදී, යෝජිත ගාස්තුව හෝ අයකිරීම තීරණය කිරීම, ගාස්තු කමිටුව විසින් පවත්නා ගාස්තුවට හෝ අය කිරීමට යම්කිසි මුදලක් එකතු කිරීමෙන් හෝ අදාල අපනයන සැකසුම් කලපයේ ප්‍රධාන නිලධාරියා විසින් යෝජනා කරන සංශෝධිත ගාස්තුව හෝ අයකිරීම ගාස්තු කමිටුව විසින් අනුමත කිරීමෙන් හෝ සිදු කරනු ලැබේ. කෙසේ වෙතත්, පවත්නා ගාස්තුවට හෝ අය කිරීමට එකතු කරන මුදල තීරණය කිරීමේ ක්‍රමය හෝ ගාස්තුව හෝ අයකිරීම සංශෝධනය කිරීමේ පදනම විගණයට අනාවරණය නොවීය.

(ii) සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි පරිපාලන ගොඩනැගිල්ලෙහි බිම්මහලේ කොටසක් 2003 වර්ෂයේ සිට ලංකා බැංකුවට කුලී පදනමින් ලබා දී තිබුණි. 2003 -2014 කාල පරිච්ඡේදය සඳහා වර්ග අඩියකට රු. 30 ක ගාස්තුවක් අයකර තිබුණු අතර 2016 ජනවාරි 01 දින සිට එය වර්ග අඩියකට රු.45 ක් වශයෙන් සංශෝධනය කරන ලදී. කෙසේ වෙතත්, කුලී මුදල තීරණය කිරීමේ පදනම විගණනයට ඉදිරිපත් නොවීය. එසේම, මේ සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ලංකා බැංකුව සමග ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණු බවද අනාවරණය විය.

(iii) රජයේ තක්සේරු කරුගේ වාර්තාවට අනුව සෑම වසර තුනකට වරක් බදු කුලිය සංශෝධනය කළ යුතු වුවත්, කටුනායක අපනයන සැකසුම් කලාපයට අයත් ඇවරිවත්ත බස් නැවතුමෙහි පිහිටි කඩකාමර 15ක සහ බේස්ලයින් පාරට මුහුණ ලා පිහිටි කඩ කාමර 04 ක බදු කුලිය 2009 වර්ෂයේ සිට වර්ෂ අටකට වැඩි කාලයක් තුළ සංශෝධනය කර නොතිබුණි.

(iv) මණ්ඩලය සහ මහනුවර කාර්මික උද්‍යානයෙහි පිහිටි පෞද්ගලික බැංකු ශාඛාවක් අතර වූ 2004 සැප්තැම්බර් 02 දිනැති ලිඛිත ගිවිසුම ප්‍රකාරව, වාර්ෂික බිම් කුළිය සෑම වසර තුනකටම වරක් සංශෝධනය කළ යුතුය. කෙසේවෙතත් , ගිවිසුම ප්‍රකාරව බිම් කුළිය සංශෝධනය වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) ලංකා බැර කර්මාන්ත සහ ඉදිකිරීම් සමාගම වශයෙන් හැඳින්වූ ලංකා වානේ සංස්ථාව අතුරුගිරියේ පිහිටි කර්මාන්ත ශාලාව නවීකරණය කිරීම සහ හා වැඩිදියුණු කිරීම සඳහා 1998 මැයි 07 දින මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. පසුව, 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ එවකට පැවති කර්මාන්තශාලාව නවීකරණය හා වැඩිදියුණු කිරීම සඳහා 2011 ජුනි 03 වන දින පරිපූරක ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) සමාගම විසින් එකඟ වී ඇති පරිදි අතිරේක නිෂ්පාදන පරාසයක් හඳුන්වා දී නොතිබුණි.

(ii) 2015 වන විට පවතින නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 250,000 ක් දක්වා ඉහළ නැංවීමට එකඟ වී තිබුණු නමුත් සමාගමෙහි නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 250,000 ක් දක්වා ඉහළ නංවා නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | නිෂ්පාදන ධාරිතාවය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| 2011 | 78,847 |
| 2012 | 138,197 |
| 2013 | 132,765 |
| 2014 | 181,417 |
| 2015 | 169,521 |

(iii) මණ්ඩලය විසින් සමාගම වෙත දස අවුරුදු බදු විරාමය, ආනයන බදු සහන හා රේගු තීරු බදු නිදහස් කිරීම් වැනි සහන ලබාදී තිබුණද, පරිපූරක ගිවිසුමේ නියමයන් හා කොන්දේසි ඉටුකිරීම සම්බන්ධයෙන් නිරන්තර අධීක්ෂණයක් සිදු කිරීමට මණ්ඩලය අසමත් වී තිබුණි.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.3.1 අපනයන සැකසුම් කලාප (EPZ), කාර්මික උද්‍යාන (IP) සහ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක කිරීම

අධික පරිපාලන පිරිවැය හේතුවෙන් පහත සඳහන් අපනයන සැකසුම් කලාප වර්ෂ කිහිපයක් මුළුල්ලේ අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

**වර්ෂය සඳහා බදු පෙර අතිරික්තය ( ඌණතාවය )**

| කලාපයේ නම | 2017 | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' | රු.000' |
| කොග්ගල අපනයන සැකසුම් කලාපය | (12,547) | (10,903) | (47,108) | (40,781) | (14,050) | (11,775) |
| වතුපිටිවල අපනයන සැකසුම් කලාපය | (16,911) | (9,062) | (3,323) | 777 | (2,969) | (7,767) |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මල්වත්ත අපනයන සැකසුම් කලාපය | (4,824) | 0.2 | (1,914) | (4,376) | (2,748) | (5,531) |
| මිරිජ්ජවිල කාර්මික උද්‍යානය | (16,044) | (4,828) | 1,256 | (8,384) | 6,334 | 0.5 |

## 4.4 හඳුනාගන්නා ලද පාඩු

----------------------

අපනයන සැකසුම් කලාපයක් (EPZ) වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා 2004 ජනවාරි 23 වන දින කැරගල පිහිටි ඉඩමක් මණ්ඩලය විසින් අත්පත් කරගෙන තිබුණු අතර කලාපයේ ස්ථාපිත කරන කර්මාන්තශාලා වල රැකියා ලබාදීමේ අරමුණින් ඉඩම අත්පත් කරගන්නා අවස්ථාවේදී ඉඩමේ කම්කරුවන් වශයෙන් සේවය කරමින් සිටි සේවය අවසන් කල ශ්‍රමිකයන් 08 දෙනෙකු වෙනුවෙන් අපනයන සැකසුම් කලාපයක් වශයෙන් ඉඩම වැඩිදියුණු කරන තෙක් සානුකම්පිත පදනමින් රු.3,000 සිට රු.6,000 දක්වා වූ මාසික දීමනාවක් ගෙවීමට මණ්ඩලය එකඟ වී තිබුණි. කෙසේ වෙතත්, අපනයන සැකසුම් කලාපය ස්ථාපිත කිරීම විවිධ හේතූන් මත ප්‍රමාද වී තිබුණු අතර, ශ්‍රමිකයන් වෙනුවෙන් ගෙවූ දීමනාව අත්හිටුවීමට මණ්ඩලය විසින් තීරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රමිකයන් 06 දෙනෙකු විසින් ඔවුන්ගේ හිඟහිටි දීමනාව ඉල්ලා මණ්ඩලයට එරෙහිව සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලය වෙත පැමිණිලි කර තිබුණි. අවසානයේදී, දෙපාර්ශවයම විසින් කාර්මික ආරවුල් පනත යටතේ ආරවුල සම්බන්ධයෙන් බේරුම් කරණ එකඟතාවයකට පැමිණි අතර 2017 ජූලි 12 වන දින වන්දියක් වශයෙන් රු. 1,800,000 ක් මුදලක් ගම්පහ කම්කරු කොමසාරිස් කාර්යාලයෙහි තැන්පත් කිරීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

## 4.5 වෙනත් ආයතන වලට මුදා හරින ලද සම්පත්

------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 හා 9.4 වගන්ති වලට පටහැනිව, මණ්ඩලයේ සේවකයන් තුන් දෙනෙකු සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2017 වර්ෂය සඳහා වැටුප් හා අතිකාල දීමනා ලෙස රු.4,629,590 ක මුදලක් වියදම් කර තිබුණි.

(ආ) එවකට ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයට අයත්ව තිබුණු අංක 64-5315 දරන වාහනය වසර 10 කට අධික කාලයක් මණ්ඩලය විසින් භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, මෙම වාහනය මණ්ඩලය වෙත පවරා ගැනීමට 2017 දෙසැම්බර් 31 දින දක්වාත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි. මෙම වාහනයේ නඩත්තු පිරිවැය වශයෙන් රු. 290,610 ක මුදලක් 2017 වර්ෂය තුළදී මණ්ඩලය විසින් වැය කර තිබුණි.

(ඇ) ලෝක වෙළඳ මධ්‍යස්ථාන පරිශ්‍රයේ මෝටර් වාහන ගාල් කිරීමේ අවසර පත්‍ර 12 ක් සමාලෝචිත වර්ෂය තුළදී මණ්ඩලය විසින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් රු. 720,000 ක් වැයකර තිබුණි. කෙසේ වුවද , 2017 දෙසැම්බර් 31 දින වන විටත් මෙම වියදම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(ඈ) රු. 3,823,250 ක් පිරිවැය වූ මණ්ඩලයේ ස්ථාවර වත්කම් විධිමත් අනුමැතියකින් තොරව සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි.

## 4.6 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ තථ්‍ය මානව සම්පත් අවශ්‍යතාවයන් සැලකිල්ලට ගැනීමකින් තොරව කොන්ත්‍රාත් පදනමින් සේවකයන් අනූ හයක් (96) ක් සහ හා අනියම් පදනමින් සේවකයන් එකසිය තුනක් (103) ක් බඳවා ගැනීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී කළමනාකරණ සහකාරවරුන් (තාක්ෂණික නොවන) හැට හතරක් (64) සහ ප්‍රාථමික මට්ටමේ සේවකයන් එකසිය විසි හයක් (126) තථ්‍ය සේවක සංඛ්‍යාවට වඩා අතිරික්තව පැවතුණි. එසේම මෙම බඳවා ගැනීම් සඳහා කළමණාකාර සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට කළමණාකරන මට්ටමේ තනතුරු නවය (09) ක් වැඩ බැලීමේ පදනම මත පුරවා තිබුණි. එසේම, 1997 ඔක්තෝබර් 24 දිනැති මුදල් හා සැළසුම් කිරීමේ අමාත්‍යාංශයේ අංක 124 දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, පුරප්පාඩු වූ තනතුරක වැඩ ආවරණය කිරීම මාස තුනක කාල පරිච්ඡේදයකට සීමා විය යුතු වුවත්, 2017 දෙසැම්බර් 31 දින වන විට නිළධාරීන් 08 දෙනෙකු මාස 06 සිට මාස 51 ක් දක්වා වූ කාල පරාසයක් වැඩ ආවරණය කිරීම සඳහා යොදවා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් අනාගත මානව සම්පත් අවශ්‍යතාවයන් සඳහා අනුක්‍රමික සැලැස්මක් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් පිළියෙල කර නොතිබුණි.

## 5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

වසර 2015 සැප්තැම්බර් මස පැවති එක්සත් ජාතීන්ගේ සමුළුවේදී සාමාජික රටවල් පලකල එකඟතාවය අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව තම කාර්යයන් ඉටු කළ යුතුය. ඒ අනුව, මණ්ඩලය විසින් එහි එදිනෙදා කාර්යයන් වලට අදාල අරමුණු වශයෙන් අරමුණු 08,09 හා17 හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, ඉලක්ක හා එම ඉලක්ක ළගා කර ගැනීමට අදාළ සංඩිස්ථානයන් සහ එම ඉලක්ක ඇගයීමට අදාල දර්ශක මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 6.1 ක්‍රියාකාරී සැලැස්ම

2017 වර්ෂය සඳහා සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ සංයුක්ත සැලැස්මට අනුකූලව සකස් කර නොතිබුණි.

(ii) සැළසුම්ගත ක්‍රියාකාරකම් වල ප්‍රගතිය මැන බැලීමට හැකි වන ආකාරයේ ප්‍රතිදාන සහ දර්ශක ස්ථාපිත කර නොතිබුණි.

(iii) 2017 වර්ෂය තුළ නිමකිරීමට සැළසුම් කරන ලද රු. මිලියන 219.65 ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් තිස් එකක් ක්‍රියාකාරී සැලැස්ම මගින් සැළසුම් කළ පරිදි සමාලෝචිත වර්ෂය තුළ නිම කර හෝ රු. මිලියන 155.3ක ප්‍රතිපාදන සහිත ක්‍රියාකාරකම් තිස් හයක් ආරම්භ කර හෝ නොතිබුණි.

### 6.2 පාරිසරික හා සමාජ වගකීම

මණ්ඩලයේ කාර්යයන් තුළින් පරිසරය මත ඇතිවන බලපෑම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මධ්‍යම පරිසර අධිකාරියේ ප්‍රමිතීන්ට අනුගත නොවීම හේතුවෙන් සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි ඇගලුම් කරමාන්ත ශාලාවක් සහ සීතාවක අපනයන සැකසුම් කලාපය පිලිවෙලින් 2013 අප්‍රේල් මාසයේ සහ 2010 දෙසැම්බර් 31 දින සිට පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා නොගෙන මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි.

(ii) 2018 ජුලි මස 06, 09 සහ 19 දින වලදී බියගම හා සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපයන්හි සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- කර්මාන්තශාලා අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා පරිසර හිතකාමී ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. එබැවින් , කර්මාන්තශාලා වල ඝන අපද්‍රව්‍ය පරිසරයට අහිතකර වන ආකාරයෙන් කලාපය තුල පිහිටි විවෘත ප්‍රදේශයකට බැහැර කරනු ලබයි.

- සීතාවක අපනයන ප්‍රවර්ධන කලාපයෙහි පිහිටි අපජල පවිත්‍රාගාරයේ පිරිසිදු කල ජලය පවිත්‍රාගාරය අසල පිහිටි පොකුණකට මුදා හරිනු ලැබේ. කෙසේ වෙතත්, වැසි කාලවලදී පවිත්‍රාගාරයේ අපජල රඳවනය ඉතිරියාමේ ප්‍රතිඵලයක් වශයෙන් අපජලය පොකුණෙහි ඇති පිරිසිදු කල ජලය සමග මිශ්‍රවී ගඟට මුදා හැරේ.

## 6.3 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

මණ්ඩලය විසින් 2017 වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබුණද, එය වගකිවයුතු නිලධාරියෙකු විසින් අනුමත කර නොතිබුණු අතර 2016 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) ප්‍රකාරව අවම වශයෙන් වසර තුනකට අදාල ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම මාස හය නොඉක්මවන කාල පරාසයන් තුළ අඛණ්ඩව යාවත්කාලීන කර නොතිබුණි.

(iii) සිදු කරන ලද නියැදි පරීක්ෂාවකට අනුව, 2017 වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 31 කින් ක්‍රියාකාරකම් 28ක් සඳහා ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර තිබුණු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් 03 ක් මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (ආ) සමග අනුකූල නොවීය.

(iv) වර්ෂය තුළ නිම කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් එකසිය අනූ හයක් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර නොතිබුණි.

(v) 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැළසුම් කරන ලද ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 272.63 ක් වූ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් විසි එකක් වසර තුළදී නිමකර නොතිබුණි.

## 6.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

----------------

බහලුම් පරීක්ෂාව සහ ආරක්ෂක හා රේගු කාර්ය මණ්ඩලයට පහසුකම් සැපයීමේ අරමුණින් සීතාවක අපනයන සැකසුම් කලාපයේ යෝජිත ප්‍රධාන පිවිසුම් ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාල මූලික සංකල්පය 2011 වසරේදී ඉදිරිපත් කරන ලදී. මෙම කාර්යය ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ඇතුළත් කර තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට සැළසුම් කර තිබුණි. එසේම එය 2017 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැළැස්මෙහිද ඇතුළත් විය. ප්‍රධාන දොරටුවෙහි සුදුසු ගොඩනැගිල්ලක් නොමැති වීමෙන් ආයෝජකයන්, සේවා සපයන්නන් සහ සේවකයන් අපහසුතාවයන්ට පත් වුවද , සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යෝජිත ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම ප්‍රමාදව පැවතුණි.

## 6.5 අයවැය පාලනය

------------------

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. 6 නොවිසඳුණු විගණන ඡේද

-----------------------------

(අ) සමාගමකට පවරා දෙන ලද බදු දේපල පිළිබඳ හිමිකම් හා අයිතීන් සහ එහි ගොඩනැගිලි හා එම පවරන ලද දේපළවල ස්ථීරව සවි කරන ලද සියලු පිරියත, යන්ත්‍රෝපකරණ සහ සවිකිරීම්, ත්‍රිපාර්ශවීය ගිවිසුම් අත්සන් කිරීම මගින් කිසියම් බැංකුවක හා/හෝ ණය ලබාදෙන ආයතනයක උකස් කිරීම සඳහා මණ්ඩලය විසින් ආයෝජන සමාගම් වලට අවසර ලබා දී තිබුණි. මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මූල්‍ය ආයතන වලින් ලබාගත් ණය පැහැර හැරීමෙන් ඇතැම් සමාගම් ඇවර කිරීම් මගින් අවසන් වී තිබුණි.

(ii) උකස් කරන ලද දේපළ වලට අදාලව නිරවුල් නොවූ ගැටළු හේතුවෙන් ඉඩම් වටිනාකම අහිමි වීම, නිෂ්කාර්ය වන ඉඩම් වල ආවස්ථික පිරිවැය සහ මණ්ඩලයට ලැබිය යුතු මුදල් ආදිය පිළිබඳ අලාභ දැරීමට මණ්ඩලයට සිදුවී තිබුණි.

(iii) හොරණ මාපුටුගල පර්ත් වතුයාය සී/ස විද්‍යෝදය ආයුර්වේද වෛද්‍ය විද්‍යාල පුද්ගලික සමාගම වෙත බදු දී තිබුණි. රු.මි. 5 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා එකී දේපල මහජන බැංකුව වෙත උකස් කර තිබුණි.තවද එකී ණය මුදල ලබාගැනීමේදී ත්‍රිපාර්ශවීය ගිවිසුමකට එළඹී නොතිබුණි. ණය මුදල ගෙවීමට අපොහොසත් වීම මත 2013 මැයි 12 දින දේපල බැංකුව විසින් දේපල අත්පත් කර ගෙන තිබුණු අතර එය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට තීරණය කර තිබුණි. බදු දේපල මිළදී ගැනීමට 2014 වර්ෂයේදී නව ආයෝජකයකු එකඟ වී තිබුණද, 2018 මැයි 31 දින වන තුරුත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා නව ආයෝජකයා අතර ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් පර්ත් වතු යාය මිලදී ගෙන තිබුණු අතර වතු යායෙන් කොටසක් 1999 වර්ෂයේ සිට වර්ෂ 5 ක කාලයක් සඳහා කළමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට ( SLSPC ) භාර දී තිබුණි. පසුව එය 2006 දෙසැම්බර් 08 දක්වා දීර්ඝ කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශන අනුව, පර්ත් වතු යායට අදාලව ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු මුදල රු.මිලියන 16.47 ක් විය. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2017 දෙසැම්බර් 31 දක්වාත් ශ්‍රී ලංකා වැවිලි සංස්ථාවෙන් ලැබිය යුතු නිවැරදි මුදල හඳුනාගෙන වාර්තා කර නොතිබුණි.

(ii) එකතුව රු. මිලියන 12.42 ක් වූ මෝටර් වාහන හා බංගලා කුලිය ජංගම ගිණුම් හරහා කොන්ත්‍රාත් කරුගේ ගිණුමට අවිධිමත්වමාරුකර තිබුණි.

(iii) මිනුම් වාර්තාවට අනුව, මණ්ඩලය විසින් මිලදී ගත් ඉඩමේ විශාලත්වය අක්කර 1563 ක් සහ පර්චස් 24.74 ක් වුවත්, මණ්ඩලයට අයත් ඉඩමේ විශාලත්වය අක්කර 1435 ක් රූඩ් 3 ක් සහ පර්චස් 25.03 ක් විය. ඒ අනුව, අක්කර 127 ක් සහ පර්චස් 39.71 ක වෙනසක් මණ්ඩලය විසින් හඳුනාගෙන

තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) පෞද්ගලික සමාගමක් ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ඇඟළුම් කම්හලක් ස්ථාපිත කිරීමට හා ක්‍රියාත්මක කිරීමට සහ ඇඟළුම් හා වෙනත් රෙදිපිළි අපනයනය කිරීමට මණ්ඩලය සමග 1992 අගෝස්තු 14 දින ගිවිසුමකට එළඹුණි. 1992 නොවැම්බර් 05 දින මණ්ඩලය විසින් ගිවිසුම අවසන් කර තිබුණු අතර එකඟ වූ වන්දිය යටතේ සියළු ගොඩනැගිලි සහ එහි පැවති යන්ත්‍රෝපකරණ මණ්ඩලයට පවරන ලෙස දන්වා තිබුණි. එකඟ වූ පරිදි වන්දිය ගෙවීමට මණ්ඩලය අපොහොසත් වූ බැවින්, එය ශ්‍රී ලංකා ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයට යොමු කර තිබුණු අතර සම්පූර්ණ හා අවසන් නිරවුල් කිරීම වශයෙන් රු.23,835,535 ක මුදලක් ගෙවීම සඳහා 2000 අගෝස්තු 07 දින තීන්දුව ලබා දී තිබුණි. එකී මුදල ගෙවීම මත, ව්‍යාපාරය විසින් මණ්ඩලයෙන් තවදුරටත් රු.37,200,000 ක ගෙවීමක් අපේක්ෂාවෙන් බේරුම්කරණ තීන්දුවක් බලාත්මක කිරීමට බේරුම්කරණ පනතේ 31 වන වගන්තිය යටතේ එච්සී/ඒආර්බී/1254/02 දරන ඉල්ලුම් පත්‍රයක් කොළඹ මහාධිකරණයේ ගොනුකර තිබුණි. 2012 මැයි 14 දින මහාධිකරණය විසින් දුන් තීන්දුව ප්‍රකාරව රු.102,138,350 ක අතිරේක මුදලක් ගෙවීමට මණ්ඩලය වගකීමට යටත් විය. මණ්ඩලය විසින් මහාධිකරණ තීරණයට අනුකූල නොවීම හේතුවෙන් වාණිජ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් රු.102,138,350 ක මුදලක් සඳහා 1431688 අංක දරන බැංකු ගිණුම භාරයට ගැනීමට 2014 දෙසැම්බර් 22 දින නියෝගයක් ලබා දී තිබුණි. කෙසේ වුවද, මණ්ඩලය විසින් 2015 ජනවාරි 01 දින රු.102,138,350 ක මුදලක් මහාධිකරණයේ බැංකු ගිණුමක තැන්පත් කර තිබුණි. මණ්ඩලය විසින් මෙම තීන්දුවට එරෙහිව නඩුවක් ගොණු කළ අතර එම නඩුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ඈ) මණ්ඩලය විසින් විවිධ විෂමාචාර හේතුවෙන් සේවකයකුගේ සේවය අවසන් කර තිබුණු අතර ඔහු විසින් අවසන් කිරීමේ තීරණයට එරෙහිව කොළඹ කම්කරු විනිශ්චය සභාවේ නඩුවක් ගොණු කරන ලදී. කම්කරු විනිශ්චය සභාවේ නියෝගය ප්‍රකාරව, වන්දියක් වශයෙන් රු.3,627,900 ක මුදලක් 2016 අගෝස්තු 22 වන දින කොළඹ කම්කරු විනිශ්චය සභාවේ තැන්පත් කිරීමට මණ්ඩලයට සිදු විය. ඉන්පසු, මණ්ඩලය විසින් කොළඹ කම්කරු විනිශ්චය සභාව දුන් තීන්දුවට එරෙහිව අභියාචනය කර තිබුණු අතර එම නඩුව 2017 දෙසැම්බර් 31 දින වන විටත් විභාග වෙමින් පැවතුණි.

(ඉ) 2012 මාර්තු 22 දිනැති 12/356/504/045 අංක දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අයි කාර්මීකරණ කලාපයක් ඉදිකිරීම සඳහා ත්‍රිකුණාමලය, සාම්පූර්හි පිහිටි අක්කර 818 ක විශාලත්වයකින් යුතු ඉඩමක් මණ්ඩලය වෙත ලබාදීමට අනුමැතිය ලැබී තිබුණි. ඉඩම

එවකට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් මණ්ඩලය වෙත නොමිලේ ලබා දී තිබුණි. ඉඩම අත්පත් කර ගැනීම හේතුවෙන් බලපෑමට ලක් වූ පවුල් නැවත පදිංචි කිරීම සඳහා නිවාස 1218 ක් ඉදිකිරීම වෙනුවෙන් මුතුර්හි ප්‍රාදේශීය ලේකම්වරයා වෙත රු.347,130,000 ක් වූ මුදලක් නිදහස් කිරීමට මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව, 2014 අගෝස්තු 01 දින කොටස් මුදලක් ලෙස රු.20,000,000 ක් මුතුර්හි ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවා තිබුණි. කෙසේ වෙතත්, මණ්ඩලය වෙත ව්‍යාපෘතිය සඳහා ලබා දුන් ඉඩම 2015 මැයි 07 දිනැති අංක 1913/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කල දැන්වීමක් මඟින් අවලංගු කර තිබුණි. . ගෙවන ලද මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අය කර ගැනීමට 2017 දෙසැම්බර් 31 දින වන විටත් මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඊ) රු.97,937,000 ක පිරිවැයකට 2004 ජනවාරි 23 දින මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද අක්කර 122 ක් රූඩ් 01 ක් සහ පර්චස් 27.4 ක විශාලත්වයකින් යුතු මලිදූවකන්ද වත්ත නැමැති ඉඩම 2018 ජූනි මාසය අවසානය දක්වාත් කිසිදු කාර්යයක් සඳහා උපයෝජනය කර නොතිබුණි. ස්ථාවර වත්කම් ලේඛනය අනුව, 2017 දෙසැම්බර් 31 දිනට මෙම ඉඩමේ පොත් අගය රු.100,800,000 ක් විය.

(උ) පිළිවෙලින් රු.1,163,958 ක් සහ රු. 917,160 ක් වූ සුනාමි සහන අරමුදල සහ පොදු රාජ්‍ය මණ්ඩල සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා ලද අරමුදල් අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් නොවෙනස්ව පැවතුණි.

(ඌ) වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පොදු අපජලය පිරිපහදු අංගනය වැඩි දියුණු කිරීමේ යෝජනාව 2009 වර්ෂයේදී ඉදිරිපත් විය. ඒ අනුව, අංගනයේ ධාරිතාවය දිනකට ඝන මීටර් 400 සිට ඝන මීටර් 650 දක්වා වැඩි කිරීමට තීරණය විය. ප්‍රමාණවත් නොවන ධාරිතාවය පිරිපහදු අංගනයේ මනා ක්‍රියාකාරීත්වයට සහ නඩත්තු කටයුතු වලට දැඩිව බලපෑම් කර ඇති බැවින් සහ අංගනයේ පිටවානෙහි පිරිපහදු කල අපජලයේ ගුණාත්මක ප්‍රමිතිය පවත්වාගැනීමට ඉහල ප්‍රමුඛත්වයක් දිය යුතු බැවින් අපජලය පිටවීමේ ප්‍රමාණය පවත්වාගැනීම සඳහා අංගනයේ ධාරිතාවය ඉහල නැංවීම දැඩිලෙස අත්‍යාවශ්‍ය වී ඇති බව අංගනයේ නඩත්තු කටයුතු සිදු කරන සමාගම විසින් 2016 මැයි 14 දින මණ්ඩලය වෙත දැනුම් දී තිබුණි. 2016 අගෝස්තු 03 දින තාක්ෂණික ඇගයීම් කමිටුව පත්කර තිබුණි. කෙසේ වෙතත් 2018 මැයි 31 දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඍ) මුළු පිරිවැය හා සැසඳීමේදී කාර්ය මණ්ඩල පිරිවැය වැඩි වී ඇති බැවින් ආයතනයේ කාර්ය සාධනය සඳහා සේවකයින්ගෙන් ලැබෙන දායකත්වය මත දිරිදීමනා ගෙවීමේ

ක්‍රමයක් සකස් කිරීම සඳහා පියවර ගන්නා ලෙස 2017 මැයි 05 දින පැවැත් වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම මගින් නියෝග කරන ලදී. කෙසේ වෙතත් , මණ්ඩලය විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝගයට අනුගත වී නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | නිරීක්ෂණ |
|---|---|
| පුද්ගල පඩිනඩි පිළිබඳ පාලනය | වෘත්තීය දීමනා, මාසික ප්‍රවහන දීමනා සහ ප්‍රධාන කාර්යසාධන ගෙවීම් වැනි කාර්යමණ්ඩල දීමනා සඳහා මණ්ඩලය විසින් විධිමත් අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| ව්‍යාපාරවලින් ලැබිය යුතු මුදල් රැස්කර ගැනීම | මණ්ඩලය විසින් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කර තිබුණද, ආයෝජන මණ්ඩලයේ අනුමත ව්‍යාපාර වලින් ලැබිය යුතු හිඟ ශේෂයන් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. |
| ප්‍රසම්පාදන සළසුම් කිරීම | ප්‍රසම්පාදන සැළැස්ම ඵලදායි කළමණාකරන පාලන කාරකයක් ලෙසෙ යොදාගෙන නොතිබුණි. |
| ගිණුම්කරණය | තම දේපල නිවැරදිව වර්ගීකරණය කිරීමේ ක්‍රමවේදයක් මණ්ඩලය සතුව නොතිබුණි. |

අ/ක. එච්. එම්. ගාමිණි විජේසිංහ
විගණකාධිපති

එච්.එම්. ගාමිණි විජේසිංහ

විගණකාධිපති

# විගණන වාර්තාව 2017

## විගණන කමිටු වාර්තාව

1999.11.19 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ, PF/PE3 හි විධිවිධාන වලට අනුකූලව විගණන කමිටුව පිහිටුවා ඇත.

2017 වසර තුලදී පවත්වනු ලැබූ විගණන කමිටු රැස්වීම් දෙක පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත විය.

1. සභාපති - බුද්ධි අතාවුද මයා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
2. සාමාජික - එම්.සී. කුරේ මයා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
3. සාමාජික - එම්.ඒ. නීත් උදේශ මයා (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)

වසරේ දෙවන භාගයේදී කළමනාකරණයේ සිදු වූ වෙනස්කම් නිසා, ඉතිරි විගණන කමිටු රැස්වීම් පහත දැක්වෙන නිලධාරීන්ගෙන් සමන්විත වේ.

1. සභාපති - මංගල යාපා මයා. (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
2. සාමාජික - සාගර ගුණවර්ධන මයා. (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
3. සාමාජික - හේමන්ත වික්‍රමසිංහ මයා. (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
4. සාමාජික - අජිත් ගුණවර්ධන මයා. (ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික)
5. නිරීක්ෂක - සී.ජයසූරිය මයා. (භාණ්ඩාගාර නියෝජිත)
6. උපදේශක - ලසන්ත වික්‍රමසිංහ මයා (විගණන කමිටුව සඳහා ස්වේච්ඡා උපදේශක)

වැඩබලන අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) විගණන කමිටුවේ ලේකම්/කැඳවුම්කරු ලෙස කටයුතු කරනු ලැබේ.

රජයේ විගණක අධිකාරි, විගණන කමිටුවේදී නිරීක්ෂකයෙකු ලෙස විගණකාධිපතිවරයා නියෝජනය කරනු ලැබීය.

විගණන කමිටු රැස්වීම් මගින් අභ්‍යන්තර විගණක විගණකාධිපතිගේ නියෝජිතයින් හා ආයෝජන මණ්ඩල කළමනාකරණය අභ්‍යන්තර පාලනය පරීක්ෂා කිරීම් හා ඇගයීම් වල ප්‍රතිඵල පිළිබඳ සංවාද සඳහා පහසුකම් සලසනු ලැබේ.

අභ්‍යන්තර විගණක සමග අඛණ්ඩ සම්බන්ධීකරණය හා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමාලෝචනය හා අනුමත කිරීම හරහා අභ්‍යන්තර විගණනයේ විෂය පථය හා වගකීම් වලට අනුකූලවීම විගණන කමිටුව මඟින් තහවුරු කෙරේ.

අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය විසින් ආයතනයේ ස්වාධීනත්වයට හානි කරන මෙහෙයුම් කටයුතු වල යෙදීම තහනම් කිරීමට ගනු ලැබූ ප්‍රතිපත්තිමය තීරණය මඟින් විගණන කමිටුව අභ්‍යන්තර විගණනයේ ආරක්ෂාව හා ස්වාධීනත්වය තහවුරු කරනු ලැබේ.

විගණන කමිටුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාවලිය හා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අවදානම සමාලෝචනය කිරීමට හා ඒ හා බැඳුණු අවදානම අඩු කිරීමට වැලකුම් ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම පිළිබඳව යොමු වේ.

කමිටුව සඳහා වන නියමයන් හා නිර්දේශ සියළු වැදගත් ලක්ෂණ වලට අනුකූලව ක්‍රියාත්මක වන බව විගණන කමිටුවේ අදහසයි.

# 2017.12.31 දිනට ආයෝජන මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්

| නම | තනතුර | ස්ථානය |
|---|---|---|
| ඩී.ආර්. රත්නායක මහතා | සභාපති | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඩී.පී. ආරියසිංහ මහතා | අධ්‍යක්ෂ ජනරාල් | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |

| විධායක අධ්‍යක්ෂවරු | දෙපාර්තමේන්තුව | ස්ථානය |
|---|---|---|
| **නම** | | |
| පී.ජේ පනාපිටිය මහතා | ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ආර්.එම්. වීරකෝන් මිය | ව්‍යාපෘති අධීක්ෂණ | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| සී.පී. මලල්ගොඩ මිය | පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එස්.පී. ද එස් මුතුකුමාරණ මෙය | මූල්‍ය | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එස්.පි.කේ. විජයතිලක මහතා | ආයෝජන ප්‍රවර්ධන | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| කේ.පී.වී.ඩී. ප්‍රනාන්දු මහතා | ආයෝජන ප්‍රවර්ධන | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඒ. ආර්. කරුණාරත්න මහතා | ආරක්ෂක | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ආර්.එම්.යූ. සෙනරත් මහතා | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එම්. රාමනායක මහතා | ආයෝජක සේවා | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එම්.එස්.ආර්. පීරිස් මිය (උපදේශක) | නීති | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |

| වැඩ බලන විධායක අධ්‍යක්ෂවරු | දෙපාර්තමේන්තු | ස්ථානය |
|---|---|---|
| **නම** | | |
| එම්.කේ.ඩී. ලෝරන්ස් මහතා | කලාප කළමනාකරණ | කටුනායක අ.සැ.ක |
| ඒ.කේ.ඒ. මහින්ද මහතා | තාක්ෂණ සේවා | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |

| අධ්‍යක්ෂවරු | දෙපාර්තමේන්තුව | ස්ථානය |
|---|---|---|
| **නම** | | |
| ඩී.එස්. සමරසිංහ මහතා | මාධ්‍ය හා ප්‍රචාරක | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එච්.එම්. ජයසුන්දර මහතා | කලාප කළමනාකරණ | වයඹ ප්‍රාදේශීය කාර්යාලය |
| එන්. ද සිල්වා මෙය | ආයෝජන ප්‍රවර්ධන | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ජේ.පී.සී. ජයලත් මහතා | තොරතුරු තාක්ෂණ | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඒ.කේ. ජයසිංහ මහතා | කලාප කළමනාකරණ | බියගම අ.සැ.ක |
| එන්.එන්. කුමාරතුංග මහතා | ආයෝජන ඇගයීම් | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඩබ්ලිව්.යූ.කේ.එම්.ඒ. විජයකුලතිලක මහතා | ආයෝජන ඇගයීම් | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එච්.එස්. උරුගොඩවත්ත මෙය | කාර්මික සබඳතා | කටුනායක අ.සැ.ක |
| ජී. දහනායක මහතා | කලාප කළමනාකරණ | කොග්ගල අ.සැ.ක |
| එම්.ජේ.කේ. මොහොට්ටාල මහතා | කලාපීය සංවර්ධන | මහනුවර කාර්මික උද්‍යානය |
| ඒ.එස්. බෙලින් මෙය | පරිසර කළමනාකරණ | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ටී.එම්.ඩී. තිලකරත්න මහතා | කලාප කළමනාකරණ | වතුපිටිවල අ.සැ.ක |
| ඩබ්.ඒ.ජී. ජයතිලක මහතා | ආයෝජන ඇගයීම | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඒ.එස්.කේ.ටීආර්. සිබේරා මහතා | ආයෝජන ඇගයීම | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| පී.එස්.පී. පිලපිටිය මිය | ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එස්.ඒ.ඩී.ඩී. සූරවීර මෙය | මූල්‍ය | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඒ.කේ. රාජකරුණා මහතා | ආයෝජක සේවා | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| පී.එන්. සමරවීර මිය | පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශන | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| බ්‍රිගේඩියර් ඩි.ඒ. අමුණුගම | ආරක්ෂක | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |

| වැඩ බලන අධ්‍යක්ෂවරු | දෙපාර්තමේන්තුව | ස්ථානය |
|---|---|---|
| **නම** | | |
| එච්.එම්. කීර්තිරත්න මහතා | මානව සම්පත් කළමනාකරණ | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| ඩී.ඒ.එස්. අමරකෝන් මිය | අභ්‍යන්තර විගනණ | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |
| එන්.එන්. අන්ද්‍රාහෙන්නදි මිය | කාර්මික සබඳතා | ලෝක වෙළඳ මධ්‍යස්ථානය |

# ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යාල නාමාවලිය

**ප්‍රධාන කාර්යාලය (ලෝක වෙළඳ මධ්‍යස්ථාන කාර්යාලය)**
05, 06, 08, 09, 19, 24, 25, 26 හා 27 මහල
බටහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
එච්ලොන් චතුරශ්‍රය, කොළඹ 01
දු.ක : 011-2434403-5, 2435027, 2447531 2385972-6, 2346131-3
ෆැක්ස් : 011-2447995, 2329795, 2430512, 2422407
විද්‍යුත් තැපැල : info@boi.lk

**කටුනායක අපනයන සැකසුම් කලාපය**
කටුනායක
දු.ක : 011 2252364-5, 2252140, 2252038, 4833737, 4833741, 4833774, 4833779, 4833817, 4833819
ෆැක්ස් : 011 2253207
විද්‍යුත් තැපැල : kepz@boi.lk

**බියගම අපනයන සැකසුම් කලාපය**
වල්ගම, මල්වාන
දු.ක : 011 2465206 - 09
ෆැක්ස් : 011 2465227
විද්‍යුත් තැපැල : bpz@boi.lk

**හොරණ අපනයන සැකසුම් කලාපය**
බොරළුගොඩ, පෝරුවදණ්ඩ.
දු.ක : 034 2269296, 2269752, 2258077
ෆැක්ස් : 034 2255687, 2258029
විද්‍යුත් තැපැල : hepz@boi.lk

**මීරිගම අපනයන සැකසුම් කලාපය**
මහයායවත්ත, ලෝලුවාගොඩ,
මීරිගම
දු.ක : 033 2274657, 2276626, 2276393
ෆැක්ස් : 033 2274657, 2276393
විද්‍යුත් තැපැල : mepz@boi.lk

**වතුපිටිවල අපනයන සැකසුම් කලාපය**
වතුපිටිවල.
දු.ක : 033-2281604, 033-2281381
ෆැක්ස් : 033-2282364
විද්‍යුත් තැපැල : wepz@boi.lk

**මල්වත්ත අපනයන සැකසුම් කලාපය**
තිහාරිය, නිට්ටඹුව
දු.ක : 033 2288826, 2296166, 2296620
ෆැක්ස් : 033 2288826
විද්‍යුත් තැපැල : mepp@boi.lk

**සීතාවක අපනයන සැකසුම් කලාපය**
අවිස්සාවේල්ල
දු.ක : 036 2231082
ෆැක්ස් : 036 2231083
විද්‍යුත් තැපැල : sip@boi.lk

**කොග්ගල අපනයන සැකසුම් කලාපය**
කොග්ගල, හබරාදූව.
දු.ක : 091-2283425
ෆැක්ස් : 091-2283370
විද්‍යුත් තැපැල : kgepz@boi.lk

**මහනුවර කාර්මික උද්‍යානය**
කැගල්ල, මහනුවර.
දු.ක : 081 2420019, 2420025, 2423992, 2423994
ෆැක්ස් : 081 2420091, 2423995
විද්‍යුත් තැපැල : kip@boi.lk

**වයඹ කලාප කාර්යාලය**
MAS ෆැබ්රික් පාක්, කුරුණෑගල පාර, තුල්හිරිය.
දු.ක : 037-2277037, 037-2277038
ෆැක්ස් : 037-2277036
විද්‍යුත් තැපැල : nwro@boi.lk

**පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපය**
කෑගල්ල පාර, පොල්ගහවෙල
දු.ක : 037 2244657 / 41526
ෆැක්ස් : 037 2244657
විද්‍යුත් තැපැල : pwepz@boi.lk

**මාවතගම අපනයන සැකසුම් කලාපය**
ඩිනෙවෝර වතුයාය, නුවරපාර, මාවතගම.
දු.ක : 037 2298147
ෆැක්ස් : 037 2296041
විද්‍යුත් තැපැල : mwepz@boi.lk

**මධ්‍යම සත්‍යාපන පර්යන්තය**
සිලෝන් ෂිපින් ලයින්ස් යාර්ඩ්
නො. 70, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත
දු.ක : 011-2547485, 4411591, 4978969
ෆැක්ස් : 011-2547485, 4411592, 026-2233002

**ගුවන් භාණ්ඩ සත්‍යාපන ඒකකය**
බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ, කටුනායක
දු.ක : 011-2252155, 4833834, 2265183
ෆැක්ස් : 011-2252155

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල විශේෂ කලාපය**
ප්‍රීමා කර්මාන්තශාල පාර, චීන බොක්ක, ත්‍රිකුණාමලය
දු.ක : 026-2233003
ෆැක්ස් : 026-2233002

**මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය**
අඩි 100 පාර, මිරිජ්ජවිල, හම්බන්තොට.
දු.ක : 047 2258800
ෆැක්ස් : 047 2258800

**යාපනය කලාප කාර්යාලය**
එන්.එච්.ඩී.ඒ ගොඩනැගිල්ල, චුන්ඩිකුලි, යාපනය
දු.ක : 021-2221336, 021-2222130